

# නීතිය සහ විනය

පාලකයන් පාලනය කිරීම හා රාජ්‍යතන්ත්‍රය
කාර්යක්ෂම පදනමක පිහිටුවීම සම්බන්ධ කතිකාවක්

බැසිල් ප්‍රනාන්දු

නීතිය සහ විනය - බැසිල් ප්‍රනාන්දු

# නීතිය සහ විනය

## පාලකයන් පාලනය කිරීම හා රාජ්‍යතන්ත්‍රය කාර්යක්ෂම පදනමක පිහිටුවීම

# නීතිය සහ විනය

## පාලකයන් පාලනය කිරීම හා රාජ්‍යතන්ත්‍රය කාර්යක්ෂම පදනමක පිහිටුවීම සම්බන්ධ කතිකාවක්


ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක

ජ්‍යෙෂ්ඨ නීතිඥ බැසිල් ප්‍රනාන්දු



විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

නීතිය සහ විනය - පාලකයන් පාලනය කිරීම හා රාජ්‍යතන්ත්‍රය කාර්යක්ෂම පදනමක පිහිටුවීම සම්බන්ධ කතිකාවක්

© බැසිල් ප්‍රනාන්දු


| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | - | 2019 අගෝස්තු |
| ISBN | - | 978 - 955 - 691 - 321 - 7 |
| පිටකවරය | - | පුෂ්පානන්ද ඒකනායක |
| පරිගණක පිටු සැලසුම | - | පුෂ්පානන්ද ඒකනායක<br>'ද ෆොන්ට් මාස්ටර්'<br>45/96, නාවල පාර, කොළඹ 05.<br>(පොනිති 12 අභය ෆොනුරුවෙනි.) |
| මුද්‍රණය | : | විජේසූරිය එන්ටර්ප්‍රයිසස් |
| ප්‍රකාශනය | : | **විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය**<br>812, මරදාන පාර,<br>පුංචි බොරැල්ල,<br>දුරකථනය : 2696675 |

# පටුන

1. මහාචාර්ය සරත් විජේසූරිය මහතාට ලිපියක් 7

2. ආරක්ෂාව යනු කුමක්ද ? 11

3. අප්‍රේල් 21 වෙනි පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන
වගකිව යුත්තේ කවුද? 16

4. රාජකාරී සම්බන්ධයෙන් සටහන් තබා ගැනීම හා
මහජන ආරක්ෂාව 26

5. අපරාධය සහ ආරක්ෂාව පිළිබඳ සංකල්පය 31

6. පාලකයන් පිළිබඳ ව ඇති විශ්වාසය තුළින්
රාජ්‍යතන්ත්‍රයක් ගොඩනැගිය හැකිද? 40

7. ජනතා ආණ්ඩුවක් යනු අර්ථ විරහිත වචන මාලාවකි 45

8. රටතුළ අනාරක්ෂාව හා අස්ථාවරත්වය ඇතිකළ
දේශපාලනමය මූලෝපාය 51

9. ලංකාවේ සංවිධාන රටාවේ අත්තිවාරම
දෙදරවූ චරිත දෙකක් 58

10. මහේස්ත්‍රාත්වරුන්ගේ රාජකාරියේ ඇති
සාමාජීය වැදගත්කම 64

11. රට ලෝකයට ණය වෙලා....
රට්ටු එකිනෙකාට ණය වෙලා.... 73

12. නඩු පමාව මහා පාපයකි - රටටම ශාපයකි 77

13. කාර්යක්ෂම ආරක්ෂණ යාන්ත්‍රණයක් ගොඩනගා
ගැනීම් සඳහා මූලෝපායාත්මක යෝජනා 84

# 1.
# මහාචාර්ය සරත් විජේසූරිය මහතාට ලිපියක්

මහාචාර්ය සරත් විජේසූරිය,
කොළඹ.
මහාචාර්යතුමනි,

මා මේ ලිපිය ලිවීමට පෙලඹුණේ ඔබ විසින් සෝභිත හිමියන්ගේ සැමරුම් උළෙලේ කළ දේශනයට අන්තර්ජාලය තුළින් සවන් දීමෙන් පසු ව ය.

ඒ දේශනයේ දී පෙනී යන්නේ ඔබ 2015 ජනවාරියේ ඇති වූ දේශපාලන තත්ත්වය හා ජනාධිපතිගේ හා අගමැතිගේ ක්‍රියාකලාපය පිළිබඳ ව කලකිරීමෙන් පසු වන බව ය. ඒ කලකිරීම සියලු ආකාරයෙන් ම සාධාරණ ය.

එහෙත් මෙවැනි අවස්ථාවක මෙය සමස්ත දේශපාලන සන්දර්භය දෙස බලා කල්පනා කළ යුතු ය යන්න මගේ හැඟීම ය.

2015 ජනවාරියේ පැවැති ඡන්දය පැවැත්වූයේ එතෙක් වර්ධනය වූ මහින්ද රාජපක්ෂක්ෂගේ හා ගෝඨාභය රාජපක්ෂක්ෂගේ දේශපාලන අභිමතාර්ථ අවසන් කර දැමීමට ය. එසේ කිරීමට නොහැකි වූවා නම් රට තුළ සිදු වීමට තිබූ දේශපාලන ක්‍රියාදාමය අතිශයින් විනාශකාරී හා කෲර එකක් බව ඉතාමත් පැහැදිලි ය. එමෙන් ම බොහෝ කාලයක සිට ඒකාධිපති පාලනයක් රට තුළ නිර්මාණය වෙමින් තිබුණි.

මේ තත්ත්වය ඇති වීම වළක්වා ගැනීම ඓතිහාසික ජයග්‍රහණයකි. ඒ නිසා ඒ ක්‍රියා කලාපය, ඔබ හා ඔබ වැන්නන් කළ කාර්යභාරය පිළිබඳ ව කලකිරීමට හෝ තමන්ට ම ශාප කරගැනීමට අවශ්‍යතාවක් නැත.

ජනතාව එක ජයග්‍රහණයක් සිදු කරගත් අවස්ථාවල ඔවුන්ගේ සියලු ම බලාපොරොත්තු ඒ තුළින් සිදු වෙතැයි සිතීම සමාන්‍යයෙන් සිදු වෙන දෙයකි. ඔවුන්ගේ සියලු ම බලාපොරොත්තු ඉටු නොවන විට කලකිරීමත්, ඒ ජයග්‍රහණයට මග පෙන්වූවන්ට දොස් කීමත් සාමාන්‍යයෙන් ඓතිහාසික ව නැවත නැවතත් සිදු වී ඇති දෙයකි.

ලෝක ප්‍රජාතන්ත්‍රවාදයේ විශාලතම සිදුවීමක් වන ප්‍රංශ විප්ලවය තුළින් ද මේ ක්‍රියාදාමය පැහැදිලි ව දැකිය හැකි ය. ඒ විප්ලවය තුළින් ප්‍රංශ ජනතාව පමණක් නොව යුරෝපයේ ජනතාව හා මුළුමහත් ලෝක ජනතාවත් අතර විශාල උද්දාමයක් ඇති විය. එහෙත් ඒ විප්ලවයෙන් සුළු කලක් ඇතුළත විප්ලවයේ නායකයන් පිළිබඳ ව අතිමහත් කලකිරීමක් ඇති වුණා පමණක් නොව විප්ලවයේ දී තමන්ගේ දරුවන් මරා දැමීම දක්වා පැතිර ගියේ ය. මෙය ඉතිහාස පොත්වල ද ලියා ඇත.

මෙහි අවසානය වූයේ විප්ලවයෙන් ඇති වූ බලාපොරොත්තු ගැන කලකිරුණු සමස්ත ප්‍රංශ ජාතිකයන්, නැපෝලියන් බොනපාර්ට් විසින් යුදමය ක්‍රියාමාර්ග කෙරෙහි යොමු කරමින් ලෝකයේ ඇති වූ බරපතළ ම වර්ගයේ ඒකාධිපතිවාදයක් ඇති කර ගැනීම ය. මෙවැනි දහසකුත් සිදුවීම් ඉතිහාසය පුරා ම සිදුවී ඇත.

මා කීමට අදහසක් කරන්නේ 2015 ජනවාරි මැතිවරණ ජයග්‍රහණය ප්‍රංශ විප්ලවය තරමට සමාන එකක් යැයි කීමට නොවේ. මා අදහස් කරන්නේ ජයග්‍රහණ හා පරාජ එකිනෙකට බද්ධ ව පවතින බවත්, එසේ සිදු වීම ඉතිහාසයේ අවසානය නොවන බවත් ය.

අනිත් අතින් ගත් කල ජනවාරි ජයග්‍රහණයට යොමු වූ දේශපාලන දර්ශනය තුළ විශාල අඩුපාඩුකම් පැවැතියේ ය. යහපාලනය නමැති සටන් පාඨය තුළින් ඒ අඩුපාඩු යටපත් කළ නොහැකි ය.

විශේෂයෙන් ම 1978 ව්‍යවස්ථාව මගින් ලංකාවේ දේශපාලන ව්‍යූහය ප්‍රජාත්‍රන්ත්‍රවාදී රාමුවෙන් එළියට ගෙන එය හිතුවක්කාර පාලනයක් බවට පත් කළේ ය.

ඉන් පසු ගත වූ දශක ගණනක ම ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය අමතක වී යන වාතාවරණයක් නිර්මාණය විය. හිතුවක්කාර

පාලනය 'ස්වාභාවික පාලනයක් ය' යන්න හිතෙන තරමට ම මේ ක්‍රියාදාමය පත් විය.

මෙහි ප්‍රතිඵලය වූයේ රටේ නීතිය ක්‍රියාත්මක වන රාමුව මුළුමනින් ම කඩාවැටීම ය. ඒ කඩාවැටීම ඉතා දක්ෂ ආකාරයකින් තමන්ගේ වාසිය කරා යොමු කරවා ගැනීමට මහින්ද රාජපක්ෂ හා ගෝඨාභය රාජපක්ෂ වැනි අය සමත් වූහ. තමන්ගේ පුද්ගලික ලාභය සඳහා ආණ්ඩුවේ දේපළ හා සංස්ථා දේපළ පූර්ණ ලෙස පාවිච්චි කළේ මේ සඳහා ය.

2015 ජනවාරි ජයග්‍රහණය සඳහා වූ දේශපාලන විපර්යාසය දූෂණය පිළිබඳ ප්‍රශ්නය ඉහළින් මතු කළත්, ඒ දූෂණයට පදනම සැදූ දේශපාලන හා නෛතික පදනම පිළිබඳ ව වැඩි උනන්දුවක් නොපෙන්වූ බව මේ කාලය තුළ කළ ප්‍රකාශවලින් පෙනේ. විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධ වීමට පොරොන්දු වූ බව සත්‍යයකි. එහෙත් එය හුදු සටන් පාඨයක් වූවා මිස සමස්ත වශයෙන් 1978 ව්‍යවස්ථාව නිසා ඇති වූ සමාජ පදනම බිඳී යෑම පිළිබඳ ව මහජන අවබෝධයක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරී යයි කීමට නොහැකි ය.

2015 ජයග්‍රහණයෙන් පසු මාස ගණනක් තුළ ධර්මසිරි බණ්ඩාරනායක මහතාගේ ව්‍යාපාරයේ රූස්වීම් ශාලාව තුළ දී පැවැති දේශනාවක දී ඔබ තුමා නගන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් මම ඉහත් සඳහන් අදහස පැහැදිලි කළෙමි.

කකුල් දෙක ම නැති වූ අබ්බගාතයෙකුට නැගිට ඇවිද යන්න යයි කියා ජන වරමක් දුන් පළියට එසේ කිරීමට හැකියාවක් නැත. ඔහුට අවම වශයෙන් කෘත්‍රිම කකුල් දෙකක්වත් සදා දිය යුතු ය. 2015 ජන වරමින් බලයට පත් නායකයෝ ද දේශපාලන වශයෙන් හා නෛතික වශයෙන් අබ්බගාතයෝ වූහ. ඔවුන් පොරොන්දු වූ දේ ගෙන දීමට හැකි තත්ත්වයක පසු වුණේ ද නැත. කෘත්‍රිම කකුල් දෙකක්වත් සොයා ගැනීමට තරම් වත් දේශපාලන අධිෂ්ඨානයක් ඔවුන්ට නොතිබුණි. දැන් පවතින තත්ත්වය මේ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයකි.

මගේ කියවීමට අනුව 2015 ජයග්‍රහණයට නායකත්වය දුන් සිවිල් සංවිධාන තුළ ද ඒ අවස්ථාවේ දී යටපත් කරගත් මතවාද පැවැතිණි. වඩා ගැඹුරින් ප්‍රශ්න විශ්ලේෂණය කිරීමට ගියහොත් රාජපක්ෂ පරාජය කිරීමේ මූලෝපායට යම් හානියක් වේ යයි යන බියක් සමහරුන් අතර පැවැතිණි.

මේ අතර ජනවාර්ගික ප්‍රශ්නයට ඉක්මනින් විසඳුමක් සොයාගත හැකි ය යන මිථ්‍යාවක් ද පැවැතිණි. සමස්ත

රාජ්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම බිඳී ගිය තත්ත්වයක් තුළ, ජනවාර්ගික ප්‍රශ්නයට පමණක් ප්‍රජාතන්ත්‍රවාදී විසඳුමක් සොයා ගන්නේ මොන ආකාරයකින්ද යන්න ගැන සැලකිල්ලක් දැක්වූ බව ද පෙනෙන්නට නැත.

කෙටියෙන් කිවහොත්, 2015 වන විට රට මුහුණ දී තිබූ මහා කඩාවැටීම සම්බන්ධයෙන් ඉතා අඩු තක්සේරු කිරීමක් පැවැතිණ. පසු කාලීන ව සිදු වූ ක්‍රියාකලාපය එසේ වීමට හේතු වූයේ ය යන්න මගේ මතයයි.

අද ලංකාවේ රාජ්‍යතන්ත්‍රය අකාර්යක්ෂම ය. නොසැලකිලිමත් හා ප්‍රඥගෝචර නොවන ව්‍යූහයක් ලෙස පවතී. 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා සිදු වූ සිදුවීම් තුළින් මෙය සක්සුදක් සේ පැහැදිලි වෙයි.

මීළඟට එන මැතිවරණයෙන් බලයට එන කවුරු වුවත් රාජ්‍යතන්ත්‍රයේ කඩාවැටීම තමන්ගේ පුද්ගලික වාසියට යොදා ගන්නවා මිස සාධනීය යමක් කරාවි යයි කියා සිතීමට පදනමක් නැත. රට මුහුණ දෙන ගැඹුරු අර්බුදය වටහාගත් නායකත්වයක් තවමත් මතුවී නැත.

සිවිල් සමාජයේ සංවිධානවල නායකයන්ගේ ප්‍රධාන යුතුකම වන්නේ රට තුළ ඇතිවී තිබෙන විෂම තත්ත්වය වටහා ගැනීමට උත්සාහ කිරීමත්, ඒ අවබෝධය ජනගත කිරීමත් ය. දේශපාලන විකල්පයක් ගැන සාධනීය ව කල්පනා කළ හැක්කේ මෙවැනි අවබෝධයක් ජනතාවගෙන් වැඩි කොටසකට හෝ පසක් වූ පසු ව ය. සිටි ගෙම්බන් වෙනුවෙන් අලුත් ගෙම්බන් සෙවීමට ගන්නා ප්‍රයත්නය සාධනීය ප්‍රතිඵලයක් ඇති කළ හැකි යයි සිතිය නොහැකි ය.

මේ සමස්ත පසුබිම කෙරේ ඔබේ අවධානය යොමු කිරීමට සුදුසු යයි සිතූ නිසා, මොන අඩුපාඩු තිබුණත් 2015 රාජපක්ෂ පරාජය කිරීමේ ලත් ජයග්‍රහණය සැබෑ ජයග්‍රහණයක් වූ බව මතක් කිරීමට ද ඔබව දිරිමත් කිරීමට ද මම මේ ලිපිය ලිවීමට සිතුවෙමි.

මීට
විශ්වාසී

බැසිල් ප්‍රනාන්දු

# 2.
# ආරක්ෂාව යනු කුමක්ද ?

2019 අප්‍රේල් 21 වන දින සිදු වුණු බෝම්බ පිපිරීම් නිසා සිදු කළ විශාල ජීවිත හා දේපළ හානියත්, තවදුරටත් එවැනි ම දේ කිරීම සඳහා සැලසුම් පවතින බවට විවිධාකාර දේ මගින් හෙළිදරව් වීමත් සමග ම රට පුරා ම මතු වූ ප්‍රධාන ප්‍රශ්නය වූයේ මහජනතාවගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයයි. දරුවන් පාසල් යවා ගැනීමට පවා බැරි තත්ත්වයකුත්, බොහෝ දෙනෙකුට තමන්ගේ රැකියා වලට යෑමට බැරි තත්ත්වයකුත්, බොහෝ ව්‍යාපාර පවත්වා ගෙන යෑමට බැරි තත්ත්වයකුත්, මූල්‍ය හා වෙනත් ආයතන පිළිබඳ ව යම් විශ්වාසයක් තිබුණා නම් ඒ විශ්වාසය ප්‍රබල ව පළුදු වීමත් ආදි බොහෝ කරුණු මේ අනාරක්ෂිත තත්ත්වය පිළිබිඹු කළේ ය.

මෙහි දී රාජ්‍යයක් විසින් සිදු කළ යුතු යුතුකම් මොනවා ද යන්න පිළිබඳ වත් ඒ එසේ යුතුකම් ඉටු කිරීමට පදනම් වන දේශපාලන විද්‍යා න්‍යාය හා නෛතික න්‍යාය මොනවා ද යන්නත් වටහා ගැනීම දැන් පවතින තත්ත්වය වෙනස් කර ගැනීමට විශාල රුකුලක් වනු ඇතැයි සිතමි.

ආණ්ඩුවක් මිනිසුන් විසින් පිහිටුවා ගන්නේ මූලික වශයෙන් ම තමන්ගේ ආරක්ෂාව සඳහා ය යන මතය දේශපාලන විද්‍යාව තුළ හොඳින් ස්ථාවර වී ඇති න්‍යායකි. තෝමස් හොප්ස් නමැති ප්‍රබල චින්තකයා විසින් 17 වන ශත වර්ෂයේ දී ඒ න්‍යාය ඔහු අතින් බිහි වුණු ප්‍රධාන කෘතියක් වන ලෙවායතන් (Leviathan) නමැති පොතෙන් දීර්ඝ ව විස්තර කර ඇත. මිනිසුන් වෙන් වෙන් ව ජීවත් වන තුරු රාජ්‍යයක අවශ්‍යතාවක් නැත. රාජ්‍යයක අවශ්‍යතාව ඇති වන්නේ මිනිසුන් පොදුවේ ජීවත් වීමට පටන් ගැනීමත් සමඟ ඇති වන සමාජ තුළ ය. එසේ ඇති වීමට හේතුව

වන්නේ සමාජයේ සැම කෙනෙකු ම තම තමන්ගේ වාසිය සඳහා වැඩ කිරීමට පෙලඹෙන නිසාත්, ඒ නිසා ගැටුම් ඇතිවීම වැළැක්විය නොහැකි නිසාත්, ඒ ගැටීම් ප්‍රචණ්ඩ ක්‍රියා බවට පරිවර්තනය වී ඒ මගින් ජීවිත හා දේපළ හානි සිදුවීම ස්වාභාවික ව ම සිදුවනවා ය යන අවබෝධය රාජ්‍යයක් පිහිටුවා ගැනීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකයක් බව ඔහු කියා සිටියේ ය. රාජ්‍යය ගොඩනගා ගැනීම තුළින්, මිනිසුන් තමන් එකිනෙකාගෙන් ආරක්ෂා වීම කරවා ගැනීම වෙනුවෙන්, ආණ්ඩුවට ඒ සඳහා අවශ්‍ය එකඟතාව ප්‍රකාශ කොට අවශ්‍ය බලය ආණ්ඩුවකට පවරයි. ආණ්ඩුව මේ යුතුකම බාරගැනීම සමාජයක් බවට පරිවර්තනය වීමේ ප්‍රධාන ම සාධකයක් බවට පත් වේ.

මින් පසු ශතවර්ෂ ගණනාවක් තුළ මේ මූලික අදහස තවදුරටත් විවිධාකාරයෙන් වර්ධනය විය. බ්‍රිතාන්‍යය ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය, ප්‍රංශ විප්ලවය, ඇමරිකානු නිදහස් අරගලය හා ව්‍යවස්ථාව ගොඩනැගීම ආදී අවස්ථා ආණ්ඩුවක කාර්යය පිළිබඳ ව නිර්වචනය කර ගැනීමත්, ඒ අනුව ආණ්ඩුව විසින් ජනතාවගේ ආරක්ෂාව සලසා දීමට බලතල පැවරීම මෙන් ම, ඒ බලතල අනිසි ආකාරයකින් පාවිච්චි කිරීම වළක්වා ගැනීමේ ක්‍රම ආදිය පිළිබඳ ව ඉතා දීර්ඝ සාකච්ඡාවක් සමස්ත ලෝකය පුරාම පැතිර ගියේ ය. මේ අනුව විශාල මතවාදයක් ලෝකය පුරා ම පැතිරී මුල්බැසගෙන ඇත. මහජනතාවගේ ආරක්ෂාව පිළිබඳ ව ගොඩනැගෙන රාජ්‍යයට ස්වෛරීභාවය පදනම් වූ රාජ්‍යයක් යැයි කියනු ලැබේ. ස්වෛරීභාවය පවතින්නේ ජනතාව තුළ ය. ලංකාවේ 1978 ව්‍යවස්ථාව ද මේ පදනම මත ලියවී ඇත. එය ප්‍රකාශ කරන ආකාරයට රාජ්‍යය රඳා පවතින්නේ ජනතාවගේ ස්වෛරීභාවය යන පදනම මත ය.

ස්වෛරීභාවය හා ආරක්ෂාව යන කරුණු දෙක එකිනෙකින් වෙන් කළ නොහැකි සේ බද්ධ වී ඇත. ආරක්ෂාවකින් තොර ජනතාවකට ඇති ස්වෛරීභාවයක් නැත. විවිධාකාර හේතු මත යම් දේශයක මිනිසුන් තුළින් තමන්ට ආරක්ෂාව නැත යන අදහස ප්‍රකාශයට පත් වීමට පටන් ගත්තොත් එයින් ඉතා තදබල ව කියැවෙන්නේ තමන්ට කිසිදු ස්වෛරීභාවයක් නැති බවත් තමන් වෙනත් බොහෝ දෙයට යටත් වුණු, ජීවිතය කෙටි ඉතා රළු එකක් බවට පත් වූ මිනිසුන් කණ්ඩායමක් බව ය.

මිනිසුන්ගේ ආරක්ෂාව නැති වීමට එක් ප්‍රධාන සාධකයක් වන්නේ යුද්ධයයි. එක් රටක් විසින් තවත් දේශයක් ආක්‍රමණය කොට, ඒ දේශය ඔවුන්ගේ බලය යටතට ගෙන ඉන්පසු ඔවුන්ගේ වුවමනා සඳහා ඒ දේශයත් එහි සිටින මිනිසුනුත් නතු කර ගැනීම යුද්ධයක අරමුණු වේ. මේ ආකාරයේ යුද්ධ ලෝකයේ සැම ප්‍රදේශයක ම අතීතයේ සිට ඉතා තදබල ආකාරයකින් පැවැති අතර එවැනි අවස්ථාවල දී දුර්වල වූ ජන කණ්ඩායම පරාජයට පත් වී බොහෝ විට වහලුන් බවට පවා හැරවීම පිළිබඳ වෘත්තාන්ත ඉතිහාසයේ ලියැවී ඇත. මේ නිසා යුද්ධයක් ඇති වන අවස්ථාවක තමන්ට ඒ යුද්ධයට මුහුණ දීමට හැකියාව ගොඩනගා ගැනීමත්, ඒ මාර්ගයෙන් වෙනත් රටකට හෝ ජාතියකට යටත් වීම වළක්වා ගැනීමත් ආණ්ඩුවක පරම යුතුකමක් වේ.

තවත් රටක් සමග පවතින යුද්ධය මෙන් ම අභ්‍යන්තර සිවිල් යුද්ධය ද ජනතාව තුළ අනාරක්ෂිත භාවයක් ඇති කරන ප්‍රධාන සිදුවීමකි. මෙහි දී ජීවිත නැති වීම මෙන් ම, ජීවිත විශාල වශයෙන් අවතැන් වීමත්, දේපළ අවතැන් වීමත්, සාමාන්‍ය ජීවිතය ගෙන යා නොහැකි වීමත්, ආර්ථිකයක් ගොඩනගා ගැනීමට නොහැකි වීමත් ආදි විශාල ගැටලු රටක් තුළ පැන නගී. එවැනි අවස්ථාවක ආණ්ඩුවේ යුතුකම වන්නේ එවැනි අනාරක්ෂිත භාවයක් ඇති වීම වළක්වා ලීම හා එවැනි තත්ත්වයක් ඇති වුවහොත් වහා ම ක්‍රියාත්මක වී ඒ තත්ත්වය නැති කොට සමාජය සාමාන්‍යයෙන් පවත්වා ගෙන යෑමට හැකි තත්ත්වය නැවත වරක් ඇති කොට ඒ මගින් ජනතාවගේ ආරක්ෂාව සලසා දීමය.

යුද්ධ හෝ සිවිල් යුද්ධ නැති සමාජයක් පවත්වා ගෙන යෑම ආණ්ඩුවේ පරම යුතුකමකි. එසේ පවත්වා ගෙන යෑම කරන්නේ ආණ්ඩුව විසින් මහජන සාමය පවත්වා ගෙන යෑමට ගොඩනගන්නා වූ ආයතන මාලාවක් තුළිනි. මේ ආයතන මාලාව එදිනෙදා වැඩ කරන ආකාරය තුළින් රටේ ජනතාවගේ ආරක්ෂාව සලසා දීම සිදු කරයි.

ආරක්ෂාව සදා ගැනීමටත් ඒකාබද්ධ සමාජයක් සේ එකට ජීවත් වීමටත් මුල් වන ප්‍රධාන කරුණ නම් පොදුවේ පිළිගත් නීතියක් හා නීති ක්‍රමයක් යම් දේශයක් තුළ ගොඩනගා ගැනීමයි. ආරක්ෂාව පිළිබඳ මූලෝපායේත්, සමාජයේ ස්ථාවරත්වය පිළිබඳ මූලෝපායේත් එකිනෙකා අතර ගැටීම් වළක්වා ගැනීමේ

මූලෝපායේත් ප්‍රධාන ම කරුණ වන්නේ මෙසේ පොදුවේ පිළිගත් නීතිමාලාවක් හා එය ක්‍රියාත්මක කරවා ගන්නා නීති ක්‍රමයක් රටක් තුළ පැවැතීම ය. මේ අනුව ආරක්ෂාවේ කොඳු නාරටිය වනාහි පොදුවේ පිළිගත් නීති ක්‍රමයක් හා ඒ නීතිය ක්‍රියාත්මක කරවාගත හැකි සංස්ථාවල පැවැත්මයි.

මේ නීති ගොඩනගා ගැනීමේ දී ජනතාවගේ ස්වෛරීභාවය ඉහළින් ම ප්‍රකාශයට පත් කෙරෙයි. කිසියම් බලධාරියෙකුට හෝ බලධාරී සංස්ථාවකට (පාර්ලිමේන්තුව වැනි) මේ බලය ජනතාව විසින් දෙන අතර එය ක්‍රියාත්මක වීමේ දී ජනතා අභිමතය අනුව හා එකඟත්වය අනුව ඒ නීති ගොඩනගා ගැනීම තුළින් ජනතාවගේ අභිවෘද්ධිය හා පරමාර්ථ ඉටු වෙයි යන්න මූලික සිද්ධාන්තයයි. මේ අනුව පොදුවේ පිළිගන්නා නීති ක්‍රමයක් ගොඩ නගා ගැනීමේ යුතුකම, නීතිය සෑදීමේ බලය පැවරෙන සංස්ථාව මත පැවරේ.

වර්තමාන යුගයට පිවිසීමට පෙර මේ බලය පැවතුණේ රජවරුන් සතු ව ය. රජවරු නීති පැනවූ අතර ඒ නීති ක්‍රියාත්මක කළේ ද තමන් වටා සිටි ප්‍රභූවරුන්ගේ මාර්ගයෙනි. ඒ කාලය තුළ රජතුමාගේ අභිමතය නීතිය බවට පත් විය. ඒ නීතිය කඩන්නන්ට මරණ දඬුවම පවා පැවරීමේ බලය රජුට පැවරී තිබිණි.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ යුගයට අවතීර්ණ වීමේ දී රජු සතු බලය ජනතාව විසින් පත් කර ගන්නා නියෝජිතයන් මත පැවරිණ. රටට අවශ්‍ය වන්නා වූ නීතිය සකස් කිරීම ඒ නියෝජිතයන් මත පැවරෙන ප්‍රධාන ම කාර්යය වේ. එමෙන් ම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ඔවුන් ඒ කාර්යය කරන්නේ හුදෙකලා ව නොවේ. එය ඔවුන් කළ යුතු වන්නේ නිරන්තරයෙන් ම ජනතාවත් සමඟ ඇති කර ගන්නා වූ එකඟතා මාර්ගයෙනි. ප්‍රකාශනයේ අයිතිය, ලිවීමේ අයිතිය, සංවිධානය වීමේ අයිතිය, සාකච්ඡා කිරීමේ අයිතිය ආදි අයිතිවාසිකම් වැදගත් වන්නේ මේ ජනතාවත් රටේ නීති සදන සංස්ථාවත් අතර පවතින සම්බන්ධය ඉතා ජීවමාන එකක් බවට පත් කර ගැනීම සඳහා ය.

නීති සෑදීමේ කාර්යය යම් එක් පුද්ගලයෙකුට පමණක් පැවරෙන තත්ත්වයක් ඇති වූ විට හා ඔහු හෝ ඇය ඒ කාර්යය තමන්ගේ හිතුවක්කාර ආකාරයට කරන තත්ත්වයක් තුළ ඇති වන රාජ්‍ය ක්‍රමය, ඒකාධිපති රාජ්‍යය හෝ හිතුවක්කාර පාලනය

යන නම් වලින් හැඳින්වෙයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය හිතුවක්කාර පාලනයක් නොවේ. එය ජනතාවගේ කැමැත්තත් අනුදැනුමත් නිරන්තරයෙන් ම ගොනු කර ගනිමින්, ඒ අනුව රට තුළ පාලනය ගෙන යෑමකි. මේ හිතුවක්කාර පාලනය හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනය අතර නිරන්තර ගැටීමක් පවතී. ප්‍රජාතන්ත්‍රවාදී මාර්ග වලින් බලයට පත් වූවන් පවා බොහෝ විට තමන්ගේ අභිමතය පරිදි රටේ නීතිය සදා ගැනීමටත් ඒ නීති ක්‍රියාත්මක කරන සංස්ථා පාලනය කර ගැනීමටත් උත්සාහ කරයි.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ මේ හිතුවක්කාර භාවය දෙආකාරයකින් නැති කර දමයි. මුලින් ම නීති සෑදීම ජනතා නියෝජිතයන් විසින් කරන අතර ඒ නියෝජිතයන් ඒ පිළිබඳ ව දැනුවත්කමකින් හා වගකීමක් ඇති ව කරනවා ය යන විශ්වාසය ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ම පදනමකි. ඒ නියෝජිතයන් තමන් සතු බලය එක් පුද්ගලයෙකුට පවරන්නේ නම් හෝ යම් පුද්ගලයෙකුට ඒ බලය ඔහුගේ අතට ගෙන ජනතා නියෝජිතයන් යටපත් කර ගැනීමට හැකි වන්නේ නම් එතැන ද ඇති වන්නේ හිතුවක්කාර පාලනයකි.

හිතුවක්කාර පාලනයක ගැඹුරු ම අගතිය වන්නේ ආණ්ඩුවේ මූලික ම යුතුකම වන ජනතා ආරක්ෂාව පිළිබඳ යුතුකම මගහරිමින් බොහෝ දුරට පාලකයාගේ ආරක්ෂාව හා පාලකයාගේ වුවමනා ඉටු කර ගැනීම සඳහා රටේ ජනතාව මෙන් ම සම්පත් හැසිරවීමක් සිදු වීම ය. මේ නිසා හුදෙක් ම ඡන්දයෙන් පත් කර ගත් නියෝජිතයන් සිටි පමණින් ම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ඇති නොවේ. ඒ පත් කර ගැනීම සැබෑ කර ගැනීම සඳහා සැබෑ සහභාගිත්වයකින් යුතු ව මේ නියෝජිතයන් රටේ නීති ගොඩනැගීම හා ඒ නීති ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කිරීම මෙන් ම, ඒවා කර ගෙන යෑමට අවශ්‍ය වන්නා වූ මූල්‍ය හා වෙනත් සම්පත් දීමට කරන සාමූහික උත්සාහය තුළ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමය පවතී.

# 3.
# අප්‍රේල් 21 වෙනි පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන වගකිව යුත්තේ කවුද?

කතෝලික පියවරු තුන් දෙනෙකු විසින් ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනුකර ඇති මානව හිමිකම් උල්ලංඝනය පිළිබඳ නඩු නිමිත්තක් මගින් මතු කර ඇති ප්‍රශ්නය නම් අප්‍රේල් 21වන දින ප්‍රහාරයට සිදු වීමට ඉඩහරින ආරක්ෂාව කඩ කිරීමේ වරදට වගකිව යුත්තේ කවුරුන් ද යන්න ය.

මෙහි දී මතු වන ප්‍රශ්නය නම් ඉහත සඳහන් ප්‍රශ්නයට පිවිසෙන්නේ රාජ්‍යය පිළිබඳ ව පවතින කුමන දේශපාලන විද්‍යා දර්ශනයක් මත ද? හා කුමන නෛතික දර්ශනයක් (Jurisprudents) මත ද යන්න ය.

අප්‍රේල් 21 වන දින සිදු වීම පිළිබඳ ව ප්‍රධාන වගකීම පැවරෙන්නේ ලංකාවේ ව්‍යවස්ථාදායකට බවත්, විධායකයට හා අධිකරණයට ද මේ සිදුවීම් වළක්වා ගැනීමට බැරි වීම පිළිබඳ ව විශාල වගකීමක් පැවරෙන බවත් කිය හැකි ය.

## දේශපාලන විද්‍යා දර්ශනය

ලංකාව ස්වෛරී ජනතාවක් ජීවත් වන රටකි. ඒ ස්වෛරීභාවය ඇති වූයේ තමන්ගේ ආරක්ෂාව සඳහා (self-preservation) සංවිධානාත්මක ව එකට ජීවත් වීමට ජනතාව විසින් එකඟ වී තිබීම නිසා ය. ස්වයං ආරක්ෂාව සඳහා සංවිධානාත්මක ව ජීවත් වීමේ එකඟතාව තුළින් පමණක් ජනතා ස්වෛරීභාවය ඇති වේ.

මේ අනුව ස්වෛරීභාවය එක් එක් පුද්ගලයා හිමි කරගන්නේ සමස්ත ජනතාවගේ ම කොටසක් හැටියට ය. එසේ නැති ව එක් එක් පුද්ගලයාගේ ස්වෛරීභාවය කියා දෙයක් ඇත්තේ නැත. ස්වෛරීභාවය එක් රාජ්‍යයක් තුළ ජීවත් වන සියලු ම ජනතාව සතු වේ.

ස්වෛරීභාවයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොවේ. සමස්ත ජනතාවක් සංවිධානාත්මක ව ජීවත් වීම මගින් තමන්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට ඇති වන එකඟතාව ජනතා ස්වෛරීභාවයේ පදනම වේ.

රාජ්‍යතන්ත්‍රයක් තුළින් සංවිධානාත්මක ජනතාවක් තමන් ආරක්ෂා කිරීමේ වගකීම, ඒ රාජ්‍යතන්ත්‍රය වෙත පවරයි. ඒ පැවරීම කොන්දේසි විරහිත එකක් නොවේ. ස්වෛරී ජනතාවක් තමන් ඉන්නා තත්ත්වයට වඩා වැඩි අන්තරාදායක තත්ත්වයක් ඇති කර ගැනීම සඳහා තම ස්වෛරීභාවය රාජ්‍යතන්ත්‍රයට පවරන්නේ නැත. ජෝන් ලොක් (John Locke) පෙන්වා දුන් ආකාරයට තමුන් ඉන්නා තත්ත්වයට වඩා වැඩි අවාසිදායක තත්ත්වයක් ඇති කරගැනීම සඳහා සංවිධානය වන්නේවත්, ඒ සංවිධානය වීමේ තත්ත්වය රාජ්‍යතන්ත්‍රයකට පවරන්නේවත් නැත. ඒ පැවරීම සිදු වන්නේ තමන්ට වැඩි වාසිදායක තත්ත්වයක් ඇති කර ගැනීම සඳහාය. වඩා පාඩු විඳීමට නොව වැඩි ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා පමණක් ම ජනතාව තම ස්වෛරීභාවය රාජ්‍යතන්ත්‍රයකට පරිත්‍යාග කරයි.

සමස්ත රාජ්‍යතන්ත්‍රයට ම තමන් සාධාරණය කර හැක්කේ හා නීත්‍යානුකූල යයි කියාගත හැක්කේ ජනතාවගේ ස්වයං ආරක්ෂාව තහවුරු කරන තාක් පමණි. එසේ කිරීමට රාජ්‍යතන්ත්‍රය අසමත් වන්නේ නම් ඒ රාජ්‍යතන්ත්‍රයේ ම නීත්‍යානුකූලභාවය (legitimacy) අහෝසි වෙයි. එසේ අහෝසි වන්නේ සමස්ත රාජ්‍යතන්ත්‍රයේ ම නීත්‍යානුකූලභාවයයි.

## ව්‍යවස්ථාදායකයේ නීත්‍යානුකූලභාවය (The legitimacy of the legislature)

ජනතාවගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය නීති පද්ධතිය ගොඩනැගීමේ බලය ජනතාව විසින් පවරා ඇත්තේ තමන් විසින්

පත් කරගත් තමන්ගේ නියෝජිතයන්ට ය. එනම් ඡන්දයෙන් පත් කරගත් සියලු ම මන්ත්‍රීවරුන්ට ය. මෙහි දී, මන්ත්‍රීවරයා අයිති වන්නේ ආණ්ඩු පක්ෂයට ද විරුද්ධ පක්ෂයට ද කියා වෙනසක් නැත. ව්‍යවස්ථාදායකය සැදෙන්නේ සියලු ම මහජන නියෝජිතයන් ලෙස පත් කරගත් මන්ත්‍රීවරුන් තුළින් නිසා ව්‍යවස්ථාදායකයේ වගවීම, ඒ සියලු ම නියෝජිතයන් තුළින් සමස්තයක් වශයෙන් ප්‍රකාශයට පත් වන්නකි.

ව්‍යවස්ථාදායකයට ද තමන් වෙත බලය පැවරූ ස්වෛරී ජනතාවගේ ආරක්ෂාව සාක්ෂාත් කරීමට බැරි වුවහොත් ව්‍යවස්ථාදායකයේ ම නීත්‍යානුකූලභාවය (Legitimacy) ගැන ප්‍රශ්නයක් මතු වේ. ජනතා අනාරක්ෂිතභාවය තුළින් ප්‍රකාශයට පත් වන්නේ ව්‍යවස්ථාදායකය තමන්ගේ ප්‍රාථමික වගකීම පැහැර හැර ඇති බව ය.

උදාහරණයක් වශයෙන්, පාස්කු ඉරිදා ජන ඝාතනයෙන් මියගිය හෝ තුවාල වීමට පත් වූ හෝ දේපළ හානියකට මුහුණ දුන් අය ඉදිරියේ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් තමන්ගේ පැවැත්ම සාධාරණීකරණය කරන්නේ කෙලෙස ද? එසේ විපතට පත් වූවන් තමන්ගේ ව්‍යවස්ථාදායකයේ ඒ බලය පැවරුවේ මෙවැනි ඉරණමකට මුහුණදීම සඳහා ද? ඇත්තෙන් ම නැත.

## ලංකාව තුළ ජන ආරක්ෂාවට හිතකර වූ නීති සම්පාදනය කිරීමට එහි ව්‍යවස්ථාදායකයට නොහැකි වී ඇත්තේ ඇයි?

මේ ප්‍රශ්නයට උත්තරය නම්, ව්‍යවස්ථාදායකය විසින් ම 1978දී නීතිගත කරන ලද ශ්‍රී ලංකා ජනරජ ව්‍යවස්ථාව ම ජනතා ආරක්ෂාවට තර්ජනයක් වන නිසා ය යන්නයි. 1978 ඇති කරන ලද ඒ තත්ත්වය අහෝසි කර දමා ජනතා ආරක්ෂාව තහවුරු කළ හැකි ව්‍යවස්ථාවක් ඇති කර ගැනීමට, ඉන් පසු ව්‍යවස්ථාදායක බලය භාරගත් මහජන නියෝජිතයන්ට නොහැකි වී ඇත. රටේ ප්‍රධාන නීතිය වන ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව ජනාරක්ෂාව සපයා දීමට බැරි එකක් සේ පවතින තාක් දුරට මහජන ආරක්ෂාව පිළිබඳ ව කිසිදු විශ්වාසයක් තැබිය හැකි තත්ත්වයක් උදා වන්නේ නැත.

1978 ව්‍යවස්ථාව පදනම් වී ඇත්තේ පාලකයා ජනතාවගෙන් ආරක්ෂා වීමට මිස, ජනතාවගේ ආරක්ෂාව සාක්ෂාත් කරදීමට නොවේ. මෙය සාධාරණය කර ගැනීම සඳහා අපූරු තර්කයක් ඉදිරිපත් කොට ඇත. එනම් ජනතාව ඡන්ද බලය පාවිච්චි කිරීමෙන් අපට, එනම් පාලකයන්ට තම ස්වෛරීභාවය පවරා දී ඇත. එම නිසා නැවත ඡන්දයක් එනතුරු ජනතාව අප කරන ඕනෑම දෙයක්, අප නිර්මාණය කරන ඕනෑම නීතියක් ඉවසා සිටිය යුතු ය. ජනතාවට ස්වෛරීභාවය ඇත්තේ තම ඡන්දය පාවිච්චි කරන අවස්ථාවේ දී පමණක් ය යන්න ප්‍රචාරක මාධ්‍ය විසින් පාලකයන් තුළින් තමන්ගේ ම වාසිය සඳහා ම පමණක් පතුරුවා ඇති අදහසකි. මෙය විකාර අදහසකි. ජනතා ස්වෛරීභාවය යන සංකල්පය උඩු යටිකුරු කර දැමීමකි. ඇත්තෙන් ම මෙය පිස්සු අදහසකි. එවැනි පිස්සු අදහසක් මත තමන් ම සාධාරණීකරණය කරගන්නා ව්‍යවස්ථාදායකයට පැවැතීමට අයිතියක් තිබේ ද? තමන් වෙත මරණය ගෙන ඒමට තම ස්වෛරීභාවය පාවා දීමට තරම් පහත් තත්ත්වයකට ලාංකීය ජනතාව පත් වී තිබේ ද?

විකාරයෙන් නන් දොඩවන ව්‍යවස්ථාදායකයක් පවතින තාක් දුරට, ජනතා ස්වෛරීත්වය යන වචනවලට අර්ථවත්, බුද්ධිගෝචර ප්‍රකාශනයක් කිරීමේ ඉඩකඩ තිබේ ද?

1978 ව්‍යවස්ථාව 'නීතිය මත පාලනය' යන දර්ශනය හා පාලන රටාවට විරුද්ධ ව (opposing the rule of law) ගොඩනගා ඇති එකකි. ව්‍යවස්ථාව මගින් නීතිය මත පාලනය අහෝසි කොට විධායක ජනාධිපතිගේ හිතුවක්කාරකම අනුව රට පාලනය කිරීමට හැකි තත්ත්වයක් උදාකර ගත්තේ ය. මෙසේ නීතිය මත පාලනයට විරුද්ධ ව පාලන තන්ත්‍රයක් සදා ගැනීම තවත් රටවල ද සිදු වී ඇත. මෙය මියන්මාරයේ (බුරුමයේ) සිදු වුණු ආකාරය, මියන්මාරය නීතිය මත පාලනයට විරුද්ධ වීම, (Opposing rule of law) නික් චීස්මන් (Nick Cheeseman) විසින් ලියා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය (Cambridge University) මගින් පොතක් ලෙස ප්‍රකාශයට පත්කොට ඇත.

ජෝන් ලොක් (John Locke) හුදෙක් පාලකයාගේ ආත්මාර්ථකාමිත්වය සඳහා රටක් පාලනය කිරීම හා පොදු

යහපත අරබයා සිදු කරන පාලනය යනුවෙන් පාලනතන්ත්‍ර වර්ගීකරණය කොට ඇත. 1978 ව්‍යවස්ථාව මගින් ලංකාවේ නීතිගත කර ඇත්තේ පාලකයාගේ ආත්මාර්ථකාමී අරමුණු ඉටු කරගැනීම සඳහා සදාගත් ව්‍යවස්ථාවකි. මෙවැනි ව්‍යවස්ථාවක් පවතින තාක් දුරට ස්වෛරී ජනතාවකට තමන්ගේ ආරක්ෂාව සඳහා රාජ්‍යතන්ත්‍රයක් බිහි කර ගැනීමට නොහැක.

ඇති වී තිබෙන අස්ථාවරත්වයට ව්‍යවස්ථාදායකය සමස්තයක් වශයෙන් වගකිව යුතු බවට තවත් ප්‍රධාන සාධකයක් නම්, නීතිය ක්‍රියාත්මක කරවා ගැනීමට මානුෂික හා මූල්‍යමය සම්පත් වෙන් කොට දීම ව්‍යවස්ථාදායකයෙන් පැහැර හැර තිබීමයි. සිවිල් පොලිසිය, ප්‍රොසිකියුටර්(Prosecutor) කාර්යය කරන නීතිපති දෙපාර්තුමේන්තුව හා නීතිය ක්‍රියාත්මක කිරීම කෙරෙහි බලවත් සේවයක් කරන අධිකරණ පද්ධතිය හා ආරක්ෂක අංශයේ බුද්ධි අංශය වැනි සංස්ථා කාර්යක්ෂම ව පවත්වා ගැනීමට නම් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත්, ව්‍යවස්ථාදායකය විසින් දිය යුතු ය. මේ පිළිබඳ ව කිසිදු උනන්දුවක් පසුගිය කාලය තුළ රට පාලනයේ යෙදුණු කිසිදු ආණ්ඩුවක හෝ විරුද්ධ පක්ෂයකවත් අවධානයට යොමුවූ බවක් පෙනන්නට නැත. අවශ්‍ය මූල්‍ය සම්පත් දී ඇත්තේ ත්‍රිවිධ හමුදාවලට පමණි. එහෙත් භයානක අනතුරු වළක්වාලීමේ කටයුත්ත මූලික ව පවතින්නේ ඉහත සඳහන් යුක්තිය පසිඳලීමේ සංස්ථා තුළ ය.

ව්‍යවස්ථාදායකයේ අතපසු කිරීම් සම්බන්ධයෙන් තවත් බොහෝ දේ කිය හැකි නමුත්, ඉහත කී අතපසු කිරීම් දෙක, එනම්, දැනට රටට අවශ්‍ය සාධාරණ නීති පද්ධතියක් ගොඩනැගීමට අපොහොසත් වීම හා නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය සම්පත් දීම පැහැර හැරීම පිළිබඳ ව පිළිතුරු සෙවීම තුළ මහජන ආරක්ෂාව රැඳී පවතින බව අවධාරණය කිරීම සෑහේ.

## විධායකයේ නීත්‍යානුකූලභාවය

ප්‍රායෝගික ව රාජ්‍යතන්ත්‍රයක් පවත්වාගෙන යෑම කරන්නේ විධායකය විසිනි. එහෙත් අප්‍රියල් 21 පාස්කු ඉරිදා සිදුවීම් තුළින් පෙන්නුම් කරන්නේ විධායකය මේ කාර්යය ඉටු කිරීම සාහසික ව අතපසු කොට ඇති බව ය.

එසේ වූයේ ඇයි? එසේ වීමට මූලික ම හේතුව වන්නේ විධායකය ව්‍යවස්ථාදායකයට යටත් බව පිළිගැනීම 1978 ව්‍යවස්ථාව මගින් අවතැන්කොට දැමීම ය.

ව්‍යවස්ථාදායකයේ ප්‍රාථමිකභාවය (the supremacy of the legislation) යන දේශපාලන විද්‍යා දර්ශනයෙන් බැහැර වී, විධායක ජනාධිපතිවරයා මුල් තැනට පත් කිරීම 1978 ව්‍යවස්ථාව තුළින් සිදු විය.

හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන 1977 දී එක්සත් ජාතික පක්ෂයේ පත්වීම් ලබා සිටි සියලු ම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් දින රහිත ඉල්ලා අස් වීමේ ලිපි ලබා ගැනීමෙන් මෙය සංකේතවත් කරයි. ලොක්කා මමයි, උඹලා ඉන්නේ මා කියන දෙයට අත එසවීමට පමණයි, යන පණිවිඩය ප්‍රකාශයට පත් කෙරුණේ, එසේ ඉල්ලා අස්වීමේ ලිපි ලබා ගැනීමෙන් ය.

මෙය සමස්ත රාජ්‍යතන්ත්‍රය අවුල් කර දැම්මේ ය. ව්‍යවස්ථාදායකයේ ස්වාධීනත්වය නැති කළේ ය. අතිශයින් ව්‍යාකූල තත්ත්වයක් මෙය තුළින් පැන නැගුණි. එසේ ඇති වීම ප්‍රායෝගික ව බලය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් විශාල ගැටලු ඇති කළේ ය. ඇත්තෙන් ම රාජ්‍යතන්ත්‍රයට ජනතා නියෝජනය කිරීමට බැරි වන තත්ත්වයට ඒ අවුල් පැතිර ගියේ ය. රටේ ඉන් පසු ව ඇති වූ සියලු ම ප්‍රබල ගැටීම් වලට මූලික හේතුවක් වූයේ ව්‍යවස්ථාදායකය හා විධායකය ඉහත කී ආකාරයෙන් දූෂණය වීමය.

විධායකය රටේ ස්වාධීන ව පැවැතිය යුතු සියලු ම සංස්ථා කෙරෙහි අත පොවන්නට පටන් ගත්තේ ය. සිවිල් පොලිසියට තිබිය යුතු වෘත්තීයමය ස්වාධීනභාවය බොහෝ දුරට යටපත් වී ගියේ ය. මේ යටපත්වීම් වල ප්‍රතිපලය ලෙස ඒ සංස්ථා වල සේවයේ යෙදුණු ඉහළ ම නිලධාරීන් තුළ තමන්ට කළ හැක්කේ කුමක් ද කළ නොහැක්කේ කුමක් ද යන්න පිළිබඳ ව දැඩි ව්‍යාකූලතාවක් ඇති වුණි. ඒ ව්‍යාකූලතාවෙන් ඇති කරන ලද්දේ අකාර්යක්ෂම බව, බුධිගෝචර බව හීනවීම, අණදීමේ වගකීම නැතිවීම (The Command Responsibility) හා උදාසීනත්වයයි. එය උඩ සිට යටට පැතිර ගියේ ය.

කලෙක නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වූ මා හොඳින්

හඳුනන අයෙක්, මේ තත්ත්වය විස්තර කළේ මෙසේ ය. දිනක් මම මගේ වාහනයෙන් රජකාරියක් සඳහා යන අතර මට දුරකථන ඇමතීමක් ලැබිණ. මා රිසීවරය කන තබා ගත් විට මට අසන්නට ලැබුණේ මා මවිතයට පත් කළ කටහඬකි. එය එවකට ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතාගේ කටහඬ ය. ඔහු තමා ජනාධිපතිවරයා යයි හඳුන්වා දී ඔහු වෙනුවෙන් යම් රජකාරි කටයුත්තක් කරන ලෙස මගෙන් ඉල්ලා සිටියේ ය. එතෙක් පැවැති සම්ප්‍රදාය වූයේ ජනාධිපතිවරයා පොලිසිය සම්බන්ධ කටයුතු වලදී කෙළින් ම කථා කරන්නේ පොලිස්පතිවරයාට ය. එය විධායකයේ ප්‍රධානියා විසින් පොලිසියේ ප්‍රධානියා සමඟ කරන සාකච්ඡාවකි. ඒ සාකච්ඡාවෙන් කරන ඉල්ලීමක් ඇත්නම් ඊට එකඟ වීම හෝ නොවීම පොලිස්පති වරයාගේ වගකීමක් විය. ජනාධිපතිවරයාගේ හෝ ආණ්ඩුවේ ප්‍රධානියාගේ යම් ඉල්ලීමක් නිත්‍යානුකූල ද හා රාජකාරිය ඉටු කිරීමට අනිසි ලෙස අතපෙවීමක් ද ලෙස නිගමනයක් ගැනීම පොලිස්පතිවරයා සතු වගකීමක් විය. ඒ ඉල්ලීම, ඊට අදාළ නිලධාරියෙකු ලව්වා කළ යුතු ද නැද්ද යන්න පොලිස් පතිවරයා නිගමනය කළ යුතු ය. ඉන් පසු ඒ ඉල්ලීම ක්‍රියාත්මක කිරීම නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යොමු කිරීම පොලිස්පතිගේ වගකීම ය. එසේ කිරීම සම්බන්ධයෙන් යම් නෛතික විරෝධයක් හෝ, ඒ ඉල්ලීම ඉටු කිරීමෙන් ඇති විය හැකි ආනිසංශ ගැන පොලිස්පතිවරයාට දැනුම් දීමට අදාළ නිලධාරියාට අවස්ථාවක් ලැබේ. මේ සම්ප්‍රදාය ඇති කළේ නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කිරීම් හා දේශපාලන ඇඟිලි ගැසීම් වළක්වාලීම සඳහා ය. විධායකයේ ප්‍රධානියා කෙළින් ම යම් ඉල්ලීම් යම් නිලධාරියෙකුගෙන් කරන අවස්ථාවල දී ඒ නිලධාරියා අසරණ තත්ත්වයට පත් වේ. ඔහුට පොලිස්පතිවරයාගේ රැකවරණය නොලැබේ. මන්දයත්, පොලිස්පතිවරයා ඔහුට කරන ලද ඉල්ලීමක් හෝ අණක් නොමැති නිසා ය. නිලධාරියා ජනාධිපතිගේ ඉල්ලීම ඉටු නොකළ හොත් ඔහුගෙන් දේශපාලන වශයෙන් පළිගත හැකි ය. නිලධාරියා ජනාධිපතිගේ ඉල්ලීම ඉටු කළහොත් ඔහුට තවත් පාර්ශ්වයකට අසාධාරණයක් කිරීමට සිදු වන්නට පුළුවන. එදා මට සිදු වූ දෙය පසු ව සමස්ත පොලිස් සංස්ථාව තුළට ම පැතිර ගියේ ය. පොලිස්පතිවරයාගේ තත්ත්වය පහළට ඇද වැටුණේ ය. පොලිස් සංස්ථාව තුළ ඇති අණ දීම හා කීකරුකම යන මූලික අදහස්

බාල්දු වී ගියේ යැයි ඔහු ප්‍රකාශ කළේ ඉතා කනගාටුවෙනි. රට යන දිශාව පිළිබඳ ව විශාල කලකිරීමක් ඔහු ප්‍රකාශයට පත් කළේ එසේ ය.

ඒ හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් කෙරුණු ප්‍රකාශයට සමාන ප්‍රකාශයක්, හිටපු ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ හේමසිරි ප්‍රනාන්දු අප්‍රේල් 21වන දින ප්‍රහාරය සම්බන්ධයෙන් විභාග කරන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව ඉදිරියේ දී ප්‍රකාශ කළේ ය. මම අසරණ ආරක්ෂක ලේකම් වරයෙක්. යනුවෙන් ඔහු කළ ප්‍රකාශය මාධ්‍ය තුළින් ඔහුගේ ම කටහඬින් ම ප්‍රකාශයට පත් කෙරිණි.

සියලු ම රාජ්‍ය නිලධාරීන් පසු වන්නේ ඉහත කී අසරණ තත්ත්වයේ ය. එසේ අසරණ නොවී පැවැතිය හැක්කේ පාලකයාගේ අයියලා මල්ලිලා හා හිතවතුන්ට පමණ ය.

ආණ්ඩුවේ නිලධාරීන් අතර බොහෝ ආණ්ඩුවේ නීතිඥයන්ට හැර අධිකරණ නිලධාරීන්ට ද හිමි වී ඇත්තේ ඒ අසරණ තත්ත්වයයි. ඒ අසරණ තත්ත්වයේ සංකේතය හිටපු අග්‍රවිනිශ්චයකාර මොහාන් පීරිස් ය. ඔබ කියන ඕනෑම දෙයක් මම කරලා දෙන්නම්, යනුවෙන් ඔහු වත්මන් ජනාධිපතිවරයාට කරන ලද ප්‍රකාශය, ආණ්ඩුවේ නිලධාරීන් පත් ව සිටින අසරණභාවය පිළිබඳ ව සදාතනික සංකේතයක් වනු ඇත.

ඉහත කී තත්ත්වය ම නීතිපති දෙපාර්තුමේන්තුව තුළ ද ඇති විය. ඒ නිසා ප්‍රොසිකියුටර් කාරිය බලවත් සේ ව්‍යාකූලත්වයට පත් විය.

අප්‍රේල් 21 වෙනිදා සිද්ධිය සම්බන්ධයෙන් දැනට විභාග කරන කොමිසම ඉදිරියේ දී හෙළිදරවු වී ඇති කරුණු වලදී ද පෙනී යන්නේ විධායකයේ ප්‍රධාන වගකීම් දරන්නන් ඒවා පැහැර හැර, ඒ පැහැර හැරීම් ආරක්ෂක අංශවල විවිධ ප්‍රධානීන් වෙත පැටවීමට ගන්නා උත්සාහයයි. වරද සිදු වී ඇත්තේ පාලකයා වශයෙන් මගෙන් වූවත්, මා වෙනුවත් ඔබ වරද පිළිගෙන, ඔබගේ බෙල්ල ඔබ ම කපා ගනින් කියා පාලකයා අදාළ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටී.

මේවා රාජ්‍යතන්ත්‍රයක නිසි ක්‍රියාකාරිත්වය යටපත් කිරීමට හේතුවී ඇත. රටේ පාලනය සිදු වන්නේ රාජ්‍යතන්ත්‍රයක ක්‍රියාකාරිත්වයෙන් නොව, විධායකයේ ප්‍රධානීන්ගේ හිතුවක්කාර අණ දීම් තුළිනි.

මෙවැනි තත්ත්වයක් තුළින් අනාරක්ෂාව හා අස්ථාවරත්වය ඇති වීම පුදුමයක් නොවේ. මෙහි තවත් පැත්තක් ඇත. එනම්, නිතිය මත පාලනය කර්යක්ෂම රාජ්‍යතන්ත්‍රයක මාර්ගයෙන් සිදු නොවන තත්ත්වයක් තුළ, පාලකයින්ට බලයේ සිටිය හැක්කේ රට තුළ අසහනකාරී සිද්ධි ඇති කිරීමෙන් පමණ ය. එවැනි අසහනකාරී තත්ත්වයක් නැත්නම් රටවැසියෝ තමන්ගේ දෛනික ප්‍රශ්න සාකච්ඡා කිරීමටත් අවශ්‍ය විට දී බලපෑම් කිරීමටත් යොමු වේ. සිවිල් සමාජයේ ක්‍රියාකාරිත්වය වැඩිවේ. ප්‍රකාශන අයිතිය හා සංවිධානය වීමේ අයිතිවාසිකම් දැඩි ව ප්‍රකාශයට පත් වේ. රටකට සාමාන්‍යයෙන් අවශ්‍ය වෙනස්කම් හා ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටීමට රටවැසියෝ ඉදිරියට එති. රටේ අසහනකාරී තත්ත්වයක් පවතින තාක් දුරට සිවිල් සමාජයේ මැදිහත් වීම් ව්‍යාකුල කිරීමට හා මැඩ පැවැත්වීමට පාලකයින්ට හැකියාවක් ලැබේ. බොහෝ විට මේ සඳහා හදිසි නීතියද පැනවෙයි.

## අධිකරණයේ වගකීම.

මේ කරුණ රටපුරා ම දැන් දශක ගණනක් තුළ සාකච්ඡා වන කරුණකි. හිටපු අග්‍රවිනිශ්චයකාරවරුන් වන සරත් නන්ද සිල්වා හා මොහාන් පීරිස් ගේ ක්‍රියාකලාප තුළින් අධිකරණයේ ක්‍රියාකලාපයට කොපමණ හානියක් සිදු වී තිබේ ද යන්න පෙන්නුම් කරයි. රටේ අධිකරණයේ ඇතිවී ඇති බාධා සම්බන්ධයෙන් විශ්ලේෂණ ඉමහත් ප්‍රමාණයක් රටේ ලේඛකයන්ගෙන් මෙන් ම එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ නිල වාර්තාකරුවන් විසින්ද, වෙනත් ජාත්‍යන්තර සංවිධාන තුළින් ද පෙන්වා දී ඇත. එහෙත් මේ කිසිවක් නිරාකරණය කිරීම සඳහා කිසිදු ප්‍රයත්නයක් ගෙන ඇති බව පෙනෙන්නට නැත.

රටේ අනාරක්ෂාව හා අස්ථාවරත්වය ගැන අධිකරණයේ වගකීම ඉටු කිරීමට ඇති ප්‍රධාන බාධාව නඩු පමාව ය. අපරාධ නඩුවක් විසඳීම සඳහා අවුරුදු 17කට වැඩි කාලයක් ගත වන රටක මහජනයාගේ ආරක්ෂාව කොතෙක් දුරට අත්පත් කරදිය හැකි ද? 2017 සැප්තැම්බර් 20වෙනි දින ප්‍රකාශයට පත් වුණු පාර්ලිමේන්තු විශේෂ කොමිටිය (parliamentary sectorial committee) මගින් ප්‍රකාශයට පත් කෙරුණු වාර්තාව මගින් නඩු පමාව රට ලැජ්ජාවට පත් කරන බව ප්‍රකාශ කළේ ය. මේ නඩු

පමාව නැති කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කෙරුණු අතර ඒ නිර්දේශ හය මාසයක් තුළ ඉටු කරන ලෙස ඉල්ලීමක්ද කෙරිණි. ඒ කිසිදු නිර්දේශයක් ක්‍රියාවට නැංවීමට උත්සාහයක් ගෙන නැත. ආණ්ඩුව විසින් යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් තවත් කොමිටි ගණනාවක් පවත්වා ඇතත්, ඒවායින් ඉදිරිපත් කෙරුණු නිර්දේශ ද කිසිවක් ක්‍රියාත්මක කොට නැත.

නඩු පමාව හා අධිකරණ ක්‍රමයේ ඇති අඩුපාඩුකම් නිසා මහජනයා අසරණවී ඇති අතර අනාරක්ෂාවට ද භාජනය වී ඇත.

අප්‍රේල් 21 සිදුවීම් සම්බන්ධයෙන් වගකිව යුත්තන් කවුරුදැයි සොයා බැලිය යුතු වේ.

# 4.
# රාජකාරී සම්බන්ධයෙන් සටහන් තබා ගැනීම හා මහජන ආරක්ෂාව

ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම්වල නිල සටහන් තබා ගන්නේ නැති බව අප්‍රේල් 21 වෙනිදා ප්‍රහාර සම්බන්ධයෙන් පත් කොට ඇති පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව ඉදිරියේ නැවත නැවත ප්‍රකාශයට පත් වී ඇත. එය එසේ නොවේ යයි කීමට කිසිදු සාක්ෂියක් මෙතෙක් ඉදිරිපත් කොට නැත.

පාලනතන්ත්‍රයක සිදු වන සියලු ම සාකච්ඡා සම්බන්ධයෙන් ලිඛිත වාර්තා තබා ගැනිය යුතු ය යන්න දැනට අවුරුදු දහස් ගණනක් තිස්සේ, කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් පවතින රටවල තදින් ස්ථාවර කර ඇත. බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී යුගයේ දී සිදු වූ සැම සිද්ධියක් සම්බන්ධයෙන් ම එකල සිටි ආණ්ඩුකාරවරුන්ට ලිඛිත ව වාර්තා කිරීමට ක්‍රමවේදයක් හා ක්‍රියාපටිපාටියක් පැවතුණි. ඒ සියලු වාර්තා සලකා බලා යටත් විජිතය තුළ පාලනය සිදු වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව, එංගලන්තයේ පැවැති යටත් විජිත පාලනය කිරීමේ පාලනතන්ත්‍රයට යැවීමේ වගකීම ආණ්ඩුකාරවරුන්ට පැවරී තිබිණි.

එසේ වර්තා කළ සිදුවීම් ඊට ශතවර්ෂ ගණනාවකට පසු ව වුවත් පරීක්ෂා කර බැලීමට හැකිව ඇත්තේ මේ ලිඛිත වාර්තා පවතින නිසා ය. කලකට පසු ඒ වාර්තා කෞතුකාගාර තුළට ඇතුළත් කිරීමට විධිවිධාන සකස් කෙරිණි.

ලාංකීය විද්වතුන්ට යටත් විජිත කාලය ගැන ගවේෂණය කිරීමට හා පොතපත ලිවීමට මේ කෞතුකාගාර ගත කරන ලද ලේඛන මහත් රුකුලක් විය. එසේ ලේඛනගත කර ආරක්ෂාකර ඇත්තේ යටත් විජිත කාලයේ දී කෙරුණු සාධාරණ වැඩකටයුතු

පමණක් ම නොවේ. 1818 කැරැල්ල හා ඒ කැරැල්ල මැඩ පැවැත්වීම සම්බන්ධයෙන් එකල ආණ්ඩුකාරවරයාගේ වාර්තාව ද ආරක්ෂා කර, කෞතුකාගාර ගත කර ඇත. විවිධ හමුදා නිලධාරීන් කැරැල්ල මර්ධනය කිරීම සඳහා ගත් පියවර ද සටහන් කොට ඇති නිසා, ඒ නිලධාරීන් කරන ලද නීති විරෝධී පියවර ද මේ ලේඛන තුළ අඩංගු කරුණු තුළින් එළිදරවු කෙරිණි.

යටත් විජිතයේ ඇති වුණු සමහර නීති විරෝධී මර්දන කටයුතු බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව තුළ විවාදයට ගැනීමට හැකි වූයේ මේ වාර්තා වල පැවැත්ම නිසා ය. එසේ දරුණු මර්දනයේ යෙදුණු හමුදාපතිවරුන් පවා යටත් විජිතයේ සේවාවෙන් අයින් කොට බ්‍රිතාන්‍යයට නැවත කැඳවූයේත්, සමහරුන්ට දඬුවම් පැමිණවූයේත් මේ ලේඛන වල පැවැත්ම නිසා ය.

මෙසේ රාජ්‍ය පාලනයේ කටයුතු පිළිබඳ ව වාර්තා තබා ගැනීම ග්‍රීක, රෝම ශිෂ්ටාචාර තුළට අතුළු වූයේ රාජකාරි පිළිබඳ ව සටහන් තබාගැනීම අනිවාර්ය යුතුකමක් කොට පැවැති නිසා ය. මේ හේතුව නිසා ම ඈත කාලයක සිට ම, ඔප්පු කළ හැකි කරුණු මත ඉතිහාසය ලිවීමේ සම්ප්‍රදාය ඇති විය. ඒ ඉතිහාසය තුළ ඇත්තේ මිථ්‍යා කථා හෝ කටකථා නොවේ.

අද ඇමරිකාව වැනි රටවල ප්‍රධාන විධායක නිලධාරියා එනම් ජනාධිපති කරන සැම සකච්ඡාවක් ම ලිඛිත ව වාර්තාකර පවත්වාගෙන යා යුතු අතර, ඒ සාකච්ඡා තැටි ගත කිරීම අනිවාර්ය කොට ඇත. රිචඩ් නික්සන් (Richard Nixon) බලයෙන් පහ කිරීමට හේතුවූ කරුණු වලට පදනම වූයේ මේ තැටිගත වාර්තා ය. රටවැසියන්ගේ දුරකථන සකච්ඡා පිළිබඳ ව ඇහුම්කන් දීමට ඔහු කර තිබූ නියෝග මේ තැටිගත වාර්තා තුළ සටහන් වී තිබුණි. මෙය එළිදරවු වූ පසු රිචඩ් නික්සන් (Richard Nixon) මුහුණ දුන්නේ සිරගත වීමේ තර්ජනයට ය. ඔහු එයින් අත්මිදුණේ වහා ම ජනාධිපති කමින් ඉල්ලා අස්වීමෙනි.

රාජ්‍ය පාලනයේ දී සටහන් තබ ගැනීමේ සම්ප්‍රදාය දරුණු ඒකාධිපතියෙකු වූ ජෝසප් ස්ටාලින් (Joseph Stalin) පවා ක්‍රියාවට නැංවී ය. ඔහුගේ මරණයෙන් ටික කලකට පසු රුසියානු කෞතුකාගාර මහජනයාට විවෘත කෙරිණි. ඔහු විසින්, ඔහු ගේ ම අත්සනින් පමණක් මරණයට පත් කිරීමට හෝ සිරගත කිරීමට නියම කළ අය පිළිබඳ ව වාර්තා මේ කෞතුකාගාර තුළ පවතින බව, මේ පිළිබඳ ව හැදෑරීම් කළ ලේඛකයන් පෙන්වා දී ඇත.

ඇත්තෙන් ම ජෝසප් ස්ටාලින් (Joseph Stalin) තමන් රාජකාරි පටන් ගන්නා අවස්ථාවේ දී සිට, දවස අවසානයේ දී ඒ රාජකාරි අවසන් කරන තාක් හමු වූ සියලු ම පුද්ගලයන් ගැනත්, දුන් සියලු ම නියෝග ගැනත් ලිඛිත වාර්තා පවත්වා ගෙන ගියේ ය. එසේ සටහනක් තබා නැත්තේ ස්ටාලින් (Stalin) හා හිට්ලර් (Hitler) අතර හමුවීමක් සිදුවූ දිනය ගැන පමණකැයි සමහර විචාරකයෝ පවසති.

## රාජකාරිය ගැන සටහන් පවත්වා ගත යුත්තේ ඇයි?

රාජකාරියක යෙදෙන ඉහළ ම විධායක නිලධාරියාගේ සිට පහළ ම නිලධාරියා දක්වා, කරන කටයුත්ත ප්‍රසිද්ධ කටයුත්තක් (Public duty) මිස, ඔහුගේ හෝ ඇයගේ පුද්ගලික කටයුත්තක් නොවේ. ඒ රාජකාරිය කෙරුණේ හෝ නොකෙරුණේ කෙසේද යන්න පිළිබඳ ව දැනගැනීමේ අයිතිය රාජ්‍යයටත් මහජනතාවටත් ඇති අයිතියකි. මෙය උදාහරණයකින් පැහැදිලි කළ හැකි ය. අප්‍රේල් 21 වෙනිදා සිද්ධිය සම්බන්ධයෙන් විශාල ආරක්ෂාව කඩ වීමක් සිදු වූයේ කෙසේ ද යන්න පිළිබඳ ව දැනගැනීමට ආණ්ඩුවටත් මහජනතාවටත් අයිතියක් ඇත. මෙහි ආණ්ඩුව යනුවෙන් සඳහන් කළේ ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය ය. මේ සැම අධිකාරියට ම වැදගත් රාජකාරි සිදු වූයේ කෙසේ ද යන්න අධීක්ෂණය කිරීමේ වගකීමක් ඇත. එසේ අධීක්ෂණය කළ හැක්කේ ඒ රාජකාරිය කිරීම පිළිබඳ ව ලිඛිත වාර්තා පැවතුණ හොත් පමණ ය. එසේ නැත්නම්, එකින් එකා කියන කථා මත පමණක් පදනම් වී ඒ අධීක්ෂණය කිරීමට සිදු වේ. යම් වරදක් සිදු වීමෙන් පසු, ඒ වරද කළ තැනැත්තන් තමන්ගේ ආත්මාරක්ෂාව සඳහා බොරු කියති. එය එසේ වීම ස්වාභාවික ය. මේ නිසා ඇත්ත කියන්නේ කවුද බොරු කියන්නේ කවුද යන්න නිශ්චිත ව දැනගැනීමට ක්‍රමයක් නැත.

මේ අනුව රාජකාරිය පිළිබඳ ව ලිඛිත සටහන් පවත්වා ගෙන යැම සත්‍යය හා අසත්‍යය වෙන් කර හඳුනා ගැනීමේ ඉතා වැදගත් කොටසකි. මහජන ස්වෛරීභාවයේ එක් වැදගත් වරප්‍රසාදයක් වන්නේ සත්‍යය දැන ගැනීමේ අයිතියයි. වෙනත් වචන වලින් කිවහොත් යම් රාජකාරියක් සිදු වූයේ

කෙසේ ද, කවුරු මොනවා කළා ද, කවුරු මොනවා කීවා ද, ඒ කීම් මත පිහිටා ගන්නා ලද්දේ කුමන තීරණ ද, ආදි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමේ දී අදාළ ලිඛිත සටහන් පරීක්ෂා කිරීම සත්‍යය දැනගැනීම සඳහා ඉමහත් රුකුලක් වේ. මෙපමණක් නොව නිලධාරීන් අතර පවත්වන නිල සාකච්ඡා පිළිබඳ ව දැනුම් දීම් කළ යුත්තේ ද ලිඛිත ව ය. සාකච්ඡාවට ගන්නා සියලු ම කරුණු (the Agenda) කුමක් ද යන්න ද සඳහන් කළ යුතු ය. ඒ කැඳවීම් ලිපි තුළින් සාකච්ඡා කිරීමට නියමිත ව තිබුණේ කුමක් ද යන්න ලෙහෙසියෙන් හඳුනාගත හැක. මේ ගැන උදාහරණයක් ගෙන බලමු. පෙබරවාරි 9 වෙනි දා පැවැත්වූයේ යැයි පැවසෙන ආරක්ෂක මණ්ඩල රැස්වීමේ දී සිදුවිය හැකි ප්‍රහාරයක් ගැන දැනුම් දුන් බව බුද්ධි අංශ ප්‍රධානියා අප්‍රේල් 21 වෙනි දා ප්‍රහාර සම්බන්ධයෙන් සොයා බලන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ඉදිරියේ ප්‍රකාශ කළේ ය.

එහෙත් ජනාධිපතිවරයා මාධ්‍යයට ප්‍රකාශ කර ඇත්තේ එවැනි දෙයක් ගැන තමන් නොදන්නා බව ය. ඉහත කී රැස්වීමට ජනාධිපතිවරයා ද සහභාගි වූ බව නිසැක ය. මෙහි දී ඇත්ත කියන්නේ කවුද යන්න ලෙහෙසියෙන් ම දැනගත හැකිව තිබුණේ අදාළ රැස්වීම පිළිබඳ ව ලිඛිත ව දැනුම් දී තිබුණා නම් ය. එක ම දෙයක් පිළිබඳ ව කථා දෙකක් කීමට ඇති ඉඩකඩ ඒ මගින් අහුරාදැමීමට අවස්ථාව තිබුණි.

ලිඛිත සටහන් තබා ගැනීමේ සම්ප්‍රදාය බොහෝ දුරට නැති ව ගියේ 1978 ව්‍යවස්ථාව ඇති වූවායින් පසු ව ය. ඒ මගින් හිතුවක්කාර ආත්මාර්ථකාමී පාලකයාට කිසි ම වාර්තාවක් පවත්වා නොගෙන තමන් කැමති ඕනෑම දෙයක් කිරීමට ඉඩකඩ සැලසිණි. එමෙන් ම සියලු ම වර්ගයේ දූෂණයට ද ඉඩකඩ සැලසිණි.

දූෂිතයන්ට විරුද්ධ ව නඩු පවරන්න යයි බලවත් උද්ඝෝෂණයක් පැවතුණ නමුත්, ඒ දූෂණ සිදුවීමට ඉඩකඩ සලසා දුන් රාජ්‍ය ව්‍යූහය පිළිබඳ ව එවැනි සාකච්ඡාවක් ඇති නොවී ය. රාජකාරි පිළිබඳ ව ලිඛිත සටහන් තබා ගැනීම අනිවාර්ය කරන නීතියක් සම්මත කර ගැනීමටවත් කිසිදු ප්‍රයත්නයක් හෝ විවාදයක් නොතිබුණි. සියල්ලෝ ම පවතින තත්ත්වය ප්‍රයෝජනයට ගෙන තමන්ගේ උවමනාව පමණක් ඉටුකරගැනීම කෙරෙහි යොමු වූහ.

ලංකාව බොරු කීමේ පාරාදීසයක් බවත්, කිසිදු දේශපාලනඥයෙකු ගැන විශ්වාසය තැබිය නොහැකි බවත් ආප්තෝපදේශයක් තරමට සමාජගත වූයේ මේ නිසා ය.

වාර්තාමය ලෝකය තුළ මෙතරම් පසුගාමීත්වයක ලංකාව ඇද වැටුණේ කෙසේ ද යන්න සාකච්ඡා කළ යුතු ප්‍රශ්නයකි.

කෙසේ වුවත් රාජකාරි කටයුතු පිළිබඳ ව සටහන් තබා ගැනීම අනිවාර්ය කරන නීතියක් වහා ම නීතිගත කෙරිය යුතු අතර ඒ නීති කඩකරන්නන්ට විරුද්ධ ව ගතයුතු පියවර ඒ නීතිය තුළ ම සටහන් කළ යුතු ය. එසේ කළ හොත්, ලංකාවේ රාජ්‍යකරණයේ විශාල වෙනසක් ද, මහජනතාවට විශාල ආරක්ෂාවක් සදා දීමේ මග ද පෑදෙනු ඇත. රාජ්‍යතන්ත්‍රය තුළ විනය හා සංයමය පවත්වා ගෙන යෑමට එවැනි නීතියක් හා ඒ නීතිය ක්‍රියාත්මක කිරීම ඉමහත් රුකුලක් වනු ඇත.

# 5.
# අපරාධය සහ ආරක්ෂාව පිළිබඳ සංකල්පය

ජනතා ස්වෛරීභාවය රැඳී පවතින්නේ පොදුවේ පිළිගත් නීති පද්ධතියක් හා ඒ නීති ක්‍රියාත්මක කිරීමට කැපවුණු සංස්ථා මගින් බවත්, ඒ සංස්ථා අතර යුක්තිය පසිඳලීමට සම්බන්ධ වූ සංස්ථා ප්‍රධාන තැනක් ගන්නා බවත් පසුගිය පරිච්ඡේදයේ දී අපි සාකච්ඡා කළෙමු.

නීති පද්ධතියක් තුළ ජනතාවගේ ආරක්ෂාව සපයා දීමේ ප්‍රධාන මූලෝපාය ලෙස ඈත අතීතයක සිට බොහෝ රටවල නිර්මාණය කරගත් ක්‍රමය වූයේ යම් ක්‍රියා අපරාධ ලෙස නම් කර ඒ ක්‍රියාවල නියැළුණ අයට දඬුවම් කිරීමේ ක්‍රමෝපායයි. ජීවිතයේ පැවැත්මට හා පොදුවේ ජන ජීවිතයේ පැවැත්මට අහිතකර වන්නා වූ ක්‍රියා අපරාධ වශයෙන් නම් කර ඒවා ඒ රාජ්‍යය තුළ කිරීමට තහනම් කළ ක්‍රියා ලෙස පොදු දැනීමක් සමාජය තුළ ඇති කිරීම මගින් ඒ ක්‍රියා වළක්වා ගත හැකි ය හෝ ඉතාමත් අඩු මට්ටමකින් තබා ගත හැකි ය යන පූර්ව නිගමනය අපරාධ සංකල්පයේ වර්ධනයට හේතු වූයේය.

පුද්ගලයාගේ පැවැත්මට මෙන් ම සමාජයේ පැවැත්මට ද බාධක වන්නා වූ ක්‍රියා ඉතිසාහයේ මුල් යුගයේ දී නම් කරන ලද්දේ සාදාචාරාත්මක නොවන ක්‍රියා ලෙස ය. එක් එක් රටවල ඉතිහාසය දෙස බලන විට ඒ සාමාජ තුළ පිළිගත්තා වූ මූලික සදාචාරාත්මක පැවතුම් හා ගතිගුණ පිළිබඳ සංකල්ප වර්ධනය වීම දැක ගත හැකි ය. ඈත අතීතයේ ජීවත් වූ මිනිසුන් හා ඊට පසු කාලවල දී ටිකෙන් ටික වර්ධනය වූ මිනිස් සමාජවල ප්‍රධාන ම වෙනස වූයේ මේ සදාචාරාත්මක සංකල්පවල වැඩිදියුණු

වීමයි. ලංකාව සම්බන්ධයෙන් ගත් කල බෞද්ධ ඉගැන්වීම් වලින් ඉතාමත් සරුසාර ලෙස වැඩුණු සාදාචාරාත්මක ගුණාංග පිළිබඳ ව පැහැදිලි ප්‍රකාශයක් සිදු වූවා මෙන් ම එය සමාජ ගත කිරීම සඳහා නිතර ම ඒවා පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම් විවිධ ආගමික ක්‍රියා තුළින් සිදු කෙරිණි. මේ අනුව මිනීමැරීම හෝ සත්ව ඝාතනය, කාමයේ අනිසි ලෙස හැසිරීම ආදි වශයෙන් මිනිසුන් නොකළ යුතු ගුණාංග සමාජ ගත කෙරිණි. එමෙන් ම මිනිසුන් විසින් කළ යුතු දේ ද සදාචාරාත්මක ව නිර්වචනය කෙරිණි. එකිනෙකාට උපකාර වීම, ආදරයෙන් කරුණාවෙන් සැලකීම, හිතවත්කම හා සහජීවනය ආදි වශයෙන් මිනිස් සමාජයේ සාමාජිකයන් එකිනෙකා කෙරෙහි කටයුතු කළ යුතු වන්නේ කෙසේද යන්න ද සාදාචාරාත්මක වශයෙන් නිර්වචනය කෙරිණි.

සදාචාරාත්මක වශයෙන් පිළිගැනුණු මූලික සංකල්ප ක්‍රියාවේ යෙදවීම සඳහා යොදා ගැනුණේ ඒ සම්ප්‍රදාය කඩන්නන්ට මරණයෙන් පසු සිදු වන දඬුවම් හා ඒ සම්ප්‍රදාය රකින්නන්ට මරණින් පසු එසේ කිරීම නිසා ලැබෙන යහපත් ප්‍රතිඵල පිළිබඳ සංකල්පය ද නිර්මාණය කිරීමෙනි.

මේ සදාචාරාත්මක සංකල්ප හා අපරාධ පිළිබඳ සංකල්ප අතර ඇති ප්‍රධාන වෙනස නම් අපරාධයක් කළ අයෙකුට මේ ජීවිතයේ දී ම දඬුවම් කිරීම ආණ්ඩුවට පැවරෙන වගකීමක් බවට ඇති වුණු පිළිගැනීමයි. එය හුදෙක් හොඳ නරක පිළිබඳ ව ආචාරධර්මශීලී සංකල්පයට වඩා ප්‍රායෝගික වූත් ක්‍රියාවට නැංවිය හැකි වූත් දෙයක් බවට පත් විය.

උදාහරණයක් වශයෙන් මිනීමැරීම සාදාචාරාත්මක නොවනවා පමණක් නොව එය බරපතළ අපරාධයක් ද වෙයි. එය බරපතළ අපරාධයක් බවට ප්‍රකාශයට පත් කර ඇත්තේ නීතිය මගිනි. එසේ නීතිය නිර්මාණය කිරීමේ දී ම ඒ වරද කරන තැනැත්තාට දිය යුතු දඬුවම ද ප්‍රකාශයට පත් කෙරෙයි. අතීත කාලයේ දී ජීවිතයක් නැති කරන්නාට තමන්ගේ ජීවිතයෙන් ඊට වන්දි ගෙවිය යුතු ය යන සංකල්පය පැවැතියේ ය. පසුකාලීන ව ලෝකයේ බොහෝ රටවල ඇත්තේ එවැනි වරදක් කරන කෙනෙකු ජීවිතාන්තය දක්වා සිරදඬුවමට යටත් කොට සමාජයෙන් ඈත් කොට තැබිය යුතු බව ය. ඔහු සමාජයට අහිතක් කිරීමට ඉඩ ඇති

බව ඔහුගේ අතීත ක්‍රියාවෙන් ඔප්පු කර ඇති නිසා ඔහු සමාජයේ නිදැල්ලේ හැසිරීම අනෙත් අයට විශාල අගතියක් ඇති කළ හැකි තත්ත්වයක් නිර්මාණය කළ හැකි නිසා ඔහු සමාජයෙන් ඈත් කොට හිරේ දැමීම වැනි දඬුවම් ඇති කෙරුණේ මේ අපරාධය කිරීම මගින් තමන් තමා ම අමාරුවේ දමා ගන්නා බව පිළිබඳ සංකල්පය සමාජගත කිරීම සඳහා ය.

අපරාධ පිළිබඳ සංකල්පයෙහි අඩංගු වන්නේ මිනිමැරීම වැනි අපරාධ පමණක් නොවේ. තමන් ජීවත්වන වාතාවරණය විනාශ කිරීම පිළිබඳ වැරදි ද, දේපළ හානි කිරීම පිළිබඳ වැරදි ද, එමෙන් ම සමස්ත ජනතාවගේ ආරක්ෂාවට පොදුවේ බලපාන ක්‍රියා පිළිබඳ ව ද අපරාධ නීතිය මගින් විධිවිධාන යොදා ඇත. උදාහරණයක් වශයෙන් තමන්ගේ කැමැත්තෙන් එකමුතුභාවයට පැමිණ රාජ්‍යයක් පිහිටුවා ගත් මිනිසුන්ට කරන විශාල හානියක් සේ ඒ රාජ්‍ය තන්ත්‍රය බිඳ දැමීමට කරන උත්සාහ සැලකේ. ඒ අනුව එයට ඉතා උපරිම දඬුවම් පැමිණවීම පිළිබඳ සංකල්පය ද වර්ධනය විය. එමෙන් ම ත්‍රස්තවාදී ක්‍රියා ආදිය පිළිබඳ ව ද අපරාධ නීතිය තුළ සංකල්ප ගොඩනැගී ඒවා පිළිබඳව ද නීති පැනවීම සිදු විය. ඒ ආකාරයෙන් සමාජයට අහිතකර වන්නා වූ ඕනෑම ක්‍රියාවක් අපරාධයක් සේ සැලකීමට නීති නිර්මාණය කිරීම ඕනෑම ස්වෛරී ජනතාවකට ඇති අයිතියකි. ඒ අයිතිය පෙර ප්‍රකාශ කළ ආකාරයට ඔවුන්ගේ නියෝජිතයන් මගින් පාර්ලිමේන්තුව වැනි සංස්ථා තුළින් කෙරෙයි.

අපරාධය පිළිබඳ ව ඇති ඒ අදහස් ඒවා ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා පවතින උපක්‍රම සමාජ ස්ථාවරත්වයේ මූලිකම අත්තිවාරම සේ පවතී. බරපතළ අපරාධ පිළිබඳ ව ලිහිල් සංකල්ප ඇති කිරීමෙන් සිදු වන්නේ සමාජ ස්ථාවරත්වයේ ඒ මූලික පදනමට පහර දීමයි. එසේ කිරීමේ ප්‍රතිඵලය වන්නේ ඒ සමාජය ටිකෙන් ටික අරාජික තත්ත්වයකට පත්වීමයි. එනම් පාලනයෙන් තොර සමාජයක් බවට පත් වීමත් ඒ නිසා සමාජය තුළ විශාල ප්‍රමාණයක ගැටීම් වැඩි වීමකුත් අවබෝධය අඩු වීමකුත් අධෛර්යය පැතිරී යෑමකුත් ආදිය සිදු වීමයි. බරපතළ අපරාධ පිළිබඳ නොසලකන්නා වූ සමාජය සංවිධානාත්මක භාවයෙන් ඈත් වන සමාජයක් බවට පත් වේ. සමාජ සංවිධානය බිඳී යන තරමට අරාජික තත්ත්වය වඩ වඩාත් ගැඹුරු වේ. මේ නිසා

අපරාධ පිළිබඳ ව ඉතා ගැඹුරු අවබෝධයක් හා ඒවා වළක්වා ගැනීම සඳහා අධිෂ්ඨානශීලී ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් මහජනයා විසින් පත් කර ගත් පාලකයන් මගින් ප්‍රකාශයට පත් විය යුතු ය. අපරාධ පිළිබඳ නොසැලකිලිමත්භාවයක් දක්වන පාලකයා ඒ සමාජයට විශාල වශයෙන් ගැටලු ඇති කරන හා විශාල විනාශයක් කරා ඒ සමාජය යොමු කරන පාලකයෙක් බවට පත් වෙයි. එවැන්නන් පාලනයට නුසුදුස්සෝ වෙති. පාලනයට සුදුසුකම් ලැබිය හැක්කේ අපරාධ පිළිබඳ අදහස සාධාරණ ආකාරයට නිර්මාණය කිරීමත්, එසේ සාධාරණ ව නිර්මාණය කරන ලද නීති ඔස්සේ අපරාධ වශයෙන් නීති ගත කළ ක්‍රියා කරන ඕනෑම කෙනෙකුට දඬුවම් කිරීමේ අධිෂ්ඨානය පවතින බව ක්‍රියාවෙන් පෙන්නුම් කිරීමත් තුළ ය.

මේ ක්‍රියාවට අත්‍යවශ්‍ය මිනිස් සම්පත්, ද්‍රව්‍යමය හා මූල්‍ය සම්පත් ගෙන දීම නීති නිර්මාණය කරන්නන්ගේ ම යුතුකම වේ. එනම් එය ආණ්ඩුවේ මූලික ම යුතුකමක් බවට පත් වේ. එවැනි සම්පත් දීම පාලනය කරන සෑම පාලකයෙකු ම තමන් සමාජය විශාල විනාශයකට ඇද දමන්නෙකු බවට පත් වේ.

මින් පෙර දැක්වූ සේ නීතිය ක්‍රියාත්මක කිරීම සිදුවන්නේ මූලික වශයෙන්ම යුක්තිය පසිඳලීමේ සංස්ථා තුළින් ය. අපරාධ නිරීක්ෂණය කිරීම ඒවා පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීම ඒවා පිළිබඳ ව සාක්ෂි එකතු කිරීම ආදිය පොලිසියට පැවරෙන අතර ඒවා මත පදනම් වී නඩු පැවරීම නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආණ්ඩුවේ අපරාධ නඩු දමන්නාගේ කාර්යය ඉටු කරන සංස්ථාවට පැවරෙනවා මෙන් ම, මේ සියල්ල ම නිසි ආකාරයෙන් පාලනය කරමින් නීතිය තුළ මේ සියලු ම ක්‍රියා ආරක්ෂා කිරීම අධිකරණයේ යුතුකම වේ. මේ යුතුකම ස්වාධීන ව කරගෙන යෑමේ හැකියාව ඒ සංස්ථා වලට තිබිය යුතු ය.

නීති නිර්මාණය කිරීමේ කාර්යභාරය මහජන නියෝජිතයන් අතින් කෙරෙන නමුත් නීතිය ක්‍රියාත්මක කරවා ගැනීමේ කටයුත්ත කෙරෙන්නේ ඒ සඳහා ගොඩනගා ඇති සංස්ථාවල සේවය කරන්නන් මගිනි. එසේ එය කරන්නන්ට එය ස්වාධීන ව කරගෙන යෑමට ඉඩ දීමටත් ඒ පිළිබඳ ව ඇඟිලි නොගැසීමටත් පවතින නීතිමය රාමුව නීතිය ආරක්ෂා කිරීමේ අත්‍යාවශ්‍ය ම රාමුවක් බවට පත් වේ.

නීතිය සියලු දෙනාට ම එක් ආකාරයකට ක්‍රියාත්මක කරනවා පමණක් නොව එවා ක්‍රියාත්මක කිරීම ද තාර්කික හා බුද්ධිමය ආකාරයෙන් නිසි ලෙස කිරීම ද එය කිසියම් පුද්ගලික හෝ හිතුවක්කාර ක්‍රියාමර්ග වලින් තොර ව කරගෙන යෑමට ඉඩ දීම ද සමාජයේ ස්ථාවරත්වයට අත්‍යවශ්‍ය කොන්දේසි බවට පත් වේ.

මෙසේ නියෝජිතයන් විසින් ගොඩනගන නීතිය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා ආණ්ඩුවේ සියලු ම සංස්ථා පවතී. මේ අනුව මේ සියලු ම සංස්ථාවල සේවයේ යෙදෙන කාගේත් පරම යුතුකම වන්නේ රටේ නීතියට අනුව කටයුතු කිරීමයි. එක් අතකින් රටේ නීතියට පරිබාහිර ව වැඩ කිරීම බලය අනිසි ලෙස පාවිච්චි කිරීමක් වන අතර ම අනෙක් අතින් නීතියට අනුව සිදු කළ යුතු යුතුකම් නොකර සිටීම ද අපරාධයක් සිදු කිරීමක් වෙයි. මේ අවස්ථා දෙකේ දී ම තමන්ගේ බලය අනිසි ලෙස පාවිච්චි කරන්නන්ට මෙන් ම, තමන්ගේ බලය පාවිච්චි කිරීම නොසලකා හරින්නන්ට ද නිසි දඬුවම් පැමිණවීම මගින් රාජ්‍ය සංස්ථාව නීතිය මත පදනම් වූ හා නීතිය ක්‍රියාත්මක කර ගැනීමේ ආයතන තුළ මුල් බැසගත් දෙයක් බවට පරිවර්තනය කර ගැනීම මහජන නියෝජිතයන්ගේ ම යුතුකම වේ. එය ඔවුන් නොකර හරින්නේ නම් ඔවුන් ද කරන්නේ විශාල පැහැර හැරීමක් වන අතර ඒ පැහැර හැරීම දඬුවම් ලැබිය යුතු වරදක් බවට පත් වේ. ඊට හේතුව නම් ඒ පැහැර හැරීම මගින් ජනතාවගේ ආරක්ෂාවට විශාල ගැටලු ඇති වීමත් ඒ මගින් ආණ්ඩුවක පැවැත්ම සාධාරණීකරණය කරන එක ම කොන්දේසිය එනම්, ජනතාවගේ ආරක්ෂාව සලසා දීම අහිමි කර දමන නිසාත් ය.

නීතිය ක්‍රියාත්මක කර ගැනීම ආණ්ඩුවක සියලු ම සංස්ථා වලින් සිදු විය යුතු අතර ඒ අතරින් විශේෂයෙන් ම යුක්තිය පසිඳලීමේ කාර්යයේ නියුතු ව සිටින සංස්ථා මේ කාර්යය ඉටු කිරීම සඳහා විශේෂඥ සේවා කරන කණ්ඩායම් බවට පත් වේ. එනම් අපරාධ පිළිබඳ ව නිරන්තරයෙන් ම පරීක්ෂා කරන හා ඒවා වළක්වා ගැනීම සඳහා ගත යුතු පියවර නිරන්තරයෙන් ම ගන්නා වූ සිවිල් පොලිස් ක්‍රමයක් ද, එසේ අපරාධ පිළිබඳ ව එකතු කර ගන්නා වූ තොරතුරු හා සාක්ෂි මත අපරාධ කරන්නන්ට නඩු පැවරීමේ කාර්යය කරන නීතිපති දෙපාර්තමේන්තුව වැනි

සංස්ථාවක ක්‍රියාකාරී පැවැත්ම ද, ඒ පදනම මත ඉහළින් සිට මේ සියල්ල නීතියට අනුව පාලනය කර ගැනීමේ යුතුකම ඇති අධිකරණ පද්ධතියක් ද, මහජන ආරක්ෂාව ඇති කිරීම සඳහා පවතින්නා වූ ප්‍රබල ම සාධක වේ. යම් රටක අනාරක්ෂිත භාවයක් පිළිබඳ ව ජනතාව තුළ දැඩි මතවාදයක් ඇති වී තිබේ නම්, ඇත්තෙන් ම සෙවිය යුතු වන්නේ පාර්ලිමේන්තුව විසින් නීති සෑදීම හා ඒවා ක්‍රියාත්මක කර ගැනීමට ගත යුතු පියවර ගෙන ඇත්ද යන්නත්, ඒ අනුව විශේෂයෙන් ම යුක්තිය පසිඳලීමේ සංස්ථා ඔවුන්ගේ රාජකාරි නිසිලෙස ඉටු කර තිබේ ද යන්නත් සොයා බැලීමයි. එසේ සොයා බලන විට අනාරක්ෂිත භාවය ඇති වූයේ කෙසේද යන්න ඉතා පහසුවෙන් හඳුනාගත හැකි ය. එසේ හඳුනාගැනීම තුළින් ඒ තත්ත්වය වළක්වා ගැනීම සඳහා පියවර ද ගෙන නැවත වරක් ජනතා ආරක්ෂාව ගොඩනැගිය හැකි ය.

හමුදාව අතින් සිදුවන්නේ විශාල ගැටලු ඇති වූ අවස්ථා වල ඔවුන් කැඳවූ විට ඒ ගැටලුව නිරාකරණය කර දීම ය. එදිනෙදා ස්වභාවික සමාජයේ පැවැත්ම සිදු වන්නේ හමුදා මැදිහත්වීම් තුළින් නොවේ. එය සිදුවන්නේ සිවිල් පොලිස් පරීක්ෂණ ක්‍රමය තුළත්, නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආණ්ඩුව වෙනුවෙන් නඩු පවරන්නාගේ කාර්යය කරන සංස්ථාව තුළත් හා අධිකරණය තුළත් ය. සාමාන්‍ය කාලයක් තුළ නීතිය ක්‍රියාත්මක වන්නේ හා කළ යුතු වන්නේ ඒ ආකාරයෙනි. විටින් විට ගැඹුරු අරගල මතු වූ විට හමුදාව ඊට මැදිහත් වී යථා තත්ත්වයක් ඇති කිරීමට පදනම සදා දෙන නමුත්, එසේ ඒ යථා තත්ත්වය හදා ගැනීම කෙරෙනවා ද නැද්ද යන්න තීන්දු කෙරෙන සාධක වන්නේ ඉහත කී ආකාරයට යුක්තිය පසිඳලීමේ සංස්ථා තුළිනි.

ලංකාවේ යුක්තිය පසිඳලීමේ සංස්ථාවල ඇති වී තිබුණු විශාල පසුබෑම තුළින් වර්තමානයේ සිදු වන අනාරක්ෂිත භාවය සිදු වී ඇති බව ඉතා පැහැදිලි ව පෙනේ. යම් කණ්ඩායමක් විසින් විශාල වශයෙන් ජනතාව ගැවසෙන ස්ථාන වල බෝම්බ පුපුරවා හැරීමටත් ඒ මාර්ගයෙන් ජීවිත හානි කිරීමටත් හා දේපළ හානි කිරීමටත් මෙන් ම ඒ සඳහා නීති විරෝධී ආකාර වලින් මුදල් ගෙන්වා ගැනීමටත් , ආයුධ ගෙන්වා ගැනීමටත් ආදි ක්‍රියාවලියක් අප්‍රේල් 21 සිද්ධියට පෙර අවුරුදු ගණනාවක් තිස්සේ සිදු වෙමින්

තිබූ බව දැන් හෙළිදරව් වෙමින් පවතී. ඒ අපරාධකාරී ක්‍රියාදාමය තුළ ආයුධ පාවිච්චියෙන් කෙරෙන විනාශයක් පමණක් නොව ස්ත්‍රීන් වඳභාවයට පත්කිරීම ආදිය මගින් කරන ජන ඝාතනයක තොරතුරු ද දැන් නිරන්තරයෙන් ම සමාජ ජාලා ඔස්සේ සාකච්ඡා වෙමින් පවතී.

මෙවැනි තත්ත්වයක් ඇති වීමට හේතුව වන්නේ පාලකයන් විසින් යුක්තිය පසිඳලීමේ සංස්ථා නිසි ලෙස පවත්වා ගෙන යෑමට ගත යුතු පියවර ගෙන නොමැති නිසා ය. එසේ ගෙන තිබුණා නම් මේ වන විට මේ සිදුවීමට බොහෝ කාලයකට පෙර ඒ සඳහා යොමු වූවන් පිළිබඳ අවබෝධයකින් මෙය මුලිනුපුටා දැමීමේ හැකියාව රාජ්‍යයට පැවැතියේ ය. දැනට සාර්ථක ව මේ කාර්යය කරන ආණ්ඩුව දෙස බලන විට පෙනී යන්නේ ඔවුන් නිරන්තරයෙන් ම ආරක්ෂාව පිළිබඳ ගත යුතු නෛතික පියවර නිරන්තරයෙන් ම ගැනීම සිදු වන නිසා සමාජය තුළත් ඔවුන්ගේ සංස්ථා තුළත් කිසියම් ප්‍රාණ ජීවයක් පවතින බව ය. යුක්තිය පසිඳලීමේ සංස්ථා තුළින් ප්‍රාණ ජීවය අහෝසි වී ගියහොත් හෝ අඩපණ වී ගියහොත් එහි ප්‍රතිඵලය වන්නේ රාජ්‍යයකට තමාගේ මහජන ආරක්ෂාව සලසා දීමට ඇති පරම යුතුකම පැහැර හැරීමට මග පෑදීමයි.

මෙවැනි තත්ත්වයක් ඇති වූයේ කෙසේ ද යන්න සොයා බැලීමේ දී හුදෙක් යම් තොරතුරක් ලැබී ඒ ගැන සාකච්ඡා නොවූවා යන්න පමණකින් සෑහීමකට පත් විය නොහැකි ය. ඒ තොරතුරු ලබා ගැනීම මෙන් ම ලබා ගත් වහාම ඒවාට අනුව ගත යුතු සාකච්ඡා හා ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රවණතාව අඩපණ වී ගොස් ඇත්තේ හෝ නැති වී ඇත්තේ කෙසේ ද යන්න අත්‍යවශ්‍යයෙන් ම කළ යුතු කාර්යයක් බවට පත් වේ. මේ පිළිබඳ ව සොයා බැලීමේදී ඇති දත්ත විශාල වශයෙන් ලංකාව පුරා පවතී. දැනට දශක ගණනාවක් තිස්සේ ම යම් බුද්ධිමතුන් හා යම් ව්‍යාපාර මගින් ආණ්ඩුවේ යුතුකම් පැහැර හැරීමේ ප්‍රශ්නය නිරන්තරයෙන් සාකච්ඡා කර තිබීම මෙන් ම මේ පිළිබඳ ව විශාල ප්‍රමාණයක ලේඛන ද ලියැවී ඇත. එහෙත් මේ සාකච්ඡා හෝ ලියැවිලි පරීක්ෂා කොට ඒවායින් ගතයුතු පාඩම් නිසි ලෙස ගෙන ඒවා ක්‍රියාත්මක කරවා ගැනීම පාලකයන්ට නොහැකි වීම වර්තමානයේ උද්ගත වී ඇති අනාරක්ෂිත භාවයට හේතු වී ඇත.

මෙහි දී නැවතත් හැරිය යුතු වන්නේ ජනතා ස්වෛරීභාවය පිළිබඳ සංකල්පයටයි. යම් ආකාරයකින් පාලකයන් හා ඔවුන් විසින් ගෙන යන සංස්ථා හා ඔවුන්ගේ යුතුකම් ඉටු කිරීම පැහැර හැරීමක් පවතින්නේ නම් එය ජනතාවගේ ස්වෛරීභාවය මත පදනම් වුණු දේශපාලන ක්‍රමයක ඇති වී ඇති විශාල අර්බුදයකි. මෙහි දී නැවත වරක් මේ තත්ත්වය නිවැරදි කර ගැනීමේ යුතුකම පවතින්නේත් තමන්ගේ ස්වෛරීභාවය නැවත ප්‍රකාශයට පත් කර ගත හැකි ජනතාවකට පමණි. ජනතාව වැඩි දැනුවත්කමකින් යුතුව, එමෙන් ම ආරක්ෂාව සලසා ගත හැක්කේ කෙසේ ද යන්න පිලිබඳ ඇති රාජ්‍ය පිළිබඳ ඇති සම්ප්‍රදාය පිළිබඳ දැනුවත් කමකින් යුතුව මේ ප්‍රශ්නයට මැදිහත් වීම තුළින් දැනට පැන නැගී ඇති අනාරක්ෂිත භාවය පිළිබඳ ගැටලුව, වඩා ස්ථාවර සමාජයක් ගොඩනගා ගැනීම කෙරෙහි හා වඩා වගකීමෙන් යුතු පාලකයන් මෙන් ම යුක්තිය පසිඳලීමේ සංස්ථා හා වෙනත් රාජ්‍ය හා පුද්ගලික සංස්ථා ගොඩනගා ගැනීම කෙරෙහි යොමු කළ හැකි ය.

මේ සියල්ලට ම පදනම සැලසුම් කරන්නේ නීතිය මත පාලනය යන මූලික සිද්ධාන්තය තුළිනි. නීතිය මත පාලනය යන සිද්ධාන්තයෙන් මූලික ව ම කියැවෙන්නේ යම් ප්‍රසිද්ධ සංස්ථාවක් හෝ පුද්ගලික සංස්ථාවක් නීතිය ක්‍රියාත්මක කර ගැනීමේ යුතුකම ඉෂ්ට කරන අවස්ථාවේ දී ඔහු නීතිය මත පමණක් ම පදනම් වී ඒ කාර්යය කෙරිය යුතු බව ය. එසේ කිරීමේ දී තමන් සතු යුතුකම ඉටු කිරීමේ වගකීම ඔවුන්ට පැවරෙනවා මෙන් ම ඒ යුතුකම පැහැර හැරීම කරන්නන් ද කරන්නේ බලය අනිසි ලෙස පාවිච්චි කිරීම මගහැරීමක් වන නිසා ඒවා අපරාධ සේ සැලකිය යුතු බව ය.

වගකීමක් ඇති සමාජයක් වනාහි නීතිය පිළිබඳ වුවමනාවක් පවතින සමාජයකි. ලාංකික සමාජය එවැනි සමාජයක් බවට තරමක පරිවර්තනයක් යටත් විජිත කාලයන් තුළ දී සිදු වූ නමුත් එය අංගසම්පූර්ණ එකක් වූයේ නැත. යටත් විජිත කාලයක එසේ වීමටත් බැරි ය. ඉන්පසු කාලය තුළ දී මේ රාජ්‍ය පිළිබඳ ව සංස්ථා ගොඩනගා ගැනීම ආණ්ඩුවේ මූලික ම යුතුකම වශයෙන් පැවැතියේ ය. එහෙත් 1948 සිට මේ දක්වා පැවැති එක ම ආණ්ඩුවක්වත්, ආණ්ඩුවක් වශයෙන් තමන් සතු වන්නා වූ මූලික

යුතුකම හෙවත් ජනතා ආරක්ෂාව සඳහා ඇති සංස්ථා ගොඩනගා ගැනීම මෙන් ම ඒ සංස්ථා පවත්වා ගෙන යෑමට අවශ්‍ය සම්පත් ගෙන දීම ආදිය මගින් ස්වාධීන ව මේ කටයුතු කර ගෙන යෑමට හැකි බල සංස්ථා කෙරෙහි උනන්දුවක් දැක්වූයේ නැත. විශේෂයෙන් ම පසුගිය දශකයන් වල දී මේ උනන්දුව වඩ වඩාත් නැති වී ගිය අතර වගකීම් විරහිත පාලකයන් ද, ඉතා විශාල වශයෙන් දූෂණයේ යෙදෙන්නන් ද එමෙන් ම වෙනත් රාජ්‍ය සංස්ථා තුළට ඒ දූෂණය පැතිරී යෑමට ඉඩ සැලසූ අය ද බිහි වූයේ ය. එහි ප්‍රතිඵලය අප්‍රේල් 21 වනදා දැක ගන්නට ලැබුණු අතර මේ තත්ත්වය ඉක්මනින් වෙනස් කර ගැනීම සඳහා ජනතා මැදිහත් වීමක් සිදු නොවන්නේ නම් අනාගතයේ දී මෙය නැවත නැවතත් විවිධාකරයෙන් පැන නැගීමට හොඳට ම ඉඩකඩ ඇත. 1971 ඇති වූ කැරැල්ල මගින් එක් ජන කණ්ඩායමක් අනෙකාගේ ආරක්ෂාව පිළිබඳ ව ගැටලු ඇති කළා මෙන් ම, පසු ව එල්ටීටීඊ කණ්ඩායම සමග ගොනු වූ කණ්ඩායම් මගින් නැවත වරක් පොදුවේ රට තුළ පැවැතිය යුතු ආරක්ෂාව පිළිබඳ සංකල්පය බිඳ දැමිණි. දැන් මුහුණ දෙන්නේ තුන් වන අවස්ථාවකට ය. එනම් මුස්ලිම් අන්තවාදී ත්‍රස්තවාදී කණ්ඩායම් මගින් අප්‍රේල් 21 කළා මෙන් සිදු කිරීමට සැලසුම් කර ඇති විවිධ ක්‍රියා ය. මේවා තාවකාලික ව නතර කර ගැනීමට හැකි වූවත් එයින් රටේ ආරක්ෂාව ස්ථාවර වී ඇති බවක් නොකියැවේ. ඒ ආරක්ෂාව ඇති කර ගැනීමට නම් නීති සදා ගැනීම මෙන් ම නීති ක්‍රියාත්මක කරවා ගැනීමටත් එහි දී මුල් වන යුක්තිය පසිඳලීමේ සංස්ථා ප්‍රාණ ජීවයක් ඇති ව වැඩ කරන ස්වාධීන සංස්ථා බවට හරවා ගැනීමත් අත්‍යාවශ්‍ය වේ. මේ හැර ජනතා ආරක්ෂාව පිළිබඳ වෙනත් විධික්‍රමයක් ඇත්තේ නැත.

# 6.
# පාලකයන් පිළිබඳ ව ඇති විශ්වාසය තුළින් රාජ්‍යතන්ත්‍රයක් ගොඩනැගිය හැකිද?

ලෝකයේ ඇති වූ පළමු වන ලිඛිත ව්‍යවස්ථාව ලෙස සැලකෙන ඇමෙරිකානු ව්‍යවස්ථාව නිර්මාණය කිරීමේ දී ඇතිවූ එක් දාර්ශනික ප්‍රශ්නයක් නම් පාලකයන් පිළිබඳ ව ඇති විශ්වාසය මත ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගිය හැකි ද යන්නයි. මේ පිළිබඳ ව පළල් විවාදයක් ඇතිවූ අතර ඒ විවාදයේ නිගමන ෆෙඩරලිස්ට් පේපස් (The Federalist papers) යන නමින් පසු ව ප්‍රසිද්ධියට පත් ලිපි පෙළක් මගින් විස්තර කොට ඇත.

ඉහත සඳහන් ලිපි මුලින් පළ කළේ එකල පැවැති පුවත්පත් මගිනි. සතියකට ලිපි දෙක තුනක් පළ වූ බවත්, ඒ ලිපි වලින් සාකච්ඡා වූයේ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පැනනැගී තිබූ ප්‍රශ්න සම්බන්ධයෙන් බවත් ඇමරිකානු ව්‍යවස්ථාව පිළිබඳ ව විශේෂඥයෝ ප්‍රකාශයට පත් කොට ඇත.

මේ ලිපි ලිවීමට හේතු වූයේ යෝජිත ඇමෙරිකානු ව්‍යවස්ථාව පිළිබඳ ව විරුද්ධවාදීන්ගේ විශාල මතවාදයක් ගොඩනැගී තිබීම ය. මේ විරුද්ධ මතවලට පිළිතුරු වශයෙන් ඉහත සඳහන් ෆෙඩරලිස්ට් පේපස් (The Federalist papers) නමින් පසු ව ප්‍රසිද්ධියට පත් වූ ලිපි පළ වුණි. ඒවා පුවත්පත් වල පළ කිරීමේ අදහස වූයේ ව්‍යවස්ථාවට පසුබිම සැලැස්වූ දේශපාලන හා නෛතික මතවාද පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම ය.

මේ ලිපිවල කතුවරුන් වූයේ ජේම්ස් මැඩිසන්, ඇලෙක්ර්සැන්ඩර් හැමිල්ටන් හා ජෝන් ජේ යන ප්‍රසිද්ධ

නායකයන් ය. ඔවුන් තම ලිපි පළ කරන ලද්දේ පුබ්ලියස් නම් අරුඬ නමිනි.

මේ ලිපි වලට අනුව එකල සාකච්ඡාවූ එක් කරුණක් වූයේ පාලකයන් ගැන පවතින විශ්වාසය මත රාජ්‍යතන්ත්‍රයක් ගොඩනැගිය හැකි ද? යන්න ය. ඇමෙරිකානු ව්‍යවස්ථාව ගොඩනැගීමේ දී එක් පොදු අදහසක් වූයේ එසේ නොකළ හැකි හා නොකළ යුතු බව ය. එදා තරයේ එලබගත් මතය වූයේ පාලකයන් පිළිබඳ ව ඇති අවිශ්වාසය මත ව්‍යවස්ථා නීතිය ගොඩනැගිය යුතු බව ය.

ෆෙඩරලිස්ට් පේපස් (The Federalist papers) වල අන්තර්ගත එක් සුප්‍රසිධියට පත් කියමනක් වුයේ, සියලු දෙනා දේව දූතයන් නම් ව්‍යවස්ථා නීතියක් අනවශ්‍ය බව ය.

මෙයින් කියවෙන අදහස ඉතා පැහැදිලි ය. මනුෂ්‍යයෝ දෙවදූතයෝ නොවෙති. දෙවදූතයෝ නම් කිසියම් ම හෝ වරදක් නොකරන අය ය. එහෙත් සියලු ම මනුෂ්‍යයෝ වැරදි අදහස් ද වැරදි අභිමතාර්ථ ද වැරදි ක්‍රියා ද, වැරදි ප්‍රකශ ද කරන්නෝ වෙති. ආත්මාථකාමී හා තමන්ගේ ම උවමනා පමණක් මත කටයුතු කිරීම පොදුවේ මනුෂ්‍යයන් අතර ඇති ගති ලක්ෂණයකි.

එමෙන් ම රාජ්‍ය බලය වනාහි එක පුද්ගලයෙකුට දරා සිටිය නොහැකි ප්‍රමාණයක බලපැවැත්මක් ඇතිකරයි. ඒ නිසා බලය ලැබීමත් සමග ම එක්තරා උමතුවක් එසේ බලය දරන්නන් අතර ඇති වේ. මෙය මනුෂ්‍යයාගේ ස්වභාවයෙන් ම ඇතිවන්නකි.

මේ නිසා රාජ්‍ය බලය දරන්නන් දැඩි පාලනයකට යටත් කළ යුතු ය. පාලකයන් පාලනය කිරීම සඳහා ප්‍රධාන මූලෝපාය වන්නේ ඒ කරුණ සඳහා ම නීති සදා ගැනීම හා ඒ නීති අකුරට ම ක්‍රියාත්මක කිරීම ය.

රටක සියලු ම ජනතාව මෙන් ම පාලකයා ද නීතියට යටත් කළ යුතු ය. නීතියෙන් පිට ක්‍රියා කළ හැකි පාලකයෙකු ඇති කිරීම දේශපාලන වශයෙන් උමතු තත්ත්වයක් ඇති කරයි.

නීතියට ඉහළින් සිටගන්නා පාලකයා සියලු ම නීති බිඳ දමන්නෙකු බවට පත් වේ. දැඩි පාලනයකට යටත් නොකරන ලද පාලකයෝ ඉබේ ම හිතුවක්කාර පාලකයෝ (Tyrannical) බවට පත් වෙති.

පාලකයන් පාලනය කිරීමට නීති සාදා ගැනීම යන සංකල්පය විවිධ ආකාරවලින් ප්‍රකාශයට පත්කොට ඇත,

පාලකයා යදම්වලින් බැඳ තිබිය යුතු ය, යන්න එක් කියමනකි. මෙය සාමාන්‍යයෙන් ජනව්‍යවහාරයේ කියවෙන, යකුන් බැඳ තැබිය යුතු ය, හපන බල්ලන් බැඳ තැබිය යුතු ය, සත්තු වත්තක සිටින සිංහයන්, කොටින් වැනි භයානක සතුන් බලවත් යකඩ කූඩුවල දමා තැබිය යුතු ය, හීළෑ අලියකු වුවත් ඔහුගේ කකුල් යදම් දමා තබා ගත යුතු ය ආදි කියමන් වලින්ද ප්‍රකාශයට පත් වේ.

මෙසේ බැඳ තිබීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාමය උපක්‍රම වන්නේ බලය සීමා කිරීම, තුලනය කිරීම (Cheques and balances) හා බලය බෙදීම (Separation of powers) යන මූලධර්මයි. බලය පාවිච්චි වන්නේ කෙසේ ද යන්න සොයා බැලීමට නෛතික වශයෙන් බලය ඇති සංස්ථා පැවැතිය යුතු ය. බලය තුලනය වීමට නම් සමස්ත බලය එක් අයකු තුළ හෝ එක් සංස්ථාවක් තුළ පැවැතීමට ඉඩ නොතැබිය යුතු ය. බලය විවිධ සංස්ථා තුළට පැතිරී තිබිය යුතු ය. මොන්ටෙස්කිව් (Montesquieu) බලය බෙදීම පිළිබඳ න්‍යාය, එනම් රාජ්‍ය බලය ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යන වෙන් වෙන් රාජ්‍ය ආයතන තුළින්, වෙන් වෙන්ව ක්‍රියා කළ යුතු ය යන න්‍යාය ගොඩ නගන ලද්දේ එක ම තැනක සියලු ම බලය ඒකරාශී වීම වළක්වාලීම සඳහාය. මොන්ටෙස්කිව් (Montesquieu) ගේ ඒ දර්ශනය, ජෝන් ලොක් (John Locke ) හා ජීන් ජාක් රූසෝව් (Jean-Jacques Rousseau) යන දේශපාලන, දාර්ශනිකයන්ගේ අදහස් මත ගොඩනැගිණ. එමෙන් ම රෝම අධිරාජ්‍යය තුළ පාලනය සිදුවූ ආකාරය ගැන ඔහු හොඳින් හදාරා තිබුණි. රෝම පාලන ක්‍රමය තුළ ස්වාධීන වූ නීති නිර්මාණය, විධායකය, අධිකරණය යන සංස්ථා පැවැතිණි. මොන්ටෙස්කිව් (Montesquieu) විසින් ප්‍රකාශයට පත් බලය බෙදීමේ දර්ශනවාදය ඇමරිකානු ව්‍යවස්ථාව තුළට බලවත් සේ ඇතුළු කෙරිණි. පසු කාලීන ව මේ න්‍යාය ලෝකය පුරා ම ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩු තුළට පැතිරුණි. එය අද ව්‍යවස්ථා නීතිය තුළ පැලපදියම් වූ බලවත් දර්ශන වාදයකි.

බලය මේ ආකාරයෙන් පාලනය නොවන ස්ථාන වල පවතින්නේ හිතුවක්කාර පාලකයෙකුගේ උමතු දේශපාලන මූලෝපාය හා ක්‍රියාදාම ය. ඒ ක්‍රියාදාම තුළින් අනිවාර්යයෙන් ම අරාජික තත්ත්වයක් ඇති වේ. සංවිධානාත්මක රාජ්‍යතන්ත්‍රය

බිඳවැටේ. ලංකාව තුළ 1972 හා 1978 ව්‍යවස්ථා මගින් සිදු කෙරුණේ කිසිදු නෛතික පාලනයකට යටත් නැති පාලකයකු ඇති කිරීම ය. විධායක ජනාධිපති යනුවෙන් නම් කරන ලද ඒ පාලකයා එතෙක් පැවැති රාජ්‍යතන්ත්‍රය බිඳ දැම්මේ ය. ආටෝපය සඳහා පමණක් ප්‍රජාත්‍රන්ත්‍රවාදී වාග් මාලාවක් පාවිච්චි කෙරිණි. එහෙත් පාලනයේ සැබෑ රූපය වූයේ හිතුවක්කාරකම හා එක් තැනක සියලු බලය රඳවා ගැනීම ය.

පසුගිය කාලය තුළ ඇතිවූ සියලු ම ප්‍රචණ්ඩත්වයට මග පෑදූ ප්‍රධාන මූලාශ්‍රය නම්, පාලකයා පාලනය කරන නෛතික විධික්‍රම බැහැර කර දැමීම ය.

මේ නිසා විකාර රූපී පාලන තන්ත්‍රයක් රට තුළ බිහි විය. විකාර රූපී පාලකයෝ බිහි වූහ. රටේ දේශපාලනය විහිළු සහගත ස්වභාවයක් ගත්තේ ය. ආණ්ඩුවේ නිලධාරීන් අණ දීමේ ක්‍රියාවලියට යටත් නොවූ තත්ත්වයක් ඇති විය. ඔව්හු බොහෝ සේ අසරණ තත්වයකට පත් වූහ. තවත් සමහරු නොපැකිල දූෂණයේ නියැළුණහ.

ජනතාව තුළ රාජ්‍යත්‍රන්ත්‍රය  ගැන අවිශ්වාසයක් පැතිර ගියේ ය. මෙසේ පැවැති අරාජික තත්වයෙන් ලාභ ලබා ගැනීමට හැකි වූයේ විවිධාකාර අපරාධ කාරයන්ට පමණ ය. රට කුඩුකාරයන්ගේ තිප්පොලක් ද, ත්‍රස්තවාදීන්ගේ සාරභූමියක් ද බවට පත් විය. මේ තත්ත්වයෙන් ගොඩ ආ හැක්කේ පාලකයන් පිළිබඳ අවිශ්වාසය මත ගොඩනැගෙන රාජ්‍යතන්ත්‍රයකට පමණ ය.

2015 ජනවාරි ජනතා ජයග්‍රහණය විකෘති වූයේ අලුත් පාලකයන් පිළිබඳ ව විශ්වාසය තිබීම නිසා ය. 2015 ජනවාරි ජනතා ජයග්‍රහණය ඉතා සුවිශේෂ වූ ඓතිහාසික සිදුවීමක් විය. ඒ තුළ කැපී පෙණුනේ ඉහළ මට්ටමක ජනතා විඥානයක්  හා මැදිහත් වීමකි. ඒ තුළින් බලවත් හිතුවක්කාර පාලකයෙක්  හා දැඩි මර්දන යාන්ත්‍රණයක් පරාජයට පත් විය. ඒ ජයග්‍රහණයට ප්‍රධාන සාධකයක් වූයේ සිවිල් සංවිධානවල ක්‍රියාකාරිත්වයයි. ඒ ක්‍රියාකාරිත්වයේ ප්‍රධාන මග පෙන්වන්නා වූයේ මාදුළුවාවේ සෝභිත හිමියන් ය.

එහෙත් ඒ ව්‍යාපාරයේ ප්‍රධානතම අඩුපාඩුව වූයේ ජනාධිපති හා අගමැති බවට පත් වූ පාලකයන් පිළිබඳ ව තබන ලද විශ්වාසයයි. පාලයකන් පිළිබඳ ව ඇති අවිශ්වාසය තුළින්

රාජ්‍යතන්ත්‍රයේ ප්‍රතිසංස්කරණ ඇති කිරීමේ දර්ශනය ප්‍රබල ව නොපැවැතිණි. යහපාලනය ඇතිකිරීම හා විධායක ජනාධිපති ක්‍රමය නැති කිරීම වැනි සටන්පාඨ වලට මුල් තැනක් ලැබුණු අතර හිතුවක්කාර පාලනයක් මැඩපවත්වන මූලෝපායක් නොපැවැතිණි. පාලකයා පාලනය කරගන්නේ කෙසේද යන්න ගැන බරපතළ සංවාදයක් ඇති නොවී ය. නව ආණ්ඩුව පත්වීමෙන් පසු සිවිල් සමාජයේ නායකයන් පාලකයන්ට කන්නලවු කරමින් මැතිවරණ පොරොන්දු ඉටු කරන ලෙස ඉල්ලමින් ඒ පාලකයන් පසු පස්සේ ම ගියා මිස හිතුවක්කාර පාලනයක් බැඳ තැබීමේ දර්ශනය අමතක කර දැමූහ. හෙන්ඩුවක් ගෙන නව පාලකයින්ට ඒ හෙන්ඩුව නිතර පෙන්නුම් කරන තත්ත්වයක් වෙනුවට පාලකයන්ට යාතිකා කිරීමේ පුරුද්දක් ඇති විය.

1978 සිට පවතින හිතුවක්කාර පාලනයේ බිඳීමක් සිදු වූයේ නැත. 2015 පසුත් ඒ හිතුවක්කාර පාලනය ම තවදුරටත් අඛණ්ඩ ව පවත්වාගෙන යෑමට බාධා පැනවීමක් සිදු නොවී ය. අකාර්යක්ෂම හා අදූරදර්ශී හිතුවක්කාර පාලනය තව දුරටත් ඉදිරියට යමින් රට ගමන් කළ ඛේදනීය තත්ත්වයට අනුබල දීමක් සිදු විය.

අද පවතින්නේ මේ අඛණ්ඩ හිතුවක්කාර පාලනයේ ප්‍රතිඵල ය.

# 7.
# ජනතා ආණ්ඩුවක් යනු අර්ථ විරහිත වචන මාලාවකි

1956 මැතිවරණයත්, 1970 බලයට පත් හවුල් ආණ්ඩුව පිළිබඳ මැතිවරණයත්, 2015 ජනවාරි මාසයේදී පත් වූ ආණ්ඩුවට සම්බන්ධ මැතිවරණයත් හා තවත් සිදුවීම් වලත් ගැබ් වී ඇති එක් අදහසක් නම් ජනතා ආණ්ඩු කියා යමක් පැවතිය හැකි ද යන්නයි. ඉහත සඳහන් තුන් අවස්ථාවේදී ම එදා පත් වූ ආණ්ඩු සැලකුණේ ජනතා ආණ්ඩු වශයෙනි. එහෙත් කාලයකට පසු ඒවා සැලකෙන්නේ ජනතාවගේ අභිමතාර්ථ ඉටු කළ ආණ්ඩු වශයෙන් නොව පාලකයන්ගේ වුවමනා ඉටු කර ගත්, විශේෂයෙන් ම පාලකයන්ගේ පුද්ගලික වුවමනා සාක්ෂාත් කර ගත් ආණ්ඩු ලෙසය.

අපට වැදගත් වන්නේ 'ජනතා ආණ්ඩු' යන සංකල්පය යටතේ එන අදහස දේශපාලන දර්ශනයක් යටතේ පිළිගත හැකි එකක් ද යන්න ය. පැහැදිලි ව ම 'ජනතා ආණ්ඩු' යන්න එකිනෙකට හාත්පසින් වෙනස් වූ වචන දෙකක් පටලවා ගැනීමක් බව කිව හැකි ය.

මෙය ලංකාවේ පමණක් සිදු වූවක් නොව තවත් බොහෝ රටවල සිදු වූවකි. ප්‍රංශ විප්ලවය ජනතා ආණ්ඩුවක් ඇති කළා ය යන අදහස මුලින් පැවතුණි. එහෙත්, වැඩි කලක් නොගොස් ඒ ආණ්ඩුව තුළින් ඉතා භයානක නායකයන් ඇති වූ ආකාරයත්, මුලින් තිබූ ජනතා හිතෛෂී වාග් මාලා පවා වෙනස් වී, එය නැවතත් පාලන ක්‍රමයක් පමණක් බවට පත් වූ ආකාරයත් ඉතිහාසය ඉතා හොඳින් පෙන්නුම් කරයි. රුසියානු විප්ලවය ද එවැන්නකි. එය මුලින් ප්‍රකාශයට පත් කළේ 'සියලුම සෝවියට්

සංවිධාන වලට බලය පවරනු' යන සටන් පාඨය ඔස්සේ ය. සෝවියට් සංවිධාන යනු කම්කරුවන්ගේ සහ ජනතාවගේ සංවිධාන වූ අතර ඒවාට බලය පවරන බවට ඇති කෙරුණු මතය ඔස්සේ ජනතා සහයෝගය ලබා ගැනිණි. එහෙත් වැඩිකල් නොගොස් එය හුදෙක් ම බෝල්ෂෙවික් පක්ෂයේ නායකයන්ගේ පාලන තන්ත්‍රයක් බවට පත් විය. පසුව එය ජෝශප් ස්ටාලින්ගේ යටතේ වූ ලෝකයේ පැවැති දරුණු ම හිතුවක්කාර ඒකාධිපති පාලනයක් බවට පත් වී, ජනතාවගෙන් මිලියන තිහකට වැඩි ප්‍රමාණයක් මරා දමන ලද අතර සකල ජනතාව තුළ ම විවිධාකාර මර්දන ප්‍රතිපත්ති පතුරුවා හැරිණි. අද වනවිටත් සාමාන්‍ය පොදු ජනතාව අන්ත දුගී තත්වයන්ගෙන් පෙළෙන අතර රටේ ඇති වුණු ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ඔවුන් වෙත යොමු වී නැත. මේ ආකාරයෙන් තවත් උදාහරණ ලෝකය පුරා බොහෝ රටවලින් ගෙනහැර දැක්විය හැකි ය.

ඩෙන්මාර්ක් ජාතික ප්‍රබල බුද්ධිමතෙකු වූ එන්.එෆ්.එස්. ගුරුන්වික් යන දාර්ශනිකයාගේ අදහස වූයේ, ආණ්ඩු කියන්නේ ආණ්ඩු ය. ජනතාව කියන්නේ ජනතාව ය. මේ දෙක කොයි අවස්ථාවක දී වත් එකක් බවට පරිවර්තනය විය නොහැකි ය, යන්න ය. මේ තුළ ඉතා ගැඹුරු අවබෝධයක් සටහන් වේ.

කොපමණ ලිබරල්වාදී මතයක් ඇති රටක වුවත් පාලන තන්ත්‍රය යම් ආකාරයක මර්දන ක්‍රියාවලියක යෙදේ. ආණ්ඩුව විසින් කරන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මර්දනය අවශ්‍ය වේ. මෙයට හේතුව නම් ආණ්ඩුව ගන්නා සැම ක්‍රියාවකට ම විරුද්ධ වන්නා වූ බොහෝ දෙනෙක් ද සිටිය හැකි නිසා ය. තමන් දරන මතවාදය කුමක් වුවත් ආණ්ඩුව ගන්නා පියවරට කීකරු විය යුතු ය යන අදහස මත මේ මර්දන තන්ත්‍රය ගොඩනැගී ඇත.

හිතුවක්කාර ඒකාධිපති පාලනයක් හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් අතර ඇති මූලික වෙනස නම් ඒකාධිපති පාලනයක් යටතේ මර්දනය උපරිම ප්‍රමාණ දක්වා ගෙන යන අතර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් යටතේ මර්දනය අවම කිරීම සඳහා ප්‍රයත්නයක් පවතී. 'අවම මර්දනයක් ඇති රාජ්‍යයක්' ලෙස ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය නිර්වචනය කොට ඇත.

ජනතාව වනාහි කිසියම් දේශපාලන බලයක් මත ජීවත් වන්නෝ නොවෙති. ඔවුහු බල ව්‍යූහයෙන් පිටත පවතින්නෝ

ය. ඔවුන් තමන්ගේ එදිනෙදා කටයුතු වල යෙදෙමින් තමුන්ගේ ජීවිකාව සොයා ගනිමින්, විවිධාකාරයේ තමන්ට සුදුසු යැයි හැඟෙන විනෝදාංශ වල යෙදෙමින්, පවුල් හා සමාජය පිළිබඳ ව විවිධ අවස්ථාවලට සහභාගි වෙමින් සාමාන්‍ය ජීවිතයක් ගත කරන්නෝ වෙති. ඒ ජනතාව අතර ද විශාල වෙනස්කම් ඇත. ජනතාව අතර සිටින දුගී ම කොටස් තමන්ගේ එදිනෙදා ජීවිතය ගෙන යෑමට පවා නොහැකි තත්ත්වයක පසු වෙති. බොහෝ විට අධික ව වැඩ කරමින් යාන්තම් ජීවිතය ගැටගසා ගැනීමේ කාර්යයේ යෙදෙති. මේ අතර ජනතාව අතර ගැහැණුන් පිරිමින් වශයෙන් ද විශාල සාමාජීය වෙනස්කම් ඇත. විශේෂයෙන් ම දියුණුවෙන් අඩු රටවල් තුළ කාන්තාවන්ට අධ්‍යාපනය පිළිබඳ ව, රැකියාව පිළිබඳ ව, ජීවිතයේ සුඛසාධනය පිළිබඳ ව හා නිදහස පිළිබඳ ව ආදි වශයෙන් ජීවිතයේ විවිධ අංශ වල අඩුපාඩුකම් හා මර්දන පවතී. ඔවුන්ට රාජ්‍ය මර්දනයෙන් පිටත සිවිල් සමාජය තුළින් ම ඇති වන මර්දනයට ද මුහුණ දීමට සිදු වේ. මේ අතර සුළු ජාතීන්ට අයත් වූවන්ට ද පවතින විවිධ සීමා හා ඒ සීමා ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා ආණ්ඩුව විසින් කෙරෙන මර්දනය ද සිවිල් සමාජය විසින් ම පැනවෙන මර්දනය ද පවතී.

මේ අනුව ජනතාවගේ මතිමතාන්තර ද නිර්මාණය වේ. ඔවුහු තෘප්තියට පත් වී නැති දේවල් පිළිබඳ ව දැඩි ආකල්ප දරති. ඒ ආකල්ප බොහෝ විට විවිධ ආකාරයෙන් ප්‍රකාශයට ද පත් කරති. සමහරු සංවිධානාත්මක ආකාරයෙන් හා මාධ්‍ය පදනම් කරගෙන තමන්ගේ ගැටලු ඉදිරිපත් කරන අතර, තවත් සමහරුන් ඒ ගැටලු නිසා විවිධාකාර ලෙස ජීවිතයට හානිකර පුරුදු වලට යොමු වෙති. උදාහරණයක් වශයෙන් අධික ලෙස මත්පැන් ගැනීම හෝ එවැනි ක්‍රියා, දැඩි කලකිරීම් මතින් ද සිදුවන බව විවිධ හැදෑරීම් මගින් ඉතා පැහැදිලි ව පෙන්වා ඇත.

ජනතාව තමන් දේශපාලන ක්ෂේත්‍රය තුළින් ඉල්ලා සිටින දේවල් තීරණය වන්නේ ඔවුන්ගේ මේ අවශ්‍යතා මගිනි. ඒ අවශ්‍යතා දේශපාලන පක්ෂවලට දැනුම් දීමෙන් ඒ පක්ෂ බලයට පත් වූවොත් එසේ බලයට පත් වන රාජ්‍ය මඟින් මේ බලාපොරොත්තු ඉටු කරාවිය යන්න තිබෙන විශ්වාසය නිසා පමණක් ම සාමාන්‍ය ජනතාව දේශපාලන කටයුතු වලට සම්බන්ධ වෙති. ඡන්ද දායකයෙකු වශයෙන් හෝ, යම් පක්ෂයක

නියෝජිතයෙකු වශයෙන් හෝ සිවිල් සංවිධාන වල සාමාජිකයෙකු වශයෙන් හෝ හුදෙක් ම තනි පුද්ගලයෙකු වශයෙන් හෝ ආදි වශයෙන් ඔවුහු නොයක් ක්‍රියා මගින් තමන්ගේ අවශ්‍යතාවලට රජයේ අවධානය යොමු කරවා ගැනීමට උත්සාහ කරති.

එසේ උත්සාහ කිරීම ස්වාභාවික ව ම සිදුවන නමුත් ඒ උත්සාහය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා රාජ්‍ය තන්ත්‍රය පාවිච්චි කරවා ගැනීම කොතෙක් දුරට හැකි ද යන්න නිගමනය වන්නේ බලයට පත් වන ආණ්ඩුවක ඇති දර්ශනයත්, ජනතා ප්‍රශ්න ගැන ඒ ආණ්ඩුවේ නායකයන්ට ඇති අවබෝධයත්, ඒ ප්‍රශ්න විසඳීමට ඇති වුවමනාවත් මෙන් ම මේ ප්‍රශ්න විසඳීමේ දී ඇති වන වෙනත් ගැටලු පිළිබඳ ව විසඳුම් පවතිනවා ද යන්නත් මත ය. උදාහරණයක් වශයෙන් කම්කරුවා හෝ රටවැසියා ලබන ආදායම් අඩු මට්ටමක පවතින, ජීවත්වීමට නොහැකි තත්වයක පවතිනවා ය යන මතය යම් රජයක පාලකයන් තේරුම් ගත්තත්, ඔවුන් ඒ ප්‍රශ්නයට අත ගැසීමේ දී සලකා බලන තවත් ප්‍රශ්න පවතී. උදාහරණයක් වශයෙන් රටේ ආර්ථිකයේ තත්ත්වය කුමක්ද ?ණය බර කොපමණ ප්‍රමාණයක් පවතී ද ? රටේ වැඩි ආදායමක් ලබන අයට බදු පැනවීම කොතෙක් දුරට කළ හැකි ද? ආදි වශයෙන් විශාල ප්‍රශ්න ගණනාවක් පාලකයා ඉදිරිපිට පවතී.

අව්‍යාජ කමකින් දේශපාලනයේ යෙදෙන පාලකයා මේ ප්‍රශ්න විසඳීම කෙසේ කරන්නේ ද යන්න පිළිබඳ ව වුවමනාවකින් පසු වෙයි. ව්‍යාජ වශයෙන් නායකත්වයක් ගෙනයන්නෝ ඒ ප්‍රශ්න කිසිවක් දෙස බලන්නේ නැතිව තමන්ගේ බලය ඇති කාලය තුළ දී තමන්ගේ හා තම පවුල් සඳහා ධනය ඒකරාශී කර ගන්නේ කෙසේද හා දේපළ රැස් කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව අවධානය යොදවති. කෙසේ වුවත් වැදගත් වන්නේ ජනතාව ජීවත් වන ආකාරයත් ජනතාවගේ සිතුවිලි වල ඇති දේත් ජනතාව බලාපොරොත්තු වන දේත් එක අතක පවතින අතර, රාජ්‍යයක් සම්බන්ධයෙන් ගත් කල එහි පාලකයන් වෙහෙසෙන්නේ ජනතාවගේ ම මානසික තත්ත්වයෙන් නොවන බවයි. එයින් බොහෝ දුරට පරිබාහිර වී විවිධාකාර ක්‍රියාවල යෙදීමට ඔවුන්ට සිදු වේ. හමුදාවක් පවතිනවා නම් ඔවුන්ට වේතන ගෙවන්නේ කෙසේ ද? රාජ්‍ය තන්ත්‍රයේ පැවැත්ම සඳහා සම්පත් වෙන් කරන්නේ කෙසේ ද? ආදි වශයෙන් විවිධාකාර ගැටලු වලට එදිනෙදා ක්‍රියාත්මක වීම ඔවුන්ගේ දෛනික ජීවිතයේ නොවැළැක්විය හැකි කොටසක් බවට පත් වේ.

ඒ නිසා පාලකයා හා ජනතාව අතර මහා පරිමාණ වෙනසක් පැවතීම ස්වභාවික ය. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ ඒ වෙනස අඩු කර ගැනීම සඳහා කිසියම් උත්සාහයක් ගන්නා නමුත් ඒ වෙනස නැති කර දැමීම කළ නොහැකි දෙයකි.

මෙයින් ඇති වන ප්‍රශ්නය නම් රාජ්‍ය පාලනයත් ජන ජීවිතයත් අතර නිරන්තරයෙන් ම ගැටලු සහගත තත්ත්වයක් පැවතීම ය. එය වැළැක්විය නොහැකි ය.

රජයකටත් ජනතාවටත් එක ම දෙයක් බවට පත් විය නොහැක්කේ මේ කරුණ නිසා ය. මේ නිසා ජනතා ආණ්ඩුවක් හදනවා ය යන මිථ්‍යාව ඇති කිරීම, ජනතාව ඉතා විශාල වශයෙන් මුලා කිරීමක් වේ. ජනතාවට, වඩා වැඩි පහසුකම් සලසන හා ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා මූලධර්ම අනුගමනය කරන යම් පක්ෂයකට බලය දීම මගින් ජනතාවට වඩාත් සුබදායී තත්ත්වයක් ඇති කර ගැනීමට දරන ප්‍රයත්නය එකකි. එහෙත් ජනතා වුවමනාවනුත් රාජ්‍ය පාලනයත් 100% ක් එක මට්ටමක පවතින්නේ ය යන අදහස දරුණු ම ප්‍රතිඵල ගෙනදෙන මිථ්‍යාවකි.

ආණ්ඩුවකට බලපෑම් කිරීමේ හැකියාව මත පමණක් තමන්ගේ වුවමනාකම් දෙස රාජ්‍යයේ අවධානය යොමු කරවා ගත හැකි ය. මෙසේ බලපෑම් කිරීමේ හැකියාව වර්ධනය වූ රටවල් තුළ රාජ්‍ය මර්දන තන්ත්‍රය බොහෝ දුරට අඩු මට්ටමක පවත්වා ගැනීමට හැකි තත්ත්වයක් ඇති වේ. එහෙත් ආණ්ඩුවක් කෙරෙහි බලකිරීමට තරම් සංවිධානාත්මක ව හා අවබෝධය අනුව දියුණුවක් ලබා නැති රටවල් තුළ ආණ්ඩුව ජනතාවගේ ප්‍රකාශන නොතකා හැරීමට ඇති ඉඩකඩ බොහෝ ය.

ජනතාවගේ විවේචන ඉදිරියේ පාලකයෝ ඒ ඒ වෙලාවට ඒවාට හරියන ආකාරයට තමන්ගේ උත්තර සදා ගෙන ඒවා ප්‍රසිද්ධියට පත් කරති. එහෙත් ඔවුන් ප්‍රසිද්ධියේ කරන එවැනි ප්‍රකාශ හා එදිනෙදා රාජ්‍ය පාලනයේ දී ඔවුන් කරගෙන යන්නා වූ කටයුතු අතර ඇත්තේ අල්ප සම්බන්ධයකි. බලපෑමේ ශක්තිය අඩු රටවල පාලකයා ඕනෑම බොරුවක් මිනිසුන් ඉදිරියේ කියා පෑමට පැකිලෙන්නේ නැත. මන්ද යත් පාලකයා කරන එවැනි බොරු එළිදරව් කිරීමටවත් එසේ එළිදරව් වීම මත යම් ආනිශංසයකට මුහුණ දීමටවත් සිදු නොවන බව පිළිබඳ ව පාලකයා තුළ ඇති ගැඹුරු අවබෝධය නිසා එවැනි පාලකයන් ජනතාවගේ අදහස්

පිළිබඳ දක්වන්නේ පිළිකුල් සහගත බැල්මකි. බොරුවෙන් පිරි දේශපාලන ක්‍රමයක් බිහි වන්නේ මේ නිසා ය.

උඩින් තමන් ද ජනතාව සමඟ සිටින බව පිළිබඳ මවාපෑම් ඇති කරන අතර ඇත්ත පාලනයේ දී ජනතා විරෝධී ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන් පැකිලෙන්නේ නැත. මර්දන තන්ත්‍රයේ පාලනය තමන් අත පවතින තාක් තමන්ට කැමති දේ තමන්ට කළ හැකි ය යන අදහස පාලකයා තුළ ඇත.

මේ නිසා ජනතා ව්‍යාපාර තුළින් ජනතා ආණ්ඩු හැදීම යන මිථ්‍යාව පැතිරවීම ඉතා භයානක ප්‍රතිඵල දෙන්නකි. ජනතාවට තම ව්‍යාපාර මගින් කරගත හැකි දේ පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් ඇති කර ගැනීමත්, රජයක් මගින් ඔවුන්ට කර ගත හැකි දේ, කර ගත හැකි වන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව අවබෝධයක් ගොඩනගා ඒ අනුව අවශ්‍ය පියවර වැඩිදියුණු කිරීමත් මගින් වෙනස්කම් ඇති කිරීම කෙරෙහි යොමු වීම නිරන්තරයෙන් ම ජනතා ව්‍යාපාර වලින් සිදු විය යුතු ය. ජනතා ව්‍යාපාර වලින් කෙරෙන කාර්යය කිසි දිනෙකවත් ආණ්ඩු මගින් සිදු කෙරෙන්නේ නැත. ජනතා ව්‍යාපාරයේ ශක්තිය අනුව ආණ්ඩුව යම් අනුගතවීම් කර, යම් සහන සැලැස්විය හැකි නමුත් ජනතා සංවිධානය හා ආණ්ඩු සංවිධානය කුමන අවස්ථාවක දී වත් එකක් බවට පත් වන්නේ නැත. ආණ්ඩුව හා ජනතාව අතර ඇති ගැටීම තේරුම් ගෙන, ඒ ගැටීම සාමකාමී හා සංවිධානාත්මක මාර්ග වලින් නිර්මාණාත්මක ව යොදා ගැනීම මගින් වෙනස්කම් වලට ඇති ඉඩකඩ පළල් කර ගැනීම ජනතා ව්‍යාපාර වල අරමුණ වේ. ඒ ව්‍යාපාර වෘත්තීය සමිති විය හැකි ය. එසේත් නැත්නම් ගොවිජන හා වෙනත් මහජන ව්‍යාපාර විය හැකි ය. ඒවා අධ්‍යාපනය, සෞඛ්‍යය දියුණු කර ගැනීමේ හෝ කාන්තා, ළමා, වැඩිහිටි අයිතිවාසිකම් දියුණු කර ගැනීමේ ව්‍යාපාර බවට පත් විය හැකි ය. ඒවායේ පැවැත්ම මත ජනතාවගේ ශක්තිය වැඩි වේ.

ආණ්ඩුවකට අනුගත වීම සඳහා ඒ සංවිධාන අත් හළ හොත් හෝ ආණ්ඩුව ජනතා සංවිධානයක් බවට පත් වී තිබෙනවා ය යන මිථ්‍යාව යටතේ ආණ්ඩුවට ඒ කරුණු පවරා මහජන ව්‍යාපාරය මේවායින් ඉවත් වුව හොත් සිදු වන්නේ නිතර ම රාජ්‍ය තන්ත්‍රයට වාසි වන තත්වයක් මිස ජනතාවට වාසි වන තත්ත්වයක් නොවේ.

# 8.
# රටතුළ අනාරක්ෂාව හා අස්ථාවරත්වය ඇතිකළ දේශපාලනමය මූලෝපාය

යටත්විජිත කාලය අවසනයේ දී හා නිදහස් යුගයේ මුල් දශකවල පැවැති නීතිය මත පාලනය යන මූලික පදනම බිඳ දමා හිතුවක්කාර පාලනයක් රට තුළ බිහි වීමෙන් දැන් පවතින අනාරක්ෂාව හා අස්ථාවරත්වය ඇති කෙරිණි.

මේ අනුව අනාරක්ෂාව හා අස්ථාවරත්වය පාලකයන් විසින් ඇති කෙරුණකි. එය පාලන තන්ත්‍රයේ උඩ සිට පහළට පැතිරී ගිය එකකි. දේශපාලන නායකත්වයේ සිට ආණ්ඩුවේ නිලධාරී තන්ත්‍රය දක්වා පැතිර ගිය එකකි.

පහළ නිලධාරියකු අතින් සිදු වන විනය කඩවීමක් ඔහු හෝ ඇය මත පැටවීමත්, ඒ විනය කඩ වීමට මුල් වූ සමස්ත රාජ්‍ය තන්ත්‍රය තුළ නීතිය නොතකා හරින වාතාවරණයක් ඇති කළ දේශපාලන මූලෝපාය ගැන නිහඬ වීමත් පාලකයන් අතර පුරුද්දක් බවට පත් විය.

මෙය නොබෝදා සිදු වූ එක් සිද්ධියක් මගින් ඉතා පැහැදිලි ව පෙන්වා දිය හැකි ය. එනම්, අප්‍රේල් 21 වෙනිදා ඇති වීමට තිබූ බෝම්බ ප්‍රහාරය පිළිබඳ ව පෙබරවාරි 4 වනදා වන විට තොරතුරු ලැබී තිබුණත්, ඒ ප්‍රහාරය වළක්වා ගැනීමට කිසිදු පියවරක් නොගැනීම උදාහරණයක් සේ ගෙන බලමු. මෙය වළක්වාලීමේ වගකීම පැවරෙන්නේ රටේ ප්‍රධාන විධායක නිලධාරියා වන ජනාධිපතිවරයාට ය. ඔහු යටතේ රාජ්‍ය පාලනය හසුරුවන අගමැතිවරයා ද එය නොතකා හැරීම සම්බන්ධයෙන් මූලික වගකීම් දරන්නෙකි.

1798 ව්‍යවස්ථාව අනුව විධායක ජනාධිපතිවරයා ලෙසින් සලකන්නා තුළ සියලු ම බලය ඒකරාශි කොට ඇත. මේ අනුව මෙවැනි විශාල ප්‍රහාරයක් වළක්වා වැනීමේ වගකීම මුළුමනින් ම පැටවෙන්නේ විධායක ජනාධිපතිවරයාගේ උරහිස මත ය.

මේ පිළිබඳ ව විධායක ජනාධිපතිවරයා පවසන්නේ මෙවැනි ප්‍රහාරයක් ගැන කිසිදු තොරතුරක් තමාට කිසිවකු විසින් වත් දන්වා නොතිබූ බව ය. මෙහි දී මතුවන ප්‍රශ්නය නම් විධායක ජනාධිපතිවරයාට කිසිවකු දැනුම් දුන්නා ද නැද්ද නොවේ. වැදගත් ප්‍රශ්නය නම් මෙවැනි අන්තරාදායක සිදුවීමක් පිළිබඳ ව තමන් නොදනුවත් බව කීම තුළින් ඔහුට ආණ්ඩුවේ ප්‍රධාන තනතුර දරන්නා ලෙස රටේ ආරක්ෂාව පිළිබඳ ව ඇති වගකීමෙන් අත්මිදිය හැකි ද යන්නයි.

සැබැවින් ම ක්‍රියාත්මක වන රාජ්‍ය තන්ත්‍රයක ආණ්ඩුවක් තුළ නම් මෙවැනි ස්ථාවරයක් ගැනීමට ප්‍රධාන විධායක නිලධාරියාට ඉඩක් නැත. ඔහු ඒ වගකීම මුළුමනින් ම පිළිගත යුතු අතර ඉන් පැන නැගෙන ආනිසංශවලට මුහුණ දිය යුතු ය.

මේ වෙනුවට ඔහු යටතේ සිටින නිලධාරීන්ට ඒ වගකීම පැවරීම තුළ සමස්ත රාජ්‍යතන්ත්‍රය තුළ කොපමණ පිරිහීමක් සිදු වී ඇද්ද? ඔහු මේ විනාශය සම්බන්ධයෙන් වගකීම භාර නොගැනීමත්, කිසියම් ම නෛතික දඬුවමකට යටත් නොවීමත් තුළින් එය මනාව ප්‍රදර්ශනය කෙරේ.

වගවීමකින් තොර ව පාලනය කිරීම අහම්බයෙන් සිදු වූවක් නොවේ. එය 1978 ප්‍රකාශයට පත් වුණු ව්‍යවස්ථාව තුළින් ම නිර්මාණය කරන ලද්දකි. ඒ ව්‍යවස්ථාව මගින් මොනයම්ම හේතුවක් නිසාවත් රටේ විධායක ජනාධිපතිවරයා බලයේ සිටින කාලය තුළ දී ඔහුට විරුද්ධව අධිකරණයක් ඉදිරියේ නඩුවක් ඇසීමේ බලය අහෝසි කෙරිණි. මේ අනුව ඔහු කෙරහි බලපාන නෛතික වගවීමක් නැත.

රාජ්‍යතන්ත්‍රයක් තුළ සකල විනයේ හෝ සංයමය මූලාශ්‍රිය වන්නේ පාලකයා හා පාලිතයා යන සියල්ලන් ම නීතියේ ඉදිරියේ සමාන බවත්, ඒ නිසා ඔවුන් අතින් සිදු වන වැරදි නිසා හෝ, ඔවුන් අතින් සිදු වන පැහැර හැරීම් නිසා ඇති වන මොනයම් ම හෝ නීති කඩ වීමකට කවුරුත් සමාන ව වගකිව යුතු ය යන්නය. රටේ විධායකයේ නායකයාට ඒ වගවීමෙන් බැහැර විය නොහැකි ය.

# රාජ්‍යතන්ත්‍රයක විනය හා සංයමය

රාජ්‍යතන්ත්‍රයක් තුළ විනය හා සංයමය ගොඩ නැගෙන්නේ උඩ සිට පහළට ය. රාජ්‍යතන්ත්‍රයේ ඉහළ ම තලයේ විනයක් හා සංයමයක් නැත්නම් පහළ තලවලට විනය හා සංයමය පැතිරී යන්නේ නැත. ඉහළ තලයේ විනය මනින මිනුම්දණ්ඩ වන්නේ රටේ නීතිය හා නීතිය ක්‍රියාත්ම වන ව්‍යූහය තුළිනි. රාජ්‍ය තන්ත්‍රයේ ඉහළ තලය නීතියෙන් පරිබාහිර ව ක්‍රියා කළහොත් හෝ එසේ ක්‍රියා කිරීමට විරුද්ධ ව නෛතික පියවර ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇද්ද යන්න පරීක්ෂණයට භාජනය කිරීම මගිනි. රට පුරාම පැතිරී ඇති පොදු මතය නම් එවැනි තත්ත්වයක් රට තුළ ව්‍යාප්තව පවතින බව ය.

අප්‍රේල් 21 වෙනිදා සිදු වූ සිද්ධි සොයා බැලීමට කොමිසමක් පත් කොට ඇත. විධායක ජනාධිපතිවරයා මේ සිද්ධියට කොපමණ දුරට වගකිව යුතු ද යන්න පිළිබඳ ව සොයාබැලීමට මේ කොමිසමට බලතල තිබේ ද? ඒ කොමිසම මේ පිළිබඳ ව සොයා බලා ඒ පිළිබඳ ව ගත යුතු නෛතික පියවර යෝජනා කිරීමට නොපැකිල වන්නේද? යන ප්‍රශ්න රටේ ඇති අනාරක්ෂාව හා අස්ථාවරත්වය නැතිකර ගැනීම පිළිබඳ ව සැබෑ හා අව්‍යාජ නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකි තත්ත්වයක් ඔවුන්ට තිබේ ද නැද්ද යන්න නිගමන කරනු ඇත.

රටේ බුද්ධි අංශයට හෝ පොලිසියට හෝ වෙනත් ආරක්ෂක අංශවලට අප්‍රේල් 21 සිද්ධිය සම්බන්ධ ව වගකීම පැවරීම නොහැකි ය. රට පාලනය කරන්නේ මේ කවුරුන් විසින්වත් නොවේ. රට පාලනය කරන්නේ විධායක ජනාධිපතිවරයා විසිනි. වෙනත් නිලධාරීන් ක්‍රියාත්මක වන්නේ රටේ ප්‍රධාන පාලකයා යටතේ ය. ආණ්ඩුවේ විවිධ අංශ තුළ විනය හා සංයමය පිරිහී ගොස් හෝ නැතිවී ගොස් ඇත්නම් එය ආණ්ඩුවේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් තමන්ගේ වගකීම් පැහැර හැරීම නිසා සිදු වී ඇත්තකි.

අගමැතිවරයාගේ වගකීම් පැහැර හැරීම් පිළිබඳ ව වගකීම පැවරෙන්නේ ද රටේ ප්‍රධාන විධායක නිලධාරියා මත ය. 1978 ව්‍යවස්ථාව යටතේ අගමැතිවරයා විධායක ජනාධිපතිවරයාට යටත් ය. අගමැතිවරයා තමාගේ අණට කීකරු වන්නේ

නැතැයි විධායක ජනාධිපතිවරයාට කීමට නොපුළුවන. අණ දීමේ වගකීමට (The command Responsibility) සියල්ලෝ ම යටත් වෙති. අගමැතිවරයාට මේ සම්බන්ධයෙන් ඇති විශේෂ වරප්‍රසාදයක් නැත.

එක ම රාජ්‍යයක් තුළ ආණ්ඩු දෙකක් පැවැතිය නොහැකි ය. ප්‍රධාන විධායක නිලධාරියා රට තුළ පවතින්නේ එක ම ආණ්ඩුවක් ය යන්න ගැන වගබලා ගත යුතු ය. දෙබිඩි ආණ්ඩුවක් වනාහි අනාරක්ෂාවේ හා අස්ථාවරභාවයේ උල්පතකි.

## නීතිය - විනය - සංයමය සකල රාජ්‍ය තන්ත්‍රය සීරුවෙන් තබාගැනීම

රාජ්‍ය තන්ත්‍රයේ කාර්යක්ෂමභාවය හා බුද්ධිගෝචරභාවය තීරණය කරන්නේ ඒ රාජ්‍ය තන්ත්‍රයේ සියලු අංශයක ම හා ඊට අනුබද්ධ සියලු ම නිලධාරීන්ව තමන්ගේ රාජකාරි සීරුවෙන් කිරීම තුළින් පමණි. රාජ්‍ය තන්ත්‍රයක් එසේ සීරුවෙන් තබා නොගතහොත් ඕනෑම විනාශයක් සිදු විය හැකි ය. ආණ්ඩුවේ මූල්‍ය ක්‍රම තුළ මහා පරිමාණ වංචා කිරීමට හැකි වනවා පමණක් නොව මූල්‍ය සම්පත් ගොඩනගා ගැනීම විශාල වශයෙන් නොමග හැරිය හැකි ය. රටේ පාර්ලිමේන්තුව බුද්ධිමය සාකච්ඡා මගින් රටට අවශ්‍ය ප්‍රතිපත්ති හා නීති සකස් කරන තැනක් වෙනුවට හුදෙක් ම දෙඩවිලි මඩුවක් බවට හැරවිය හැකි ය. ප්‍රකාශනය තුළ පැවැතිය යුතු විනය හා සංයමය වෙනුවට පාර්ලිමේන්තුව තුළ දැකිය හැකි වන්නේ විකාරරූපී බවට පත්වූ විවාද හා සාකච්ඡා ය. පාර්ලිමේන්තුව මේ තත්වයට පත් වූ විට එය සකල ජනතාවගේ විනය හා සංයමයට අගතිගාමී ලෙස බලපවත්වයි. අධෛර්යය හා කුජීතකම රට පුරා ම පැතිරවීමට මෙය සමත් වෙයි. සීරුවෙන් සිටගැනීමට බැරි පාර්ලිමේන්තුවක් තුළින් සිදු වන්නේ රට පුරා ම අසීරුව හා අධෛර්යය පතුරුවා හැරීම ය. පාලන යාන්ත්‍රණයේ විනය විරෝධී හා සංයමයෙන් තොර ඇඟිලිගැසීම් නිසා යුක්තිය පසිඳලීමේ සංස්ථා තුළ විශාල අසහන, විකෘති වීම් හා අවස්ථාවාදී බව පැතිරී යයි. ආණ්ඩුවේ ආරක්ෂක සංවිධාන තුළ විනය ගරුකත්වය හා සංයමය නැති වී යන අතර, කළ යුත්තේ කුමක් ද හෝ නොකෙරිය යුත්තේ කුමක්

ද යනාදිය පිළිබඳ ව ව්‍යාකූලත්වයක් පැනනගී. තමන්ට නීතිමය වශයෙන් කිරීමට හැකියාව හා යුතුකම් ඇති දේ මොනවා ද යන්න පිළිබඳ ව ස්ථිරසාර ප්‍රතිපත්තියක් නොමැතිකම නිසා, නීත්‍යානුකූල නොවන දේ කිරීමට ද ඔවුන් අතරෙන් සමහරුන් පෙලඹෙයි. දැඩි ලෙස විනයට යටත් වෙන්නැයි තමන්ගේ යටතේ සිටින නිලධාරීන්ගෙන් ඉල්ලා සිටීමට ඉහළ නිලධාරීන් තුළ පැකිලීමක් ඇති වේ. තමන් දෙන අණට පහළ නිලධාරීන්ගෙන් සමහරෙකු විරුද්ධ වුව හොත් ඒ ගැන තමන්ට කළ හැක්කේ කුමක්දැයි සිතා ගැනීමට ඉහළ නිලධාරීන්ට නොහැකි වේ.

මේ සියල්ල නිසා තවදුරටත් පළල් වන්නේ අසීරුව හා අධෛර්යය පමණි.

දේශපාලන ලෙඩරෝගවලට ප්‍රතිකාර ලබාගැනීම, අනාරක්ෂණය, කුණු කඳු ඉවත් කිරීම වැනි නගරසභා වලින් කළ යුතු වැඩ කටයුතු ද, කාන්තාවන්ගේ ආරක්ෂාව සඳහා ගතයුතු වැඩ පිළිවෙළ ද පවතින්නේ ඉහතකී තත්වයේ ය. අරාජිකභාවය උදාසීනත්වය, කලට වෙලාවට කිසිදු දෙයක් කරගැනීමට නොහැකි වීම්, ප්‍රඥාගෝචරභාවය නැතිවී යෑම නිසා, උනන්දුව හා සියලු ම සේවා සීරුවෙන් පවත්වාගෙන යෑම් බොහෝ දුරට නැති වී ගොස් ඇත. නීතිය අස්ථානගත වීමත් නීති ක්‍රියාත්මක කරගැනීමට නොහැකි වීමත් මේ සියලු පරාජවලට මූලාශ්‍රය සේ පවතී.

මේ සියල්ලේ ප්‍රතිඵලය ලෙස රට තුළ දූෂණය උපරිම මට්ටමින් පවතී. නිසි ආකාරයෙන් දූෂණය මැඩලිය හැකි රාජ්‍ය සංස්ථාවක් ගොඩනගා ගැනීමට නොහැකි වී ඇත්තේ ද ඉහත කී නීතියේ හා නීතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාවේ අවතැන් වීමය. මේ අනුව ත්‍රස්තවාදී බෝම්බ කරුවන්ට වඩා, කුඩු ජාවාරම් කරුවන්ට වඩා, රටේ සියලු ම ජනතාවට සෑම දිනයක් සඳහා ම දැඩි විනාශයක් ඇති කරන්නේ රාජ්‍ය තන්ත්‍රයේ ඇති විශාල කඩා වැටීමයි.

නීතියෙන් තොර ව එක් පුදගලයෙකුගේ හිතුවක්කාර පාලනයක් 1978 ව්‍යවස්ථාව තුළින් ඇති කිරීම මගින් ඉහත සඳහන් සියලු විනාශ සිදු වී ඇත. ඒ ව්‍යවස්ථාවේ නිර්මාණකරු වූ ජේ. ආර්. ජයවර්ධන, ඒ ව්‍යවස්ථාව තමුන්ගේ වාසියට හරවාගත්

අතර අනෙකුත් විධායක ජනාධිපතිවරුත්, ඒ ව්‍යවස්ථාව නැති කර සැබෑ නීතිය මත පාලනය, සැබෑ ව්‍යවස්ථාවක් නැවත සඳාගැනීමට බාධා කළ සියල්ලන් ද, ත්‍රස්තවාදී බෝම්බ කරුවන්ට, කුඩු ජාවාරම් කරුවන්ට වඩා විශාල විනාශයක් ලංකාවට කර ඇත. එය අඛණ්ඩ ව දිනපතා ම සිදු වෙමින් පවතී.

දේශපාලනවාදය තුළ තෝමස් හොබ්බ්ස් හා ජෝන් ලොක් කතා කළ මිනිසුන් ස්වාභාවික තත්ත්වයට (The state of Nature) පත් වීම ලංකාව තුළ දැන් නිර්මාණය වී ඇත. ජෝන් ලොක් මේ තත්ත්වය විස්තර කළේ ආණ්ඩුවක පාලනය යටතේ සදාගත් සාධාරණ නීතිපද්ධතියකින් තොර ව මිනිසුන් විසින් ප්‍රශ්න විසඳා ගැනීම තමන්ගේ ම අතට ගැනීම ය. ඔහු උදාහරණ ලෙස දක්වූයේ මිනීමැරීමට පිළිතුර වශයෙන් ඒ මිනීමැරීම කළ තැනැත්තකුට ජනතාව විසින් ම මරණයට පත් කිරීම, හොරකමක් කිරීම හෝ වෙනත් අපරාධයක් කිරීමට සැරසෙන්නෙකුට ඒ අපරාධයට භාජන විය හැකි පුද්ගලයා විසින් ම දඬුවම් පැමිණවීම ආදියයි. මෙය වාණිජ ජීවිතයේ ඇති වන ගැටලු පිළිබඳ ව ද ඉහත ආකාරයට ම සිදු වේ. එනම් තමන්ගේ ආරක්ෂාව සඳහා ප්‍රචණ්ඩ ව කටයුතු කිරීමේ බලය එකිනෙකා විසින් තමන් වෙත ම පවරා ගැනීම ය.

යම් අපරාධයක් හෝ හානියක් තමන්ට සිදු විය හැකි යයි සිතන පුද්ගලයකුට හෝ ජනකාණ්ඩයකට ඒ තත්ත්වය වළක්වා ගැනීම සඳහා ප්‍රචණ්ඩ ව කටයුතු කිරීම මේ ස්වභාවික තත්ත්වය තුළ සාධාරණය කෙරෙයි.

අපරාධයක් වළක්වා ගැනීමට ඉක්මනින් ක්‍රියා කළ හැකි රාජ්‍ය තන්ත්‍රයක් නොපවතින හෙයින්, තමන් ම තමන්ගේ ආත්ම ආරක්ෂාව සඳහා මෙසේ ප්‍රචණ්ඩ ව හැසිරීම හැර වෙන කළ හැකි දෙයක් නැතැයි එසේ හැසිරෙන්නෝ තර්ක කරති. මේ අනුව රටක් තුළ පුද්ගලික මත හෝ සංවිධාන මට්ටමේ ප්‍රචණ්ඩ ක්‍රියා කිරීම සාධාරණ යයි සිතන මානසික තත්ත්වය ඇති වන්නේ රාජ්‍ය තන්ත්‍රයට අපරාධ වළක්වා ගැනීම සඳහා ඉක්මනින් ක්‍රියා කිරීමට නොහැකි තත්ත්වයක් ඇති වීම නිසා ය. අකාර්යක්ෂම රාජ්‍යතන්ත්‍රයක් වනාහි සංවිධානය වූ රටක සංවිධාන රටාව හා ශක්තිය නැති කරන ප්‍රධාන ම සාධක වේ.

අපරාධ වළක්වාලීමේ වගකීම ඇති ප්‍රධාන රාජ්‍ය සංස්ථා නම් යුක්තිය පසිඳලීමේ දී ක්‍රියාත්මක වන සිවිල් පොලිසිය,

සාමාන්‍යයෙන් ප්‍රොසිකියුටර් යන්නෙන් අදහස් කරන ආණ්ඩුව වෙනුවෙන් නඩු පවරන්නා, එනම් ලංකාවේ නීතිපති දෙපාර්තුමේන්තුව හා අධිකරණයයි. ඔවුන් එසේ කරන්නේ පොදුවේ කාටත් බලපවත්වන අපරාධ නඩු පිළිබඳ නීතිමය රාමුව ඔස්සේ ය. එහෙත් මේ රාමුව 1978 ව්‍යවස්ථාවෙන් ඇති කළ විධායක ජනාධිපති ක්‍රමය තුළින් ව්‍යාකුල කෙරිණි. මේ සංස්ථා වලට තිබිය යුතු වෘත්තිය ස්වාධීනත්වය දේශපාලන ඇඟිලි ගැසීම් මගින් දුර්වල කෙරිණි. ඒ මගින් රටේ ආරක්ෂාව සඳහා පවතින ප්‍රධාන ම සංස්ථා බෙලහීන කෙරිණි.

මෙයින් ඇති වූ අරාජිකත්වය, මිනිසුන් ස්වාභාවික තත්ත්වයට කඩාවැටීම නමින් තෝමස් හොබ්බ්ස් හා ජෝන් ලොච්ක් හා වෙනත් දේශපාලන දාර්ශනිකයන් විසින් පෙන්වා දී ඇති තත්ත්වයයි.

එවැනි තත්ත්වයක් යටතේ ඕනෑ ම අපරාධයක් ඕනෑ ම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් සිදු විය හැකි අතර, නීතිය හා නීතිය ක්‍රියාත්මක කිරීම මත පමණක් නිර්මාණය කළ හැකි සමාජ සාමය හා සහජීවනය අනතුරේ පවතින රටක්, ඒ රටේ ව්‍යවස්ථාව මගින් ම නිර්මාණ කොට ඇත.

# 9.
# ලංකාවේ සංවිධාන රටාවේ අත්තිවාරම දෙදරවූ චරිත දෙකක්

ලංකාවේ සමාජ හා දේශපාලන ව්‍යුහයේ අත්තිවාරම වී තිබුණේ සාධාරණ නීති ක්‍රමයක් හා ඒ නීති නිසිලෙස ක්‍රියාත්මක කිරීමට තිබුණු මූලික එකඟතාවයි. ඉහත කී ව්‍යුහය බිඳදැමීමට හා නීතියටත්, නීතිය ක්‍රියාත්මක කිරීමටත් එරෙහි ව දාර්ශනික මතවාදයක් ගොඩනැගීමටත් මුල් වූ අය අතර ප්‍රබල ව කැපී පෙනන චරිත දෙක නම් හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන හා හිටපු අග්‍ර විනිශ්චයකාර සරත් නන්ද සිල්වා ය.

මොවුන් දෙදෙනා ම ගමන් ඇරඹූ මග පසුකාලීන ව වෙනස් කිරීමට තරම් ශක්තියක් ඇති කිසිවෙක් මෙතෙක් පහළ වී නැත. මොවුන් දෙදෙනා කළ කී දේ පුළුල් ව වාර්තා වී ඇති අතර, මේ පරිච්ඡේදයෙන් කරන්නේ ඔවුන්ගේ ඒ කතාවේ එන මූලික අවධිය පිළිබඳ ව දළ සටහනක් සැපයීම පමණි.

## ජේ. ආර්. ජයවර්ධන

ලංකාවේ සංවිධාන රටාව සම්බන්ධයෙන් ගත් කල ජේ. ආර්. ජයවර්ධන දේවදත්තයෙකි, ජුදාස් කෙනෙකි.

ඔහු ඒ සංවිධාන රටාව බිඳීමට ගත් ප්‍රධාන පියවර මේවා ය.

1. 1977 මැතිවරණයේ දී ඔහුගේ පක්ෂය මැති සබයේ 80% පමණ ආසන දිනගත්තාට පසු ඔහු කළ මුල් ම කාර්යයක් වූයේ තම පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් දින රහිත අස්වීම් ලිපි ලබාගැනීම ය. මෙසේ කිරීම මගින් ව්‍යවස්ථාදායකයේ ස්වාධීනත්වයට එල්ල වූයේ මාරක ප්‍රහාරයකි. ඒ සුනාමියේ

ප්‍රතිඵලය වූයේ ප්‍රජාතන්ත්‍රවාදයේ හා නීතිය මත පාලනයේ පදනම යටපත් කර දැමීම ය. දැන් ඉතිරි ව ඇත්තේ හා නීතිය මත පාලනයේ නටබුන් පමණි.

2. ජනරජ ව්‍යවස්ථාව තමන්ගේ ම ඇඟට පමණක් ගැලපෙන ඇඳුම් කට්ටලයක් බවට පත් කෙරිණ. මෙය කරන ලද්දේ 1978 ප්‍රකාශයට පත් ජනරජ ව්‍යවස්ථාව මගිනි. මේ මගින් ප්‍රජාතන්ත්‍රවාදයටත්, නීතිය මත පාලනයටත් පැවතිය නොහැකි තත්වයක් උදා විය. ඒ වෙනුවට හිතුවක්කාර පාලන ක්‍රමයක් ඇති කළේ ය. රටේ සමස්ත සංවිධාන රටාවත් පාලන තන්ත්‍රයත් විකාරරූපී එකක් බවට පත් විය. පාලන තන්ත්‍රය විසින් රටේ නිලධාරි තන්ත්‍රය අස්ථාවර කර දැමිණි.

3. 1982 දී පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් ඡන්දයෙන් පත් කරගැනීම වෙනුවට ජනමත විචාරණයක් මගින් පාර්ලිමේන්තුවේ කාලය දිග්ගස්සවා ගැනිණි. ලංකාවේ පසුකාලීන ව සිදු වූ සියලු ම දරුණු සටන් වලට මග පාදන ලද්දේ මේ ආකාරයෙන් ජනමත විචාරණයක් මගින් පාර්ලිමේන්තුවේ කාලය දිග්ගස්සා ගැනීම බව බොහෝ විචාරකයින් පෙන්වා දී ඇත. රට අවුලෙන් අවුලට ඇද දැමීමට මූලික වූ පදනම ඉහත සඳහන් ජනමත විචාරණය මගින් නිර්මාණය කෙරිණි. ජනමත විචාරණයේ මූලික අරමුණ වූයේ තම පක්ෂයට පාර්ලිමේන්තුව තුළ හිමි ව තිබූ 2/3 වැඩි බලය එසේම රඳවා ගැනීම තුළින් ජනාධිපතිවරයාගේ ආරක්ෂාව තහවුරු කරගැනීම ය.

4. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වූ සිරිමාවෝ බණ්ඩාරනායක ගේ සිවිල් අයිතිවාසිකම් අහෝසි කිරීම මගින් තමන්ගේ පාලන බලයට විරුද්ධ ව නැගෙන ජනතාවට ඒ විරෝධය ප්‍රකාශ කිරීමට ඇති දේශපාලන ශක්තිය අවතැන් කර දැමීම සිදු විය. කාලීන ව විරුද්ධ පක්ෂයට බලය ලබා ගැනීමට හැකි තත්ත්වයක් පැවතුණා නම් පසු ව ආ බරපතළ ආරවුල් සම්බන්ධයෙන් ජනමතය සාධනීය ව ගොඩනගා ගැනීමට හැකියාවක් පැවැතිණ. ප්‍රජාතන්ත්‍රවාදී ව ජනමතය හැසිරවීමට මාවතක් තිබුණා නම් ලංකාවේ මෑත ඉතිහාසය බොහෝ දුරට වෙනස් වෙන්නට ඉඩ තිබුණි.

5. මාධ්‍ය නිදහස බරපතළ සේ මැඩ පැවැත්වීම හා සීමා කිරීම ඔහු අතින් සිදු වූ බරපතළ ම දේශද්‍රෝහී ක්‍රියාවකි. ජාතික

රජයක් ලෙස සංවිධාන රටාවක් ගොඩනගා ගැනීමේ දී ප්‍රධාන ම ආධාරකරුවෙකු වන්නේ නිදහස් ව සිතන හා සිතූ දේ ප්‍රකාශයට පත්කර ගැනීමට හැකියාව ඇති ජනතාවක් පමණි. මතවාදී ව වහල් බවට පත් කර ඇති මිනිසුන්ට ස්වාධීන වූ සංවිධාන රටාවක් ගොඩ නගාගැනීමේ ඇති හැකියාව නැතිවී යයි. 'මම ආරක්ෂා වෙලා ඉන්නම්. උඹලාට හෙන ගැහුවත් ඒක මගේ ප්‍රශනයක් නොවේ' යනුවෙන් කීම වැනි දෙයක් මේ තත්වය තුළ උදා විය.

6. 1983දී ඔහු අනුගමනය කළ අති මෝඩ ක්‍රියා පිළිවෙළ මගින් ජනවාර්ගික ප්‍රශ්නය විසඳිය නොහැකි තත්වයක් උදා වූවා පමණක් නොව ලෝකය පුරා ම ලංකාවට ලැජ්ජා විය යුතු ප්‍රතිරූපයක් නිර්මාණය කෙරිණි. ඉන්දියාවට ලාංකීය දේශපාලනයට අත පෙවීමට මාවතක් නිර්මාණය කෙරිණි. ඔහු L. T. T. E. ත්‍රස්තවාදයට මහා පරිමාණ ව මුදල් ගලා ඒමට මාවතක් සකස් කර දුන්නේ ය. රට තුළ ඇති වූ සිවිල් ගැටීමක් යුද්ධයක් දක්වා දික්ගැස්සීමට මාවත සකස් කළේ ය. මේ සියල්ල තුළින් ලාංකිය සංවිධාන රටාවේ පදනම වූ ප්‍රජාතන්ත්‍රවාදය හා නීතිය මත පාලනය තව දුරටත් බිඳ දැමී ය.

7. දේශපාලන නායකත්වය හා රටේ නිලධාරි තන්ත්‍රය අතර පවතිමින් තිබූ නීතිමය රාමුව බිඳ දැමීම තුළින්, නිලධාරි තන්ත්‍රය අවුල් තත්ත්වයකට පත් කළ අතර වගකීම්වලට මුහුණදීම් සම්බන්ධයෙන් නිලධාරි තන්ත්‍රය අසරණ කර දැම්මේ ය. 2019 අප්‍රේල් 21 වෙනි දා සිදු වූ ඛේදවාචකය වැනි ක්‍රියාවලටත් රට පුරා ම පැතිරී ගිය දූෂණයටත් කුඩු ව්‍යාපාරය වැනි භයානක ව්‍යාපාර වලටත් වර්ධනය වීමට මග පාදන ලද්දේ නිලධාරි තන්ත්‍රය තුළ පැතිරී පවතින බෙලහීන බවේ හැඟීම ය. මෙය ඇති කිරීමට පසුබිම සැදුවේ ජේ. ආර්. ජයවර්ධනගේ මුග්ධ දේශපාලන දර්ශනය හා නායකත්වයයි.

මේ ක්‍රියාවලිය වටහා ගැනීම තුළින් පසු කාලීන ව ලංකාවේ ඇතිවූ දේශපාලන ව්‍යසනය හා සංවිධාන භංගත්වය වටහා ගත හැකි ය. විපත් වලට විරුද්ධ ව ආපසු හැරී සටන් කොට විපත වළක්වා ගැනීමට හැකි ප්‍රතිශක්තීකරණය, විශාල වශයෙන් අවතැන්වූ ආකාරය ඉහත සඳහන් ක්‍රියාවලිය තුළින් අවබෝධ කර ගත හැකිය.

# සරත් නන්ද සිල්වා

ජේ. ආර්. ජයවර්ධන ඇති කළ බලවත් ව්‍යසනය ලංකාවේ අධිකරණ පද්ධතියට ගෙන ආවේ හිටපු අග්‍ර විනිශ්චයකාර සරත් නන්ද සිල්වා ය. ඔහු පක්ෂ දේශපාලනයේ දී අයිති වූයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ය. එහෙත් ඔහු තම පක්ෂයේ දේශපාලන විරුද්ධ කාරයා වූ ජේ. ආර්. ජයවර්ධනගේ ක්‍රියා පටිපාටිය හා විධික්‍රමය ඉතා තදින් ග්‍රහණය කර ගත්තේ ය. ප්‍රතිවාදීන්ගෙන් පාඩම් ඉගෙන ගෙන, ඒවා ප්‍රතිවාදියාටත් වඩා හොඳින් ක්‍රියාවට නැංවීම සාමාන්‍යයෙන් ඉතිහාසයේ දකින්නට ලැබෙන සුලභ සිද්ධියකි. ජේ. ආර්. ජයවර්ධන විසින් වෙනස් කෙරුණු ලංකාවේ සංවිධාන රටාව ලංකාවේ නීති ක්‍රමය තුළට ගෙන ඒම කෙරුණේ ඔහු විසිනි.

ඔහුගේ ක්‍රියාකලාපයේ මූලික විධි ක්‍රමය මෙසේ සාරාංශ කර ගත හැකි ය.

1. ඔහු රටේ අධිකරණ ක්‍රියාපටිපාටිය (procedural law) බොහෝ විටක නොතකා හරිමින් ද තවත් විටක ක්‍රියාකලාපය තුළින් අලුතින් නිර්මාණය කරමින් ද ක්‍රියා කළේ ය. මේ පිළිබඳ ව දහසකුත් උදාහරණ බොහෝ නීතිවේදීන් හා ලේඛකයන් විසින් වාර්තා කොට ඇත. ප්‍රොසීජරල් නීතිය හා හරයාත්මක නීතිය (Substantive Law) එක සමාන වැදගත් කමකින් යුතු වේ. ප්‍රොසීජරල් නීතිය නොතකා හැර හරයාත්මක නීතියට පැවතිය නොහැකි ය. ප්‍රොසීජරල් නීතියත් හරයාත්මක නීතියත් නිර්මාණය කරන්නේ ව්‍යවස්ථාදායකය විසිනි. ව්‍යවස්ථාදායකය විසින් නිර්මාණය කරන නීතිය, අධිකරණ ක්‍රියාවලියේ මාර්ගෝපදේශකයා වෙයි. හරයාත්මක නීතියේ මෙන් ම ප්‍රොසීජරල් නීතියේ වෙනස්කම් ඇති කිරීම ව්‍යවස්ථාදායකයට පමණක් කළ හැකි දෙයකි. ප්‍රොසීජරල් නීතිය කඩ වීමට ඉඩ තැබීම ජල මාර්ගයක් දෙපස ඉදිකර ඇති කඩයිම් තාප්පය කඩා දැමීම වැනි දෙයකි. කඩයිම් තාප්පය බිඳ දැමුවහොත් ජලය ගොඩබිම් ප්‍රදේශයට ගලා යෑම සිදු වේ. ප්‍රොසීජරල් නීතිය නොතකා හැරීම මත එවැනි තත්වයක් උදා වී ඇත.

2. නීතිය හා අභිමතය අතර ඇති පිළිගත් සීමා නොතකා හැරීමක් ද සිදු විය. යුක්තිය පසිඳලීමේ දී විනිශ්චයකාරවරුන්

නීතිය අකුරට ම ක්‍රියාත්මක කළ යුතු බවත්, යම් අවස්ථා වල දී තම අභිමතය පාවිච්චි කළ හැකි මුත්, එසේ කළ හැක්කේ සීමා සහිත ව බවත්, එක්සත් රාජධානියේ හිටපු අග්‍රවිනිශ්චයකාරයෙකු හා නීතිය පිලිබඳ ව සාමිවරයා වූ ටොම් බිංහැම් මහතා අතින් ලියැවුණු 'නීතිය මත පාලනය' යන කෘතියේ පැහැදිලි ව විස්තර කර ඇත. ඒ පොතේ සැම ඡේදයක් ම මේ කරුණ විස්තර කිරීම සඳහා යොමු කර ඇත. මේ පොතේ සිංහල පරිවර්තනයක් "නීතිය මත පාලනය" යන නමින් ප්‍රකාශයට පත් කොට ඇත. ඔහු එහි සාරාංශ කර ඇත්තේ පොදු නීති ක්‍රමය "The Common Law" යන නීති ක්‍රමය තුළ ශත වර්ෂ ගණනාවක් තුළ පැවත ඇති සම්ප්‍රදාය ය. එහෙත් මේ සම්ප්‍රදාය ද නොතකා හැරීම සරත් නන්ද සිල්වාගේ කාලය තුළ සිදු විය. එය නිසා සිදු වී ඇති අගතිගාමී තත්වය නීතිය මත පාලනයට බරපතළ අර්බුදයක් ඇති කළේ ය.

3. නීතිඥවරුන්ගේ වරප්‍රසාද සම්බන්ධයෙන් බරපතළ ප්‍රහාරයක් එල්ල කළ අතර, එය ලංකාවේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු වූ එස්.එල්. ගුණසේකර නීතිඥ මහතා තදින් විවේචනය කර ඇත. ලෝකයේ වෙනත් රටවල තාක්ෂණයේ ඇතිවී ඇති වෙනස්කම් ප්‍රයෝජනයට ගැනීමට, නඩුවක පාර්ශ්ව නියෝජනය කරන්නන් සඳහා ඇති අයිතීන් බලවත් සේ තහවුරු කර ඇත. මෙය බොහෝ දුරට කර ඇත්තේ අධිකරණයක් තුළ කරන මැදිහත් වීම් වලට අදාළ සියලු ම කරුණු මුලින් ලිඛිත ව ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන සකස් කිරීම මගිනි. ඒ ලිඛිත කරුණු සම්බන්ධයෙන් පැන නගින ප්‍රශ්න විවෘත උසාවියේ දී සාකච්ඡාවට භාජනය වේ. මේ මගින් නඩුවට අදාළ ප්‍රධාන කරුණු හා නීතිය පිළිබඳ ව පැහැදිලි කිරීම් කෙටි කාලයක් තුළ දී කළ හැකි ය. එමෙන්ම නඩු වල වාර්තා හා සාක්ෂි ටේප් රෙකෝඩ් කිරීම මගින් (තැටිගත කිරීම්) අධිකරණයේ විශාල කාලයක් ඉතිරි කර ගත හැකි ය. එමෙන් ම යතුරුලේඛිකාවන්ගේ පුරප්පාඩු මත හා ඔවුන් යම් හේතු නිසා අධිකරණයට නොපැමිණෙන අවස්ථාවල දී නඩු කල් දැමීම ද විශාල වශයෙන් සීමා කර ගත හැකි ය. ඒ මගින් නඩු පමාව නැති කර දැමීමටත් පුළුවන.

4. මේ වෙනස්කම් ඇති කිරීම සඳහා ලෝක බැංකුවෙන් හා/හෝ වෙනත් ආයතන මගින් ලැබුණු ආධාර වලින් සැලකිය

යුතු ප්‍රයෝජනයක් ගෙන අධිකරණ කරා එන ජනතාවගේ පහසුව සැලැස්වීම අතපසු කෙරුණි. ලෝක බැංකු ආධාර මත අධිකරණ ක්‍රියාවලිය නූතන තාක්ෂණය මගින් කිරීමට වගකීම පැවරුණු එක් නිලධාරියෙකු කියා සිටියේ, ඒ තාක්ෂණීය වාර්තාකරණය සිදු කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය තුළින් ම පටන් ගත යුත්තක් බව ඔවුන් යෝජනා කළ බව ය. ඉහත යෝජනාවට සරත් නන්ද සිල්වා අකමැති විය. ඔහු කියන කරන දේ තාක්ෂණික ව වාර්තා කිරීමට අකමැත්තක් ඔහු තුළ තිබුණා යයි අනුමාන කළ හැකි ය.

5. ඉහත සඳහන් හිටපු එස්.එල්. ගුණසේකර නීතිඥ මහතා ඔහුගේ පොතෙහි ජෝෂ්ඨ ජනාධිපති නීතිඥවරයෙකුගේ කියමනක් මෙසේ සඳහන් කොට ඇත. 'අලුතින් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක් හැදුවා. ඒත් සමඟ ම ප්‍රජාතන්ත්‍රවාදය අපිට අහිමි වුණා. දැන් අලුත් අධිකරණ ගොඩනැගිල්ලක් තනාගෙන යනවා. එයත් සමඟ ම අපේ සාම්ප්‍රදායික නීති ක්‍රමයත් අහෝසි වේවි ද' යනුවෙනි. තවදුරටත් එස්.එල්. ගුණසේකර මහතා ප්‍රකාශ කළේ ඉස්සර නම්, නඩුවක පාර්ශ්වයකට පෙනී සිටින නීතිඥයන්ට අවසාන වශයෙන් ප්‍රකාශයට පත් වන තීන්දුව මෙය යයි සිතාගැනීමට ඉඩකඩ තිබුණි. දැන් එහෙම නැහැ. එස්.එල්. ගුණසේකර මහතා සරත් නන්ද සිල්වා පිළිබඳ ව කියා සිටියේ ඔහු ලංකාවේ අධිකරණයේ සිටි අග්‍රවිනිශ්චයකාර වරුන් අතර සිටි නරක ම පුද්ගලයා ලෙස ය.

මොහාන් පීරිස් වැනි විනිසුරුවරුන් බිහි වූයේ සරත් නන්ද සිල්වාගේ උරුමයේ ප්‍රතිඵලයක් ලෙසිනි.

# 10.
# මහේස්ත්‍රාත්වරුන්ගේ රාජකාරියේ ඇති සාමාජීය වැදගත්කම

ලංකාවේ අධිකරණ පද්ධතියේ යටින් ම පිහිටන්නේ මහේස්ත්‍රාත් අධිකරණ ය. මේ නිසා සමහරුන් හිතන්නේ මහේස්ත්‍රාත්වරුන් අතින් සිදු වන කාර්යය අධිකරණ වලින් සිදු වන කාර්යයට වඩා අඩු වැදගත්කමකින් යුතු බව ය. එහෙත් එය සත්‍යයෙන් තොර ය. ඇත්තෙන් ම ජනතා ආරක්ෂාව සම්බන්ධයෙන් වැඩි ම බරක් පැටවෙන්නේ මහේස්ත්‍රාත් අධිකරණ වලට ය. ඒ නිසා මහේස්ත්‍රාත් වරුන්ගේ රාජකාරිය සම්බන්ධයෙන් සලකා බැලීම ජනතා ආරක්ෂාව සඳහා රාජ්‍යය මත පැවරෙන වගකීම් පිළිබඳ සාකච්ඡාවේ දී ඉතා වැදගත් තැනක් ගත යුතු තේමාවකි.

ජනතා ආරක්ෂාවේ ප්‍රශ්න වල දී ඒ ප්‍රශ්න මුලින් ම අධිකරණයක් ඉදිරියට එන්නේ මහේස්ත්‍රාත් අධිකරණයක් තුළ දී ය. මහේස්ත්‍රාත් අධිකරණයක ගන්නා තීරණ තුළින් සමාජය තුළ ස්ථාවරත්වයක් පවත්වා ගෙන යෑම සඳහා විශාල සේවයක් කළ හැකි ය. ප්‍රශ්නයක් මුල් වතාවට අධිකරණයක් ඉදිරියට ආ විට ඒ පිළිබඳ ව ගත යුතු නෛතික පියවර නිසි ලෙස ගැනීම තුළින් ජනතාවට මෙන් ම රාජකාරි කරන නිලධාරීන්ට ද ඉතා පහසු තත්වයක් ඇති කර ගත හැකි ය. ඒ පහසුකම ඇති කර ගැනීම තුළ වඩාත් දුරදිග ගියොත් විශාල ප්‍රශ්න බවට හැරිය හැකි බොහෝ දේ මුල් අවධියේ දී ම සමහන් කර ගැනීමට හැකි වේ. එමෙන් ම ජනතාවගේ විශ්වාසය ද තහවුරු වේ. ජනතාවට අවශ්‍ය ආත්ම විශ්වාසය අධිකරණයක් තුළින් ගොඩනැගෙන්නේ ඒ ජනතාව තුළ තමන්ට මතු විය හැකි ගැටලුවක් නිසි ආකාරයෙනුත්

එමෙන් ම ඉක්මන් ආකාරයෙනුත් සිදු කර ගැනීමට හැකි වනු ඇත යන්න නිර්මාණය වූ විට ය.

එමෙන් ම මහේස්ත්‍රාත් වරයෙකුගේ බල ප්‍රදේශය තුළ ඇති පොලිස් ස්ථාන වල විනය හා සංයමය මෙන් ම නීතිගරුක භාවය ද තහවුරු කිරීම මහේස්ත්‍රාත් වරුන්ගේ කාර්යය තුළින් සිදු වේ. අපරාධ පිළිබඳ සියලු ම තොරතුරු මුල් අවධියේ සිට ම වාර්තා කළ යුතු වන්නේ මහේස්ත්‍රාත් අධිකරණයට ය. ඒ තොරතුරු මත මහේස්ත්‍රාත් තුමා විසින් කරන නියෝග මගින් පොලිසියේ සියලු කටයුතු නෛතික රාමුවක් තුළ කෙරෙන බවට වගබලා ගත හැකි ය. යම් දේවල් නිසි ආකාරයට නොකෙරෙන්නේ නම් හෝ යම් අකාර්යක්ෂමතාවක් හෝ නොසැලකිල්ලක් දක්වන්නට පටන් ගතහොත් ඒ පිළිබඳ ව අවශ්‍ය අණ කිරීම් තමන්ගේ බලය යොදා ගනිමින් ඉටු කිරීම තුළින් මහේස්ත්‍රාත් වරයා පොලිසිය සීරුවෙන් තබා ගැනීමේ කටයුත්තට හවුල් වේ.

මෙවැනි ඉතා වැදගත් රාජකාරියක් සිදු කරන මහේස්ත්‍රාත්වරුන්ට පසුගිය දශක වල දී විවිධාකාර ප්‍රශ්න වලට මුහුණ දීමට සිදු වූ අතර ඒ මගින් මහේස්ත්‍රාත්තුමන්ලා විසින් ඉටු කළ යුතු ඉතා වැදගත් සමාජීය යුතුකම් වලට තර්ජන එල්ල වී ඇත. මේ නිසා එයට හේතු වූ සමහර කරුණු සාකච්ඡා කිරීම වටී.

## වැඩ ප්‍රමාණය අධික වීම

වැඩ ප්‍රමාණය අධික වීම සිදු වන්නේ පොලිස් ස්ථාන වලින් ගොනු කරන නඩු වාර්තා ගණනාවක් නොකඩවා ම අධිකරණය තුළට ගලා ඒම නිසා ය. පවතින අධිකරණ වල ඇති සීමාව නිසා මෙසේ විශාල නඩු ප්‍රමාණයක් ගොනු වීම වැළැක්විය නොහැකි කරුණක් සේ පවතී. මේ කරුණට මුහුණ දිය හැකි ක්‍රම දෙකක් නම්, අධිකරණ වල ප්‍රමාණය වැඩි කිරීම හා පවතින අධිකරණ තුළ ම හෝ සේවය කරන මහේස්ත්‍රාත්වරුන්ගේ ගණන වැඩි කිරීමයි. මේ මාර්ගයෙන් සිදු වන වැඩ බෙදා ගැනීමක් ඔස්සේ දිනපතා නඩු එකතු වීම තුළින් ඇති වන ආතතිය වළක්වා ගත හැකි ය.

එමෙන් ම නූතන තාක්ෂණය යොදා ගැනීම තුළින් ද එන නඩු ඉක්මනින් වර්ගීකරණය කිරීමටත් ඒවා පිළිබඳ අවශ්‍ය තීන්දු

ඉක්මනින් ලබා දීමටත් හැකි ය. අද ලෝකයේ බොහෝ රටවල් දෙස බලන කල පැහැදිලි ව පෙනී යන්නේ අධිකරණයේ ගැටලු විසඳා ගැනීම සඳහා නූතන තාක්ෂණය වෙත යොමු වී ඇති ආකාරයයි. පරිගණක භාවිතය ඉතා සුලභ අත්දැකීමක් බවට පත්වී ඇති ලෝකයක මේ ආකාරයට මහේස්ත්‍රාත් අධිකරණ තුළ ද තාක්ෂණය යොදා ගැනීම තුළින් මහේස්ත්‍රාත් වරයාගේ කාර්යය පහසු වනවා පමනක් නොව අදාළ වෙනත් නිලධාරීන්ගේත්, නීතිඥවරුන්ගේ මෙන් ම පොදුවේ අධිකරණය වෙත නඩු සඳහා පැමිණෙන අයගේත් පහසුව විශාල වශයෙන් ඇති කළ හැකි ය.

මේ තාක්ෂණ දියුණුව ඇති කිරීම විශාල වශයෙන් මුදල් වැය කළ යුතු කාර්යයක් නොවේ. ඊට අවශ්‍ය වන්නේ අදාළ පරිගණක ආදි තාක්ෂණික මෙවලම් ගෙන දීමට යන වියදමත්, අනිත් අතින් මේ තාක්ෂණය භාවිත කිරීම සඳහා විධික්‍රම ගොඩ නගා ගැනීමත් ය. දැන් බොහෝ රටවල අධිකරණ තුළ වෙනම ම තාක්ෂණ අංශ පිහිටුවා ඇත. පරිගණක තාක්ෂණය පිළිබඳ දැනුම හා අත්දැකීම ඇති අය විසින් ඒ තාක්ෂණ රාමුව පවත්වා ගෙන යයි. එවැනි සේවයට යොමු කර ගත හැකි බොහෝ දෙනා දැන් ලංකාවේ සිටිති. එසේ වූයේ පසුගිය දශක තුළ ලෝකයේ ඇති වූ තාක්ෂණික දියුණුව තුළින් ලංකාවේ ද විවිධ තාක්ෂණ ආයතන තුළින් ඒ දක්ෂතා ප්‍රගුණ කර ගත් පිරිසක් බිහි වීම නිසා ය.

තාක්ෂණය පිළිබඳ ව බලපාන ගැටලුව නම් මහේස්ත්‍රාත්වරයා ඇතුළු ව අධිකරණය තුළ සේවය කරන නිලධාරීන් ද මේ තාක්ෂණය පාවිච්චි කිරීමට පුහුණු කිරීම ය. එය විනය පිළිබඳ ප්‍රශ්නයක් සේ සැලකීම අවශ්‍ය ය. අතීතයේ දී යම් අධිකරණ වලට පරිගණක දීම සිදු කර තිබුණත් ඒවා පාවිච්චි කිරීමක් සිදු නොවන බව දැනගන්නට ඇත. එය සමහර විට දැනට පවතින පුරුදු නිසා ඇති වන්නට ඇත. දැනට ලියවිලි පවත්වා ගෙන යෑම පිළිබඳ ව වෙනසක් ඇති කිරීමට උනන්දුවක් අත්‍යවශ්‍ය කරුණක් සේ පවතී. ඕනෑම නව අදහසක් ක්‍රියාත්මක වන්නේ ඒ පිළිබඳ ව උනන්දුවක් අදාළ නිලධාරීන් තුළ ඇති කරන තාක් පමණි.

මේ අධිෂ්ඨානය ඇති කර ගැනීමට බාධා වන සුළු ප්‍රශ්න ඇත. ඒවා නම්, දැනට පවතින අඩු වේතන ක්‍රම නිසා යතුරුලියන

භාවිතය තුළින් යම් සුළු ආදායමක් වැඩිපුර ලබා ගැනීමට සමහර ලිපිකරුවන් හා වෙනත් එවැනි නිලධාරීන් පෙළඹවීමට ඇති ඉඩකඩ ය. මෙය අධිකරණයේ ගාමක බලය ඉක්මන් කිරීමට ඇති බාධාවක් යැයි බොහෝ නීතිඥයෝ පෙන්වා දෙති. මේ කරුණ පිළිබඳ ව ඉහළ නිලධාරීන්ගේ අවශ්‍ය අවධානය යොමු වුව හොත් ඉතා කෙටි කාලයක් තුළ තාක්ෂණය යොදා ගැනීමට අවශ්‍ය වන උනන්දුව හා අධිෂ්ඨානය ඇති කළ හැකි ය.

මේ මාර්ගයෙන් නඩු ගොනු කිරීම හා ඒවා පිළිබඳ අවශ්‍ය සියලු තොරතුරු කෙටිකාලයක් තුළ ලිඛිත ව ලබා ගැනීම තුළින් අදාළ මහේස්ත්‍රාත් වරයාට ඒ පිළිබඳ ව නෛතික ව ගත යුතු තීන්දු ඉක්මනින් ගැනීමට හැකියාවක් ඇති වන අතර, එයින් අධිකරණයක් තුළ නඩු ගොනු වීම මගින් නඩු කල් යෑමට ඇති ප්‍රවණතාව අඩු කර ගත හැකි ය.

ඒ ගාමක ශක්තිය ඇති කර ගැනීමට සමහර නීතිඥයන් තුළ ඇති පළපුරුදුකම් ද වෙනස් කිරීම සඳහා ඔවුන් උනන්දු කළ යුතු ව ඇත. එය ලෙහෙසියෙන් කළ හැකි දෙයකි. තාක්ෂණය දක්ෂ ලෙස පාවිච්චි වන වෙනත් රටවල දක්නට ඇත්තේ, තාක්ෂණය පිළිබඳ අදාළ විධිවිධාන යොමු කිරීම මගින් නීතිඥයන්ට මෙන් ම අනෙක් අයට ද එයට හැඩ ගැසීමට සිදු වීමයි. එය ස්වභාවික දෙයකි. කරත්තයක ගිය අයෙකුගේ ඇති ගතිගුණ නූතන රථවාහනයක් පාවිච්චි කරද්දී වෙනස් වේ. අලුත් වාහනය තුළ ඇති ගාමක ශක්තියට අනුව හැඩ ගැසීමට බැරි වුවහොත් ඒ වාහනය පාවිච්චි කර ගැනීමට බැරි වේ. අපේ අධිකරණ පද්ධතිය තුළද මේ ගැටලුව පවතී. එය නිරාකරණය කර ගැනීම සඳහා ඉහළ නිලධාරීන් තුළ තාක්ෂණය යොදා ගැනීම සඳහා දැඩි උනන්දුවක් ඇති කිරීම මෙන් ම මේ පිළිබඳ ව ඇති වන සමාජ කතිකාවක් තුළින් ජනතාව මෙය ඉල්ලා සිටින තත්ත්වයක් ඇති කළ යුතු ය.

## මහේස්ත්‍රාත්වරුන්ගේ බලය පිළිබඳ ප්‍රශ්න

මහේස්ත්‍රාවරයෙකු සතු යුතුකම් අතර ප්‍රධාන යුතුකම වන්නේ යම් අයෙකු අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල ද එමෙන් ම ඔහු රඳවා ගැනීමට පොලිසිය මගින් කරන ඉල්ලීම කොතෙක්

දුරට නෛතික පදනමක් ඇත් ද කොතෙක් දුරට ඒවා සාධාරණ ද යන්න පිළිබඳ ව නිසියාකාර නෛතික තීන්දු ගැනීමයි. මෙසේ තීන්දු ගැනීමට බාධක වන කරුණු රාශියක් රටේ පසුගිය දශකයන් තුළ සිදු වූ කලබලකාරී තත්වය නිසා උද්ගත විය. අධිකරණයත් පොලිසියත් අතර පැවතුණු සම්බන්ධය තරමක් දුරට ලිහිල් වීමක් සිදු විය. ඊට හේතුව නම් අධිකරණයේ නියෝග නොතකා හැරීමේ විවිධ උපක්‍රම අදාළ පොලිස් නිලධාරීන් තුළ වර්ධනය වීම ය. රාජ්‍ය තන්ත්‍රය තුළ වැඩි බලය ඇත්තේ මහසේත්‍රාත්තුමාට බවත් මහේස්ත්‍රාත්වරයා ගේ රාජකාරියට සහාය දීම පොලිසියේ ඉතා වැදගත් කාර්යයක් බවත් යන කරුණ පිළිබඳ ව තිබූ සාම්ප්‍රදායික අදහස් පසුගිය කාලය තුළ යම් ගැටලු වලට භාජනය විය. විශේෂයෙන් ම ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න වලට පොලිස් නිලධාරීන් යොදවා ගැනීම නිසා ඇති වූ එක් පුරුද්දක් නම් අධිකරණයේ කර්තව්‍යයට සහාය දීමට වඩා ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න කරා යොමු වීම වැඩි වැදගත්කමක් ඇතැයි යන අදහසක් සමහර පොලිස් නිලධාරීන් තුළ ඇති වීමත්, ඒ මගින් තමුන් විශේෂ රාජකාරියකට යනවා ය යන කරුණ අධිකරණයට වාර්තා වීමට සලස්වා ඒ අවස්ථා වලදී ඔවුන් අධිකරණයට නොපැමිණෙන තත්ත්වයක් ඇති වීමත් ය. මේ මහේස්ත්‍රාත් වරයෙකුගේ යුතුකම් ඉටු කර ලීමට අත්‍යවශ්‍ය කොන්දේසිය නම් මහේස්ත්‍රාත්වරයාගේ තනතුර සම්බන්ධයෙන් පොලිසිය විසින් දරන අදහස් නීතිය මත පදනම් වූ ඒවා විය යුතු අතර, ඒ මහේස්ත්‍රාත් තුමාගේ නියෝග පිළිපැදීම නිතර ම සිදු විය යුතු ය. එසේ නොවුවහොත් ඒ තුළින් විශාල අසහනයක් නඩු වලට පැමිණෙන පුද්ගලයන්ට පමණක් නොව සමාජය තුළ ද පැතිරේ. මහේස්ත්‍රාත්තුමාට පොලිසියෙන් සලකන ආකාරය තුළින් එතුමාගේ නිලය හා බලතල පිළිබඳ ව අදහස් රෝපණය වේ. මහේස්ත්‍රාත්තුමාගේ බලය නොතකා හරින තත්ත්වයක් රජයේ නිලධාරීන් තුළින් සිදු වීම පටන් ගතහොත් එය සමාජයේ විනයට ඉතා ගැටලු ඇති කරයි.

## ඇප දීම පිලිබඳ ප්‍රශ්න

පසුගිය දශක තුළ විවිධ අපරාධ ක්ෂේත්‍ර පිළිබඳව ඇප දීමේ බලය මහේස්ත්‍රාත්වරයාගෙන් පැහැර ගැනීමට නීති වෙනස්

කිරීමක් සිදු වී ඇත. එවැනි නීති තුළින් කියැවෙන්නේ මේ අදාළ අපරාධය සම්බන්ධයෙන් ඇප ගැනීම සිදු විය යුත්තේ මහාධිකරණයකින් ය යනුවෙනි. මෙය බොහෝ දුරට පදනම් විරහිත නෛතික සම්ප්‍රදායක් ඇති කරයි.

මහාධිකරණයක විනිසුරුවෙකු වාගේ ම මහේස්ත්‍රාත්තුමෙකුට ද යමෙක් රඳවා ගැනීම නෛතික වශයෙන් සුදුසු ද නැතහොත් නුසුදුසු ද යන්නට පිළිතුරු දීමට හැකියාවක් ඇත. මහේස්ත්‍රාත්වරුන් පත් කරන්නේ ඔවුන්ගේ නීතිමය අධ්‍යාපනය හා ඔවුන් ලබා ඇති පළපුරුද්ද යන පදනම මත ය. මේ නිසා යම් අයෙකුට ඇප දීම සුදුසු ද නැද්ද යන්න තීරණය කිරීමේ හැකියාව මහේස්ත්‍රාත්වරයා තුළින් ගෙන මහාධිකරණයකට පැවරීමෙහි නෛතික සාධාරණත්වයක් ඇත්තේ නැත.

මෙසේ මහාධිකරණයකින් ඇප ලබා ගත යුතු ය යන්නට පදනම වෙන්නේ එක්තරා කාලයක් යම් බරපතළ යැයි කියන අපරාධයක් සිදු කළ විට එසේ සිදු කළා යැයි සැක කරන පුද්ගලයා රිමාන්ඩ් භාරයේ තබා ගැනීමට මාවතක් සැලසීම සඳහා ය. අපරාධය කොතරම් බරපතළ වුවත් ඒ අපරාධය නඩු විභාගයකින් සැකයෙන් තොර ව ඔප්පු කරන තුරු ඕනෑම පුද්ගලයෙකුගේ අහිංසකභාවය පිළිගැනීම අපේ නීතික්‍රමයේ මූලික පදනමක් වේ. මේ පදනම නොතකා පුද්ගලයන් දීර්ඝකාලීන ව රිමාන්ඩ් භාරයේ තබා ගැනීමට අවශ්‍ය නම් ඒ බව නීතිගත කළ යුතු අතර එය වක්‍රාකාරයෙන් සිදු කර ගැනීම අධිකරණ පද්ධතියට ගැටලු ඇති කරයි. සමහර අවස්ථා වල දී ත්‍රස්තවාදය පිළිබඳ ව ප්‍රශ්න කරන විට එවැනි දේ සඳහා පුද්ගලයන් රඳවා ගැනීමේ කාලය සාධාරණ ආකාරයකින් දිග්ගැස්සීම අවශ්‍ය විය හැකි ය. මෙවැනි අපරාධ පරීක්ෂණ පැවැත්වීම ඉතා අපහසු කාර්යයක් වන නිසාත් එවැනි පුද්ගලයෙකු සමාජයේ නිදැල්ලේ හැසිරීම තුළින් තවත් ත්‍රස්තවාදී ක්‍රියාවලට ඔහු යොමු විය හැකි නිසාත් සමහර අවස්ථා වල දී මෙවැනි විශේෂ විධිවිධාන යෙදීම සිදු විය හැකි ය. ඒවා නෛතික වශයෙන් ඉතා පැහැදිලි ව කළ යුතු ඒවා මිස වක්‍රාකාරයකින් මේ අධිකරණයෙන් නොව ඊට වඩා ඉහළ අධිකරණයකින් ඇප ගත යුතු ය යන නියෝග පැනවීම තුළින් ගැඹුරු නෛතික ගැටලු ඇති වේ. එමෙන් ම මහේස්ත්‍රාත්වරයාගේ බලය පිළිබඳ ව ද ව්‍යාකුලත්වයක් පැන නගී.

සාමාන්‍ය නීතිය තුළ ඇප නොදී සිටීම සඳහා පිළිගත් සමහර කරුණු ඇත. ඒවා නම් යම් අයෙකුට ඇප දුනහොත් ඔහු හෝ ඇය මගින් ඔවුන්ට විරුද්ධ ව පැමිණිලි කළ අයට හා සාක්ෂිකරුවන්ට බරපතළ තර්ජන කිරීමට හැකියාවක් ඇත යන කරුණ ඉන් එකකි. මෙය ඕනෑම අපරාධයක් පිළිබඳ ව බලපායි. මෙහි දී ඔහුගෙන් ඇත්තෙන් ම එවැනි තර්ජනයක් ඇත යන්න ඔප්පු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කිරීම පොලිසියේ යුතුකමකි. ඒ ඉදිරිපත් වන කරුණු සලකා බලා මහේස්ත්‍රාත්වරයා ඒ අනුව අදාළ පියවර ගනී. ඇත්තවශයෙන් ම එවැනි තර්ජනයක් නොමැති අවස්ථා වල දී පොලිසිය යම් අයෙකු ටික කාලයක් අත්අඩංගුවේ රඳවා ගැනීම සඳහා කරන ඉල්ලීම් වල නීත්‍යානුකූලභාවය සලකා බැලීමේ වගකීම ද පැවරෙන්නේ මහේස්ත්‍රාත්වරයාට ය.

මහේස්ත්‍රාත්වරයෙකුගේ ප්‍රධානම යුතුකම වන්නේ තමන් ඉදිරියට එන සැකකරුවාගේ අයිතිවාසිකම් සීමා කිරීමක් කරන්නේ නම් එය පිළිගත හැකි නෛතික පදනම මත කළ යුතු බව ය. මහේස්ත්‍රාත්වරයෙකු විසින් සැකකරුවකුගේ අයිතිවාසිකම් රැකීමත් ඔහු අදාළ නෛතික කාර්යය සඳහා අධිකරණයකට පැමිණෙනවා ය යන්න තහවුරු කිරීමත් කළ යුතු ප්‍රධාන යුතුකමකි. මෙය බැරෑරුම් තීන්දු ගැනීමකි. මේ සඳහා අවශ්‍ය නිදහස මහේස්ත්‍රාත්වරුන්ට තිබිය යුතු අතර ඒ නීති කටයුත්තට සහයෝගය දීම සියලු දෙනාගේ ම යුතුකමකි. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විසඳුම් ලැබූ යම් නඩු වල දී පවා මේ කරුණු පිළිබඳව සාකච්ඡාවට භාජනය වී ඇත. හුදෙක් ම පොලිසියෙන් හෝ පැමිණිලි කරුගෙන් කෙරෙන ඉල්ලීම මත පමණක් ම ඇප පිළිබඳ තීන්දු නොගත යුතු බවත් අදාළ කරුණු සලකා බලා ඒ පිළිබඳ ව තීන්දු ගත යුතු බවත් මේ නඩු තීන්දු වලින් තහවුරු කොට ඇත.

## අත්අඩංගුවට ගත් පුද්ගලයින් ආරක්ෂා කිරීම

යමෙකු අත්අඩංගුවට ගත යුත්තේ ඒ පිළිබඳ සාධාරණ හේතු පවතින තාක් දුරට පමණි. හුදෙක් ම යම් අයෙකු විසින් පැමිණිල්ලක් කළ පළියට ඔහු අත්අඩංගුවට ගැනීමට හැකියාවක් නැත. අදාළ පැමිණිල්ල භාරගන්නා පොලිසිය විසින් සිදු වුණා

යැයි කියන අපරාධයත් ඒ අපරාධයට සැකකරුවාගේ ඇති සම්බන්ධයත් එයට සම්බන්ධ සාක්ෂි එකතු කොට ඇත්තෙන් ම මේ සැකකරු ගැන සැක කිරීමට තරම් කරුණක් ඇද්ද යන්න නිගමනය පොලිසියේ ස්ථානාධිපතිවරයා විසින් ගත යුතු ය. පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ගන්නා තීන්දු වල නිවැරදි භාවය අදාළ සහකාර පොලිස් අධිකාරීවරුන් විසින් විමර්ශනයට නිතර ම භාජනය කළ යුතු ය. කිසිවකු නිකරුණේ අත්අඩංගුවට නොගැනීම අපරාධ පිළිබඳ නීතියේ ඉතා තදින් ස්ථාවර කර ඇති පදනමකි.

අදාළ සාක්ෂි තාක්ෂණය මගින් ලිඛිත ව ලබා ගැනීම සඳහා කටයුතු යෙදීම තුළින් මහේස්ත්‍රාත් තුමෙකුට තමන් ගන්නා තීන්දුවට අදාළ සියලු ම කරුණු කෙටි කාලයක් තුළ ගොනු කර ගත හැකි ය. එමෙන් ම බරපතළ ප්‍රශ්න සම්බන්ධයෙන් නීතිඥවරුන්ගේ මැදිහත්වීම් බොහෝ දුරට ලිඛිත ව කිරීමට මාවත සැලසීම මගින් ද අනවශ්‍ය ලෙස නඩු පිළිබඳ වාචික සාකච්ඡා පැවැත්වීම අඩු කළ හැකි ය. වාචික ව කරුණු දැක්වීමේ අයිතිය නීතිඥ වෘත්තියට අයිති වරප්‍රසාදයකි. එහෙත් එහි අවශ්‍යතාව අතීතයේ පැවතුණු ආකාරයෙන් ම කර ගෙන යෑමට අවශ්‍යතාවක් නැත. අද තාක්ෂණය මගින් අදාළ දේශන වලට අදාළ වන මූලික කරුණු හා අදාළ නීතිය මෙන් ම නඩු තීන්දු වලදී දී ඇති තීන්දු අධිකරණය ඉදිරියට ගෙන ඒම ඉතා පහසු කාර්යයක් ව පවතී. මේ මාර්ගයෙන් මහේස්ත්‍රාත් තුමා ඉදිරියට අදාළ සියලු ම කරුණු කෙටි කාලයක් තුළ ගොනු කර ගත හැකි වන අතර ඒ මගින් අත්අඩංගුවට ගැනීම සාධාරණ ද නැද්ද තවදුරටත් රඳවා ගැනීමට තරම් හේතුවක් තිබේ ද නැද්ද ආදි කරුණු පිළිබඳ ව නිසි පියවර ගැනීමට හැකි වේ.

අත්අඩංගුවට ගන්නන් පිළිබඳව මහේස්ත්‍රාත්වරුන් සතු තවත් වගකීමක් නම් අත්අඩංගුවට ගත් කාලය තුළ දී ඔවුන්ට වධහිංසා කිරීමක් සිදු වී තිබේද නැද්ද යන්න පිළිබඳ ව සලකා බැලීම ය. විශේෂයෙන් ම ලංකාව පුරා පැතිරී පවතින වධහිංසාව ඉතා සුලභ සිද්ධියක් වන හෙයින් එය නැති කිරීම සඳහා මහේස්ත්‍රාත්තුමන්ලාගේ මැදිහත්වීම අත්‍යවශ්‍ය ම කොන්දේසියක් වේ. නිසිලෙස පහරදීම් පිළිබඳ ව මෙන් ම අදාළ කාලයට වඩා වැඩි කාලයක් යමෙකු පොලිස් ස්ථානයක් තුළ රඳවා ගෙන තිබේ

ද යන්න සලකා බැලීම ආදිය සම්බන්ධයෙන් කරුණු සලකා බලා ඒ පිළිබඳ ව අවශ්‍ය තීන්දු ගැනීම තුළින් අදාළ පුද්ගලයාට පමණක් නොව පොලිස් නිලධාරීන්ගේ විනය දියුණු කිරීම සඳහා ද සමාජ සාමය දියුණු කිරීම සඳහා ද මහේස්ත්‍රාත් තුමෙකුට කළ හැකි සේවය ඉමහත් ය.

සමාජය තුළ මහේස්ත්‍රාත්වරුන්ගේ කාර්යය පිළිබඳ ව ඉතා ප්‍රබල මහජන මතයක් ඇති කළ යුතු ව ඇත. ඒ මගින් එතුමන්ලාගේ කාර්යයේ ඇති ඉතා බරපතළ ස්වභාවය හා වැදගත්කම මහජනයාට ඒත්තු කර දීමට හැකි වනු ඇත. එහෙත් අවසාන වශයෙන් ඒ ඒත්තු ගැන්වීම සිදු වන්නේ කොතෙක් දුරට මහේස්ත්‍රාත්වරුන් මේ යුතුකම් ඒ ආකාරයෙන් ම ඉටු කරනවා ද යන කරුණ ද දෙවනුව මහේස්ත්‍රාත් වරුන්ගේ බලය සීමා කිරීම සඳහා ඇති නීති අවලංගු කර දැමීම තුළ ය. රටේ සියලු ම අයිතිවාසිකම් රැක ගැනීම සඳහා මෙය ආධාරකයක් වෙයි.

විශේෂයෙන් ම ප්‍රකාශනයට ඇති අයිතිය හා සංවිධානය වීමට ඇති අයිතිය තහවුරු වන්නේ අනවශ්‍ය ලෙස අත්අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම් නැති කර ගැනීමට තරම් නීති ක්‍රමය තුළ ශක්තියක් පවතින බව ජනගත කිරීමෙන් පමණි.

මහේස්ත්‍රාත් අධිකරණයක ජනතාව වෙනුවෙන් තිබිය යුතු පහසුකම් පවතිනවා ද යන්න සොයා බලා ඉහළ නිලධාරීන් විසින් පියවර ගත යුතු ය. උදාහරණයක් වශයෙන් රිමාන්ඩ් භාරයේ සිට ගෙන එන සැකකරුවන්ට මෙන් ම නඩු සඳහා එන පුද්ගලයන්ට ද අවශ්‍ය වැසිකිළි හා වෙනත් පහසුකම් පවතිනවා ද යන්න සොයා බැලිය යුතු ය. මේ සියල්ල අධිකරණයේ ගරුත්වය පිළිබඳ ප්‍රශ්නයකි. බාහිර වශයෙන් පවා අධිකරණය ඉතා හොඳින් පවත්වා ගෙන යන සමාජ සංස්ථාවක් ය යන්න ජනගත කිරීම අවශ්‍ය වේ. එමෙන්ම නඩු වලට පැමිණෙන්නට අවශ්‍ය පහසුකම් හා පිරිසිදුකම ද රැක ගැනීම අධිකරණ පද්ධතියක් කෙරෙහි ජනතාවගේ පැහැදීම මෙන් ම කීකරුකම ලබා ගැනීම සඳහා ද අත්‍යවශ්‍ය කරුණකි. මේ කරුණු අද ලෝකයේ බොහෝ අධිකරණ පද්ධති වල පවත්වා ගෙන යයි.

# 11.
# රට ලෝකයට ණය වෙලා....
# රට්ටු එකිනෙකාට ණය වෙලා....

විවිධ මතවාද පිළිබඳ රටේ ආතතියෙන් යුතු සාකච්ඡා පවත්වන නමුත් රට තුළ කළ හැකි, නොහැකි දේවල් තීන්දු කරන අවසාන සාධකය ලෙස පවතින්නේ රට මුහුණ දී තිබෙන අති බරපතල ණයගැති භාවයයි. ජාත්‍යන්තර ආයතන වලට හා රට වලට ලංකාවේ ඇති ණය ප්‍රමාණය බිලියන 56 යැයි කියැවේ. ඒ මුදල් සඳහා සාමාන්‍යයෙන් වාර්ෂික ව ගෙවිය යුතු පොළිය 7% ක ප්‍රමාණයකි. රටේ ජනතාවගේ අවශ්‍යතා පිරිමැසීමට වඩා බලයට පත් වන ඕනම ආණ්ඩුවක මූලික ප්‍රශ්නය වන්නේ මේ ණයගැති භාවයට මුහුණ දෙන්නේ කෙසේ ද යන්නයි.

ඒ ණයගැති භාවය තුළින් ජනතාව පත් වී ඇති තත්ත්වය නම් සැම කෙනෙක් ම ජීවත් වන්නේ වෙනත් අයගෙන් ලබා ගන්නා ණය මත ය. විශේෂයෙන් ම ගම්බද පළාත් වල රටේ වැඩි කොටසක් වන දුගී ජනතාව අතර එදිනෙදා ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ණය ලබා ගැනීම සිදු වේ. සමහර වෙලාවට යම් මවක් ණය ලබා ගන්නේ දරුවන්ට හා පවුලට එදිනෙදා ආහාර සපයා දීමට ය. මෙසේ ගන්නා ණය වලට ද ඔවුන්ට පොළී ගෙවීමට සිදු වේ. එහෙත් මේ ණය ගෙවා දැමීමට තරම් ආදායමක් ඔවුන්ට අත්පත් කොට ගත නොහැකි ය. යම් විදිහකින් එකතු වන මුදලක් දැනට පවතින ණය ගෙවා දැමීමට යෙදූ කල, ඊළඟට ජීවත් වීමට නැවත ණය ගැනීමට සිදු වේ. මේ ආකාරයෙන් වර්ෂය පුරා ම හා ජීවිත කාලය පුරා ම ණය ලබා ගැනීමේ චක්‍රයක් ඔවුන්ගේ ජීවිත තුළට ඇතුල් වේ. ඒ ප්‍රශ්නයට විසඳුමක් සොයා ගැනීම සඳහා

මාවත් සෙවීම ඔවුන්ගේ මොළයට වද දෙන ප්‍රධාන කරුණක් වුවත් එසේ සොයා ගත හැකි මාවත් රට තුළ පවතිනවා නම් එසේ ඇත්තේ ද අල්ප වශයෙනි.

පිටරටින් ණය ගන්නා ආණ්ඩුව වැටී සිටින්නේ ද ඒ තත්වයට ය. ගත් ණයට පොළී ගෙවීම සඳහා රටට එන විදේශ සම්පත් වැය කරන අතර එසේ වැය කරන සම්පත් ඒ ණය සඳහා පොළී ගෙවීමට කෙසේවත් සෑහෙන්නේ නැත. මේ නිසා ආණ්ඩුව වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් හා රටවලින් තවත් ණය ගනී. ඒ ණය නිසා සමස්ත ණය ප්‍රමාණය තවත් වැඩි වනවා පමණක් නොව ගෙවිය යුතු පොළිය ද අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වී යයි.

අතීතයේ දී ගැමියන් කෙරෙහි මේ ප්‍රශ්නය බලපෑ ආකාරය ලෙනාඩ් වුල්ෆ් නමැති ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් ලේඛකයා විසින් රචිත බැද්දේගම යනුවෙන් පරිවර්තනය වී ඇති නවකතාව තුළින් හෙළි කර ඇත. ඒ කතාව සිනමා චිත්‍රපටයක් හැටියට ද පටිගත කර පෙන්වන ලද්දේ දැනට දශක ගණනාවකට පෙර ය.

එහි දී පෙන්නුම් කරන්නේ ගමක දිරිමත් තරුණයෙකු දියුණු වීමේ අදහසින් යම් ඉඩම් කොටසක් වෙන් කරවා ගෙන එය වවන්නට ගන්නා උත්සාහය ය. ඒ ඉඩම් කොටස වෙන් කරවා ගැනීම සඳහා රාජ්‍ය නිලධාරීන්ට හා ප්‍රාදේශීය බලවතුනට ගැති භාවයක් ඇති කර ගැනීමට ගැමියන්ට සිදුවේ. ඉන් පසු වැවීම සඳහා අවශ්‍ය වී, ණයට ගැනීමට සිදු වූයේ පළාතේ සැරිසරන මුදලාලිගෙනි. වැවීම අවසන් වී අස්වැන්න ලැබෙන කාලය වන විට ඒ මුදලාලි ගමට පැමිණෙන්නේ ඔහුගෙන් ගත් ණයත් ඊට අදාළ පොළියත් අය කර ගැනීමට ය. ඒ සඳහා ඔහුට රජයේ නිලදරන්නන්ගෙන් හා ගමේ ප්‍රබලයන්ගෙන් ආධාර ලැබේ. ගැමියාට තමන් විසින් වවා වැඩි දියුණු කෙරුණු කුඹුරේ අස්වැන්න මුදලාලිට ණය හා පොළී ගෙවීමට දීමට සිදු වේ. එසේ දීමෙන් පසු නැවත වගාව ඊළඟ වාරයේ දී කිරීමට නැවත ණය ගැනීමට සිදු වේ. මේ ආකාරයෙන් ණය චක්‍රයේ දී ගොවියාගේ ජීවන මාර්ගය මෙන් ම ජීවිතයේ තේරුම ද අකාමකා දමනු ලැබේ.

ණය බරින් පිරුණු ගොවියා ඇත්තෙන් ම ගෙවන්නේ එක් ආකාරයක වහල් ජීවිතයකි. මෙයින් ද ප්‍රයෝජන ගැනීමට මුදලාලි

උත්සාහ කරයි. තමන්ගේ ලිංගික වුවමනා සඳහා ගොවියාගේ බිරිඳ පවා ඉල්ලා සිටීමේ තත්ත්වයක් ඔහු තුළ නිර්මාණය වේ. එසේ ඉඩ නොදීමට තරම් තවමත් මානසික ධෛර්යයක් පවතින ගොවියෙකු ඒ අශීලාචාර ඉල්ලීම් වලට විරුද්ධ වූ විට ඔහුට විරුද්ධ ව බොරු නඩු දමා ඔහු සිරගත කරන තත්ත්වයක් ද බලවතුන්ගේ මාර්ගයෙන් නිර්මාණය කිරීමට හැකි වේ. අවසානයේ දී ධෛර්යයෙන් වැවිල්ලක් කරගත් තරුණයාට සිදු වන්නේ සිරගෙදරට යැමටත් ඉන් පසු එහි දී ජීවිතය නැති කර ගැනීමටත් ය.

මේ සියලු දේ දැක ඒවායින් තදබල කළකිරීමට හා තරහට පත් වන ඒ තරුණයා ගේ මාමණ්ඩිය කරන්නේ අවසානයේ දී ඒ මුදලාලිවත් ඔහුට අනුබල දුන් ගමේ ප්‍රධානීන්වත් මරා දැමීම ය.

ඉහත සඳහන් කෙරෙන ක්‍රියාවලිය හා ඒ තුළින් මතුවී ඇති ප්‍රශ්න දැන් නැති වී තිබේ ද?

රටේ සිදු වන විවිධ සිදුවීම් සුපරික්ෂාකාරී ව බලන කල ඉතා පැහැදිලි ව ප්‍රකාශයට පත් වන්නේ ඒ තත්ත්වය හා එය නිර්මාණය කරන මානසික තත්වය රට පුරා තවමත් පැතිරී පවතින බව ය. බොහෝ විට වර්ගවාදී ප්‍රශ්න හෝ ජාතිවාදී හෝ ආගමික ප්‍රශ්න වශයෙන් එළි දකින්නේ සමාජ ගර්භය තුළ ඇති මේ ගැඹුරු ආර්ථික ගැටලු ය. ණය ගැති බවේ ප්‍රතිඵල රට තුළ පවතින අරාජික බවේ හා අස්ථාවරත්වයේ මූලාශ්‍ර වී පවතී.

එදා මුදලාලි හා ගම්මුලාදෑනි ගෙන ගිය දූෂිත සූරාකෑම අද රාජ්‍ය තන්ත්‍රය තුළට ම පැතිරී ගොස් ඇත. ලැබෙන සෑම අවස්ථාවක දී ම පගාවක් සඳහා යොමු කර ගන්නා මානසික තත්ත්වය රට පුරා ම පවතී. මේ මානසික තත්වය තුළින් හා ඒ දූෂිත ක්‍රියා තුළින් ඇති වන මන්දගාමීත්වය ද එලෙස ම රටපුරා පැතිරී පවතී. අකාර්යක්ෂම හා බුද්ධිගෝචර භාවයෙන් තොර සමාජයක් සෑම අස්සක් මුල්ලක් නෑර ම පැතිරෙන්නට පටන් ගනී. එදා ගම්මුලාදෑනියන්ගේ අතින් සිදු වූ කාර්යය ඊට වඩා හොඳින් කර ගෙන යන්නේ දේශපාලනඥයන් විසිනි. '225 ම එපා' යනුවෙන් රටපුරා දැන් ප්‍රකාශයට පත් වන විවිධ කතා හා ලියවිලි තුළ ගැබ් ව ඇත්තේ මහජනතාව තමන්ගේ දේශපාලනඥයන් කරන කර්තව්‍යය ඉතා ගැඹුරින් ම වටහා ගෙන ඇති බව ය. දේශපාලනඥයා හොරෙකි, බොරු කාරයෙකි හා වංචාකරුවෙකි, දෙඩවිලිකාරයෙකි යන මතය ජනතාව තුළ ඇති සමස්ත මතය වේ.

එමෙන් ම දරුවන්ගේ මන්ද පෝෂණය හා ළඟ දී ප්‍රකාශයට පත් වූ 'සාගින්න නිසා දරුවෙකු මිය ගියේ ය' යන ප්‍රකාශය ණය බර ලංකාවේ වැඩි කොටසක් වන දුගී ජනතාව තුළ පැතිර පවතින්නේ කෙසේ ද යන්න පිළිබිඹු කරයි. විසඳුමක් නැති බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන ජනතාව අවසානයේ මෙවැනි ඛේදවාචකවලට මුහුණ දෙති.

ණය බර භාවය තුළින් නිර්මාණය කරගත් දේශපාලන ක්‍රමය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය ආරක්ෂකයන් තුළ ද ඇත්තේ අකර්මන්‍යතාව හා මන්දගාමී මානසික තත්ත්වයයි. ඒ තත්ත්වයෙන් ප්‍රයෝජන ගැනීමට ඉදිරිපත් වන්නේ අන්තවාදී ත්‍රස්තවාදීන් ය. අන්තවාදී ත්‍රස්තවාදීන් ලංකාව ඉතා ලෙහෙසියෙන් තමන්ගේ අරමුණු ඉටු කර ගත හැකි තැනක් සේ හඳුනාගෙන තිබේ ය යන්න මේ අවුරුද්දේ පාස්කු ඉරිදා දින සිදු වූ සිදු වීමෙන් හෙළිදරව් වී ඇත. තමන්ගේ දුෂ්ට ක්‍රියාකලාපය වැඩි අමාරුවකින් තොර ව ඉටු කර ගත හැකි තැනක් සේ යම් ප්‍රදේශයක් දුටු කල, එයින් ප්‍රයෝජනයට ගන්නේ ත්‍රස්තවාදීන් මෙන් ම සියලු ම වර්ගයේ අපරාධකාරයින් ය. කුඩු ජාවාරම, දරුවන් හා ගැහැණුන් වෙළඳාම් කිරීමේ ප්‍රයත්නය, සියලු ම භාණ්ඩ ගුණාත්මකභාවයෙන් අඩු කර විකිණීම ආදි දහසකුත් ප්‍රශ්න වල මූල බීජය වී පවතින්නේ ලංකාව මුහුණ දී ඇති සමස්ත තත්වය යටතේ දී ය.

එහෙත් දැනට ජනතා පිබිදීම් ඇතැයි කියන නමුත් ඒ පිබිදීම් සිදු වී තිබෙන්නේ ජාතිවාදී, ආගම්වාදී, වර්ගවාදී දිශාවලට මිස මේ සියල්ලට ම පසුබිම සලසන ණය පිළිබඳ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ගැඹුරු කතිකාවක් ඇති කර ගැනීම සඳහා නොවේ. රටේ ප්‍රධාන අවශ්‍යතාව ආර්ථික ගැටලු පිළිබඳ ව ඇති කර ගත යුතු මහා කතිකාවකි. ඒ කතිකාව තුළින් යම් සහනයක් උදා වේ නම් ඒ තුළින් දැනට පවතින වෙනත් ගැටලු බොහෝ දුරට අඩු කර ගැනීමට හෝ සමහන් කර ගැනීමට හැකි වනු ඇත.

එහෙත් ආණ්ඩු තන්ත්‍රය තුළ ඇති කඩාවැටීම නිසා ණයෙන් මිදීම ගැන බලවත් කථිකාවක් ඇති වීමට අවශ්‍ය ඉඩකඩ ඇහිරී ඇත.

# 12
# නඩු පමාව මහා පාපයකි - රටටම ශාපයකි

2002 දී වත්තල ජීවත් වූ ජෙරාල්ඩ් පෙරේරා නමැති තරුණ මහත්මයෙකු වත්තල පොලිසියේ නිලධාරීන් විසින් ඉතා දරුණු ලෙස වධහිංසාවට ලක් කෙරිණි. කොපමණ ප්‍රමාණයක වධහිංසාවක් ද කියතොත් ඔහුගේ වකුගඩු ක්‍රියාත්මක නොවන තරමට පහර දී තිබුණි. දින ගණනාවක් ම ඔහු සිහිය නැති ව සිටියේ ය.

මේ වධහිංසාව පිළිබඳ පැමිණිලි සියලු ම බලධාරීන් වෙත ඉතා කෙටි කාලයක් තුළ දී දැනුම් දෙන ලදි. එසේ වුවත් මේ වධහිංසාවට විරුද්ධ ව අධිකරණයකින් නඩු තීන්දුවක් දුන්නේ 2019 ජුනි මාසයේ දී ය. එනම් සිද්ධියට හරියට ම අවුරුදු 16 කට වඩා පමා වීමෙන් පසු ව ය. අදාළ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට මේ නඩු තීන්දුවේ දී අවුරුදු 10 කට සිරදඬුවම් නියම විය. වධහිංසාව සම්බන්ධයෙන් පමුණුවා ඇති බරපතළ ම දඬුවම මෙය වශයෙන් වාර්තා වනු ඇත. එසේ වුවත් මතු වන මූලික ගැටලුව නම් අවුරුදු 16 කට පසු කාලයක දී දෙන නඩු තීන්දුවකින් යුක්තිය පිළිබඳ ව හා නීතිය පිළිබඳ ව ඇති වන සාධනීය ප්‍රතිඵල මොනවා ද යන්න ය. වරදකරුවන්ට දඬුවම් කිරීම පිළිබඳ ව මූලික ව ම බලපාන කරුණු ගණනාවක් පවතී. ඒවා ශතවර්ෂ ගණනාවක් තිස්සේ නීතිය පිළිබඳ ව පැවැත්වූ දාර්ශනික සාකච්ඡා මගින් හැඩගැසුණු අදහස් ය. වරදකට දඬුවම් කිරීමේ දී ප්‍රධාන ප්‍රතිලාභය ලැබිය යුතු වන්නේ සකල සමාජයට ය. ඒ දඬුවම් කිරීමේ අරමුණ වන්නේ යම් අපරාධයක් කළ හොත්

ඒවාට අනිවාර්යයෙන් දඬුවම් ලැබෙන බව සමාජයට ඒත්තු ගැන්වීම තුළින් සමාජයේ මතය වෙනස් කිරීම හා ගතිපැවතුම් හා හැසිරීම් රටාව වෙනස් කිරීම ය. එසේ කිරීමෙන් මිනිස් බුද්ධිය තුළට ඇතුළු වන අදහස වන්නේ මෙවන් දෙයක් කළ හොත් මට ද මෙවැනි දඬුවමක් විඳින්නට සිදු වේ ය යන්න ය. එහෙයින් ඒ වරද කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභයට වඩා වරද නොකිරීමෙන් ලැබෙන ප්‍රතිලාභය වැඩි ය. මේ නිසා මෙවැනි වරදක් නොකළ යුත ය යන අදහස එයි.

අවුරුදු 16 ට පසු ව ලැබෙන නඩු තීන්දුවකින් මේ ප්‍රතිඵලය ලබා ගත හැකි ද ?

මේ වන විට සකල සිද්ධිය සමාජයට බොහෝ දුරට අමතකවූ එකකි. වධහිංසාවට භාජනය වූ පුද්ගලයා ගේ එනම් වින්දිතයා ගේ කිට්ටු ම නෑදෑ හිතවතුන් හා සමහර විට ඒ නඩුවට සහභාගි වූ නීතිඥයා ගේ හෝ වෙනත් මෙයට සම්බන්ධ මානව හිමිකම් ක්‍රියාධරයන් ගේ මතකයේ මේ නඩුව පැවැතිය හැකි වුවත්, සාමාන්‍ය සමාජයෙන් මේ සිද්ධිය අමතක වී ඇතුවාට කිසි ම සැකයක් නැත. මේ නිසා දඬුවමේ ප්‍රධාන පණිවිඩය එනම් අපරාධ පිළිබඳව බුද්ධිමය අවබෝධයක් ඇති කිරීම, පමා වී දෙන නඩු තීන්දු වලින් සිදු වන්නේ නැත.

ඊට කෙළින් ම ප්‍රතිවිරුද්ධ දෙයක් සිදුවීමට පුළුවන. එනම් අපරාධයක් කිරීමෙන් පසු අවුරුදු 16 ක කාලයක් හෝ දඬුවමින් වැළකී සිටීමට හැකි ය යන අදහසයි ඒ. එය ඉතා භයානක ය. ඒ මගින් අපරාධ කිරීමට ඇති පැකිළීම නැති වෙයි. දඬුවම අහම්බයක් බවට පත් වේ. ඉන් අදහස් වන්නේ දඬුවමින් ගැලවීමට ඒ අවුරුදු 16 ක කාලය ම යොදා ගත හැකි අතර ඉඳහිට හැර බොහෝ අවස්ථා වල දී දඬුවමින් වැළකී සිටීමට හැකි උපක්‍රම අපරාධ කරු හට දරා ගත හැකි වීම ය.

උදාහරණයක් වශයෙන් ජෙරාල්ඩ් පෙරේරා ගේ වධහිංසා නඩුවේ මුල් අවස්ථාවේ දී ම ඒ නඩුව ඇසූ විනිශ්චයකාරවරිය සියලු ම සැකකරුවන් නිදොස් කොට නිදහස් කර දැම්මේ ය. ඒ නිදොස් කර නිදහස් කර දැමීම සාවද්‍ය බව පසු ව අභායාචනාධිකරණය විසින් තීන්දු කෙරිණි. මහාධිකරණයේ තීන්දුවත් ඇපෑල් අධිකරණයේ තීන්දුවත් අතර අවුරුදු ගණනාවක් ගත වී තිබේ. ඉන්පසු අපරාධකාරයින් ගේ උපක්‍රමය වූයේ ශ්‍රේෂ්ඨාධිකරණය

කරා යෑම ය. එහෙත් කාලයක් ගත වී අවසානයේ දී ඇපෑල් උසාවියේ නඩු තීන්දුව සනාථ කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුව ලබා දුනි. මේ අනුව නැවත වරක් මීගමුව මහාධිකරණයට ම ඒ නඩුව නැවත ඇසීමට යැවිණි. ඒ නැවත ඇසීමට කෙටි කාලයක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කළත් ඇත්තෙන් ම ඒ සිදුවීමෙන් පසු අවුරුදු ගණනාවක් තිස්සේ මේ නඩුව ඇදී ගියේ ය.

අපරාධකාරයන් විසින් තවත් උපක්‍රමයක් පාවිච්චි කෙරිණි. එනම් වින්දිතයා අධිකරණය ඉදිරියට පැමිණ ඔහුට සිදු වූ වධහිංසාව පිළිබඳ ව සාක්ෂි දීමට පෙර ඔහු මරා දැමීමයි. එනම් බස් රථයකින් ගමන් කරමින් සිටියදී, පොලිස් පරීක්ෂකවරයෙකු විසින් වාහනයක දමා ගෙන ආ මැරයෙකු ඒ බස් රථයට නංවා ඉන් පසු ඔහු ජෙරාල්ඩ් පෙරේරා ගේ අසුනට පිටුපස අසුනෙන් හිඳගෙන ඔහුට වෙඩි තැබුවේ ය. මෙහි අදහස වූයේ ඇසින් දුටු සාක්ෂි එනම් තමාට වධහිංසාව කළේ කවුද කියා අධිකරණයට කියා පෑමට ඇති අයිතිය වින්දිතයාට අහිමි කිරීම ය. මෙයින් බලාපොරොත්තු වූයේ සාක්ෂි නැතිකම උඩ වධහිංසා නඩුවෙන් ගැලවීම ය.

එමෙන් ම අපරාධකරුවන් ගේ හා ඔවුන් වෙනුවෙන් පෙනී සිටි අය ගේ තවත් උපක්‍රමයක් වූයේ විවිධාකාර හේතු මත නඩුව පුළුවන් තරම් කල් දමා ගැනීම ය. ඒ අනුව නඩුව කල් ගත වීමට වගකිව යුත්තේ විවිධාකාර හේතු මත කල් ගත කරන ලද අපරාධකරුවන් ගේ නීතිඥයන් ය.

මේ සියල්ල පසුපස මහජන මතය තුළ ඇති වූ වෙනස්කම් වූයේ කොච්චර ලොකු අපරාධයක් වුවත් එයට විරුද්ධ ව යුක්තිය ඉල්ලා සටන් කිරීමට යෑම බොහෝ දුරට නිශ්ඵල ක්‍රියාවක් මෙන් ම අපරාධකරුවන්ට වැඩි වාසි පවතින වාතාවරණයක් තුළ කළ යුතු බව ය. මෙහි දී නෛතික දර්ශනයේ මූලික අදහසක් බරපතළ ලෙස උල්ලංඝනය විය. එනම් ඕනෑම බලධාරිත්වයක පදනම අවසාන වශයෙන් පිහිටුවන්නේ මහජනතාව ගේ මනස තුළ ඒ ආයතන පිළිබඳ ව පවතින විශ්වාසය මත ය යන අදහස ය. චීනයේ සදාචාරධර්ම පද්ධතිය ගොඩනැගීමට මුල් වුණු කොම්පියුසස් නමැති පඬිවරයා ප්‍රකාශයට පත් කළේ සියලු ම ආකාරයේ ප්‍රසිද්ධ ආයතන හෝ රජවරුන් ඔවුන් ගේ බලධාරිත්වය තහවුරු කිරීම සඳහා බලපාන මූලික ම කරුණ

නම් මහජනතාව ගේ විශ්වාසයක් තදින් තහවුරු වී තිබීම යන්න ය. මෙය නෛතික දර්ශනයෙහි ද ඉතා ප්‍රබල ම අදහසක් සේ පවතී. ජෙරාල්ඩ් පෙරේරා ගේ නඩුවට ගත වූ මේ දීර්ඝ කාලය තුළ සිදු වූයේ වධහිංසා වලට භාජනය වුණු මෙන් ම, වෙනත් ඊටත් වඩා අපරාධ වලට භාජනය වුණු, උදාහරණයක් වශයෙන් අතුරුදන්වීම් වැනි අපරාධ වලට මුහුණ දීමට සිදු වූ අය ගේ පවුල් වලට වූ හානිය ආදිය සඳහා උත්තරයක් සොයා ගැනීමට මාවතක් නැති ය යන අදහස ඉතා ගැඹුරින් සමාජගත වීම ය. අපට පුතේ මගක් නැතේ ය යන්න අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයේ දී ම මෙන් ම යුක්තිය සෙවීමේ ප්‍රශ්නයේ දී ද ඉතා ගැඹුරින් ම බලපවත්වන තත්ත්වයක් ඇති විය. මේ අනුව කී දෙනෙක් ඔවුන් මුහුණ දී ඇති අකටයුතුකම් හා අපරාධ පිළිබඳ ව දිරිමත් ක්‍රියාමාර්ගයක් නොගෙන ඒවා විඳදරා ගැනීමේ මානසික තත්වයකට පත් වීම කොතරම් පුළුල් ආකාරයට සිදු වී තිබේ ද?

2019 අප්‍රේල් 21 පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ ව සාකච්ඡාවේ දී මහජන ආරක්ෂාව පිළිබඳවත්, එවැනි ආරක්ෂාව එදින ජීවිතක්ෂයට පත් වූ පුද්ගලයන්ට නොලැබුණේ ඇයි යන ප්‍රශ්නයත් සාකච්ඡාවට භාජනය වෙමින් පවතී. මෙහි දී බොහෝ දුරට කතා වෙන්නේ එය අරයා ගේ වැරැද්ද නිසා ද මෙයා ගේ වැරැද්ද නිසා ද යනුවෙන් එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගැනීමේ ක්‍රියාවලියකි. එහෙත් එවැනි මහා අපරාධයක් සිදු කිරීමට තරම් රටේ ආරක්ෂාව පිළිබඳ ව පවතින ආයතන වල දුර්වලකම හා ඒවා පිළිබඳ ව ජනතාවගේ විශ්වාසය අහිමි වීම කොතෙක් දුරට බලාපාන්නට ඇද්ද යන්න පිළිබඳ ව කිසිදු බරපතළ සාකච්ඡාවක් පවතින්නේ නැත.

හුදෙක් ම ජාතිකවාදී හා ආගම්වාදී ආකාරයෙන් ප්‍රශ්නය පිළිබඳ ව කතා කරන බොහෝ දෙනෙකු කතා කරන්නේ ජනතාව ගේ බුද්ධියට හා ආධ්‍යාත්මයට නොව ඔවුන් කුලප්පු කර උසි ගන්වා තමන් ගේ ම කිසියම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා ය. රටේ ජනතාව ගේ බුද්ධිය බාල්දු කිරීම ඒ තරමට ම ගැඹුරින් රටපුරා පතළ වී ඇත.

රටේ බුද්ධිය පහළට ඇද දැමීම කෙරෙන තාක් දුරට කොපමණ ප්‍රමාණයකට ඒ රටේ රාජ්‍යයටත් ඒ රටේ ජනතාවගේ ජනජීවිතයටත් බලපාන දියුණුවක් ඇති කිරීමට ඇති බාධකය

සාකච්ඡාවට භාජනය නොවන්නේ ඇයි? එයට හේතුව ඒ තරම්ම අධෛර්යවත් වීමක් රටපුරා පවතින නිසා ය. යුක්තිය හා සාධාරණය පිළිබඳ කොපමණ කතා කළත් අවසානයට ඕවා වෙනස් කිරීමට පුළුවන්කමක් නැත යන අදහස ඉතා ගැඹුරින් ම සමාජයේ සියලු ම අංශ තුළට කා වැදී ඇත. එයින් ප්‍රයෝජන ගැනීමට බොහෝ දෙනෙක් ඉදිරිපත් වෙති. එහි වැඩි ම ප්‍රයෝජන ගන්නේ අපරාධකරුවන් ය. ත්‍රස්තවාදීන් මෙයින් ප්‍රයෝජන ගන්නවා මෙන් ම වෙනත් ජාවාරම් කාරයන් කුඩු ජාවාරම, කසිප්පු ජාවාරම, ස්ත්‍රීන් වෙළඳාම් කර ලාභ ලැබීමේ ජාවාරම, මිනිසුන් විශාල වශයෙන් මුලා කොට මුදල් ගරා ගැනීමේ කූට උපක්‍රම ඇති වීම ආදි සමාජයේ අස්සක් මුල්ලක් නෑර පැතිර පවතින අපරාධ ජනතාව ගේ බුද්ධියට නිගරු කිරීම නිසා සමාජ සහභාගිත්වයෙන් ඔවුන් ඈත් කර දැමීම මගින් සිදුවූ විශාල සමාජ හානි ය. මෙයින් වඩාත් ම ප්‍රබල පාපය වන්නේ රටේ දේශපාලන ක්‍රමය පිළිබඳ ව ජනතාව ගේ විශ්වාසය බාල්දු වීම තුළින් ඇති කරන විකාරරූපී දේශපාලනයක් රට තුළ බිහි වීම ය. ජනතාවගේ බුද්ධියට නිගරු කිරීමට තරම් හැකියාව ඇති දේශපාලනඥයාට ඡන්දයක දී ජය ගැනීමට ඇති ඉඩකඩ වැඩි ය යන අදහස පැතිරීම නිසා මහා පරිමාණයේ බොරු කියන්නන් හා ප්‍රචාරණ වැඩ කටයුතු වල යෙදෙන්නන් ගේ ප්‍රමාණය පුළුල් වෙන්නට පටන් ගනී. බොර දියේ මාලු ඇල්ලීම වැනි මානසික තත්ත්වයකින් උදා වන විශාල කූට උපක්‍රම වල විශේෂඥයන් බවට පත් වන මිනිසුන් සමාජයේ ඇති වී ඇති අගතියෙන් ප්‍රතිලාභ ලබා ගැනීම යන තැනට පත් වේ.

සමාජය තුළ ප්‍රගතියක් ඇති කිරීම වෙනුවට සිදු වී ඇති අගතියෙන් ප්‍රතිලාභ ලබන තත්ත්වයකට සමාජය පත් වී ඇත. එවැනි සමාජයකට වෙනත් පාපයක් අවශ්‍ය ද? මේ මහා සාපය ම රට පුරා ම පැතිර පවතින්නේ ජනතාව ගේ විශ්වාසය ඇති කිරීමට නොසුදුසු දෙයක් ය යන්න පිළිබඳ ව ඇති ඉතා ගැඹුරු දේශපාලන මතවාදයයි. ජනතා විශ්වාසය වැඩි වන තරමට ජනතා බලාපොරොත්තු වැඩි වේ. ජනතාව ගේ විශ්වාසය බිඳීම තුළින් ඔවුන් ගේ බලාපොරොත්තු විශාල ලෙස දෙදරා යයි. බලාපොරොත්තු විරහිත මිනිසුන් තමුන්ට හිමි ඉරණමක් සේ තමන්ගේ ගැටලු සහගත ජීවිත පිළිගන්නට පටන් ගනී. ඒ නිසා

ඇත්තෙන් ම ඔවුන් සිය යටි සිත් තුළින් සමාජයෙන් ඈත් වෙති. එකිනෙකා කොයි ආකාරයකින් හෝ තමා ගේ පැවැත්ම පමණක් සාදා ගන්නා ක්‍රම දෙසට යොමු වන්නේ සමස්ත සමාජයක් වශයෙන් එකතු වීමට ඇති ඉඩකඩ නැති ය යන්න වටහා ගැනීම තුළ ය. එය බුද්ධියෙන් තොර මිනිසුන් ගේ ක්‍රියාවක් නොව රටේ පවතින තත්ත්වය පිළිබඳ ව ඇත්ත අවබෝධය කරා එළඹ ගත් සාමාන්‍ය ජනතාව ගේ මානසික තත්ත්වය තුළින් ඇති වන වටහා ගැනීමකි.

මේ නිසා ජෙරාල්ඩ් පෙරේරා ගේ වධහිංසාව, ඉන්පසු සිදු වූ ඝාතනය, ඒවා සඳහා යුක්තිය සොයා ගැනීමට යෑමේ දී ඇති බරපතළ ගැටලු සියල්ල ම එක් පුද්ගලයෙකුට පමණක් මුහුණ දීමට සිදු වූවා පමණක් නොව එය සමාජයේ පවතින යථාර්ථයක් එළිදරව් කිරීමක් බවට පත් විය.

තමන්ගේ ම ගැඹුරු අත්දැකීම් මහජන අවධානයට ගෙන ඒමත් ඒ තුළින් සැබෑ කතිකාවක් ඇති කිරීමත් සිදු නොවන්නේ නම් යුක්තිය ඉටු කිරීමට බැරි මහා පාපය තුළින් ඇති වන මහා සාපය රටපුරා ම අඛණ්ඩ ව පවතිනු ඇත යන්න කීමට සිදු වන්නේ ගැඹුරු කනගාටුවකින් යුක්ත ව ය. එහෙත් ඒ කනගාටුව හුදු මානසික තත්ත්වයක් නොව සැබෑ තත්ත්වය පිළිබඳ ව වටහා ගැනීමක් මත පදනම් වූවකි.

මේ නිසා සමාජයේ ප්‍රගතියක් ගැන බලාපොරොත්තුවක් ඇති කාගේ වුවත් වගකීම වන්නේ මිනිසුන් ගේ යටිසිත් තුළ පැළපදියම් වී ඇති සැකය, අවිශ්වාසය හා ඔවුන් තුළ ඇති චකිතය සමාජය තුළ ප්‍රකාශනයට පත් කිරීමෙන් ඒ ගැටලුව විසඳා ගැනීම සඳහා කතිකාවක් නිර්මාණය කිරීම ය.

ජෙරාල්ඩ් පෙරේරා ගේ නඩුව මේ සියලු කරුණු අප ඉදිරියේ තබයි. නඩුවේ තීන්දුව මේ නඩුව පිළිබඳ ව අවසාන නිගමනය නොවේ. අවසාන නිගමනය වන්නේ යුක්තියට ඇති ඉඩකඩ අවහිර කරමින් අයුක්තියට ඇති ඉඩකඩ පළල් කරමින් පවතින, රටේ දේශපාලන හා බුද්ධිමය සංස්කෘතිය පිළිබඳ ව දැඩි විවේචනයක් මේ සිද්ධිය තුළින් එළිදරව් වීම, සමාජයේ පොදු සාකච්ඡාවක් කරා යොමු කර ගැනීමට ඇති හැකියාව කුමක් ද යන්න ය.

ජෙරාල්ඩ් පෙරේරා ගේ වධහිංසාව ඔහු ගේ මරණය හා ඒ නිසා ඔහු ගේ පවුලේ අයට දරන්නට සිදුවී ඇති ගැඹුරු දුක්ගැනවිලි සියල්ල සමාජයට කරන්නේ අලුත් මතකයක් ඇති කිරීම ය. එනම් අයුක්තිය පිළිබඳ සිහිගැන්වීමකි. ඒ මගින් සිය ජීවිතයේ ගැඹුරු ම විවේචනයක් ඇති කළ පුද්ගලයෙකු ලෙස ඔහු හඳුනා ගත යුතු ව ඇත. ඔහු මුහුණ දුන් ප්‍රශ්න මෙන් ම, ඒ මගින් එළිදරව් වුණු යුක්තිය පිළිබඳ ගැටලු වලට ප්‍රතික්‍රියා කිරීමට ඇති හැකියාව සමාජය තුළ ඇති වේ නම්, එය සමාජයේ ප්‍රගතියට හේතු වනවාට අනුමානයක් නැත.

# 13.
# කාර්යක්ෂම ආරක්ෂණ යාන්ත්‍රණයක් ගොඩනගා ගැනීම සඳහා මූලෝපායාත්මක යෝජනා

ආරක්ෂාව පිළිබඳ පවතින ඛේදනීය තත්ත්වයෙන් ගොඩඒම සඳහා මගපෙන්විය හැකි දේශපාලන හා නෛතික දර්ශන මින් ඉහත පරිච්ඡේදවල දී සටහන් කොට ඇත. ඒ දර්ශන පිළිබඳ ව ඇති කෙටි හඳුන්වාදීම් මත ඊට අදාළ පොත පත කියවීමෙන් ඒ දර්ශන පිළිබඳ ව පුළුල් දැනීමක් ඇතිකරගත හැකි ය.

මෙහි දී පාඨකයන් තුළින් මතු විය හැකි ප්‍රශ්නයක් වන්නේ යෝජිත ආරක්ෂක යාන්ත්‍රණය ප්‍රායෝගික ව ගොඩනගාගැනීම සඳහා ක්ෂණික ව ගතයුතු පියවර මොනවා ද යන්නයි. මෙහි පහත සඳහන් වන යෝජනා, පාඨකයන් විසින් මතු කළ හැකි ඒ සාධාරණ ප්‍රශ්නවලට පිළිතුරු සොයාගැනීමට මාර්ගෝපදේශයක් වේ ය යන්න මගේ අදහස ය. ඒ අදහස මත පිහිටා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

**1. අධිකරණ මගින් අසා තීන්දු කරන අපරාධ නඩු අවුරුද්දක කාලසීමාව යටතේ අවසන් කිරීම සඳහා අවශ්‍ය වන සියලු ම පියවර ගත යුතු ය. අභියාචනයකට ගත වන කාලයත් ගත් විට සම්පූර්ණ කාලය අවුරුදු දෙකක් නොඉක්මවිය යුතු ය.**

1.1.1 මේ යෝජනාව සාධාරණය කිරීමට හේතුව නම් සමස්ත ආරක්ෂක යාන්ත්‍රණයක කේන්ද්‍රීය හා ප්‍රාණ ජීවය පවතින්නේ අධිකරණ ක්‍රමයේ ඇති සාර්ථක භාවය හා කාර්යක්ෂම භාවය තුළ ම බව ය. සියලු ම දේවල් ඉමහත් ජව වේගයකින් සිදු වන වර්තමාන ලෝකය තුළ ඉබි ගමනින් යන අධිකරණ පද්ධතියකට කිසි දා ප්‍රායෝයෝගික ව සාධාරණය කළ හැකි ක්‍රියාවලියක් ඉටු

කළ නොහැකි ය. ඉබි ගමනින් යන අධිකරණ ක්‍රමය සාමාජීය වශයෙන් අනිසි ප්‍රතිඵල ඇතිකරයි. ඒ ඉබි ගමන නිසා අපරාධ වැඩි වන අතර, අපරාධ කරුවන් තුළ නීතිය කැඩීමට ඇති බිය තුනී වී යයි. "පුලුවන් නම් මාව අල්ලා ගනිව්", කියමින් මුළු සමාජයට ම රෙද්ද උස්සා පෙන්වීමේ මානසික තත්වය ඉහත කී තත්ත්වය තුළ ඇති වේ. එහෙත් නඩු කාලය අවම කිරීමෙන් "අපරාධයක් කළහොත් ඉතා ඉක්මනින් මට දඬුවම් විඳින්නට වෙනවා යයි සිතීමේ මානසිකත්වය අපරාධ කරුවන් තුළ වර්ධනය වේ."

1.1.2 අපරාධයේ වින්දිතයන් තුළ රටේ නඩු ඇසීමේ ඇති පමාව ප්‍රකාශයට පත් වන්නේ නඩු මගට බැසීමට වින්දිතයන් තුළ ඇති වන අධෛර්යය හා උදාසීනත්වය තුළිනි. යුක්තිය ඉල්ලා නඩු මගට බැසීම තුළින් තමන් ඇද වැටෙන්නේ කබලෙන් ලිපට ය යන නිගමනය ඔවුන් තුළ මුල් බැස ගනී. අපරාධ කාරයා විසින් ඉරන ලද රෙද්ද නඩු මගට බැසීම නිසා තවත් ඉරීම් වලට භාජනය වනවාය යන හැඟීම ඔවුන්ගේ හිතවතුන් තුළ මෙන් ම මුළු සමාජය විසින් ම නිර්මාණය කෙරෙයි. නඩු මගට බසින වින්දිතයාට අපරාධ කාරයා ඉඟි කරන්නේ "හොදයි කරලා බලපන්", යන හැඟීමය. ප්‍රතිලාභ වලට වඩා අවාසි සිදුවීමට ඇති ඉඩකඩ වැඩි බව දැනගත් පසු තමුන් මුලින් සිතාගත් මාවත අතහැර දැමීම ස්වාභාවික හැඟීමකි. අධිකරණ ක්‍රියාවලිය පිළිබඳ ව මහජන අවිශ්වාසය පැතිරී යෑම යන්නෙන් අදහස් වන්නේ සමාජයක් තුළ පැතිරී ගිය ඉහත සඳහන් මානසික තත්ත්වයි.

1.1.3.මහජනයා තුළ යුක්තිය සාධාරණ ව ඉටු කරගත හැකි ය යන මතය පැවැතීම අධිකරණ ක්‍රමයක පැවැත්මට අත්‍යවශ්‍ය කොන්දේසියක් බව ජාත්‍යන්තර ව පිළිගෙන ඇත. ඒ විශ්වාසය තහවුරු කරගනීමට නම් වර්තමාන කාලයේ පසුබිමට ගැලපෙන වේගයකින් නඩු අසා නිම කිරීමක් පැවැතිය යුතු ය.

මේ පිළිබඳ ව යෝජනාවලියක් ලංකාවේ පාර්ලිමේන්තුවේ නෛතික කරුණු හා මාධ්‍ය පිළිබඳ කොමිටිය (Sectoral Oversight committee on Legal Affairs (anti-corruption) & Media) මගින් 2017 සැප්තැම්බර් 20 වෙනිදා වාර්තාවක් ලෙස ප්‍රකාශයට පත් කළේය. ඒ යෝජනාවලිය ඇතුළත් වාර්තාව මේ පොතට ඈඳා ඇත.

**2. පොලීසිය වෘත්තීයමය වශයෙන් වැඩි දියුණු තත්වයකට පත් කිරීම ආරක්ෂක මූලෝපායික අත්‍යවශ්‍ය අංගයකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ව්‍යවස්ථාදායකයේ යුතුකම වන්නේ අධිකරණයේ නඩු ඇසීමේ වේගය කාලෝචිත ව වෙනස් කර ගැනීම සඳහා අවශ්‍ය අයවැය වෙන් කර දීමය. මේ යුතුකම පිළිබඳ ව ආණ්ඩුව දැනුවත් කිරීම බොහෝ කාලයක් තිස්සේ කර ඇතත්, ඒ ගැන මේ දක්වා සාධනීය ප්‍රතිචාරයක් ලැබී නැත. කාලෝචිත ව හමුදා ඒකක දියුණු කරගැනීම සඳහාත්, අධිවේගී මාර්ග ගොඩනැගීම සඳහාත් යන වියදම් පසුගිය කාලයේ දී විශාල වශයෙන් වැඩි කර ඇතත්, අධිකරණ පද්ධතිය දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් වල වැඩි වීමක් දකින්නට නැත.

2.1.1. විශේෂයෙන් ම විධායකයේ ප්‍රධානියා වශයෙන් ජනාධිපති වරයාත් ආණ්ඩුවේ ඉහළ ම තනතුරක් දරන අගමැතිවරයාත්, පහත සඳහන් නිල දරන ඇමති වරුත් ගෙන ඇති පියවර මාධ්‍යයේ හා සිවිල් සමාජයේ අධීක්ෂණයට ලක් විය යුතු ය. ඒ ඇමති තනතුරු නම් මුදල් අමාත්‍යංශය, යුක්තිය පිළිබඳ අමාත්‍යංශය, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය යන ඒවා ය.

2.1.2 ලංකාවේ පොලිස් සේවය සම්බන්ධයෙන් විශාල වශයෙන් පරාජිත තත්ත්වයක් පවතින බව පොදුවේ කවුරුත් පිළිගන්නා කරුණකි. එය ඉහළ පොලිස් නිලධාරීන් ද ඔවුන් කර ඇති ප්‍රකාශ තුළින් ද සනාථ කර ඇත. සමහර නියෝජ්‍ය පොලිස්පතිවරුන් හා විවිධ පොලිස් නිලධාරීන් බරපතළ අපරාධ වලට වැරදි කරුවන් වී මරණ දඬුවමට නියම කොට හෝ දීර්ඝ සිර දඬුවම් වලට පත් කොට ඇත. මෙය ඉහත සඳහන් පරාජයේ සංකේතාත්මක ප්‍රකාශනයකි.

2.1.2 ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදා ආරක්ෂක ප්‍රශ්න විසඳීම සඳහා කැඳවා ගැනීමට සිදුවී ඇත්තේ, ත්‍රස්තවාදී ප්‍රහාර ඇතුළු වෙනත් බරපතළ අපරාධ පිළිබඳ ව දැන ගැනීමටත්, ඒවා මුලින් උපුටා දැමීමටත් ශ්‍රී ලංකාවේ පොලිසිය අසමත් වූ නිසාය. ඒ අසමත් කම නිසා මිනිසුන් මුහුණදෙන මරණීය තත්ත්වය හා වෙනත් බරපතළ තත්ත්ව වළක්වා ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවිය.

2.1.3 පොලිසිය පිළිබඳ ගැටලුව විසඳීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අනු කොමිටියක් හෝ හා ජනාධිපති කොමිසමක් වහා ම පත් කළ යුතු අතර එහි ඇති යෝජනා හා වාර්තා කෙටි කාලයක් තුළ දී ගත යුතු ය. මේ කොමිසම්වල සාක්ෂි ලබා ගැනීමේ දී පොලිසියේ හිටපු නිලධාරීන් ගේ සහාය ගත යුතු ය. එමෙන් ම මහජනතාවට වාචික හා ලිඛිත සාක්ෂි හා යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව දිය යුතු ය.

2.1.4 නීතිය හා සාමය රැකීමේ ඇමති වරයා ලෙස පත් කළ යුතු වන්නේ පොලිසියේ කාර්යය පිළිබඳ වත්, යුතුකම් පිළිබඳ වත්, විනය හා සංයමය පිළිබඳ වත්, පරිණත අවබෝධයක් හා නායකත්වය දිය හැකි අය වේ.

2.1.5 ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය විසින් මේ වෙනස්කම් ඇති කර ගැනීම සඳහා අවශ්‍ය මුදල් වෙන් කර දිය යුතුවා මෙන් ම, පාර්ලිමේන්තුව තුළ පොලිස් ප්‍රතිසංස්කරණ අඛණ්ඩ ව පවත්වා ගෙන යෑම සඳහා පසුබිම සකස් කොට දිය යුතු ය.

**3. ප්‍රොසිකියුටර් කාර්යය වත්මන් වාතාවරණයට අනුව වැඩිදියුණු කර ගැනීම;**

3.1.1 ප්‍රොසිකියුටර් කාර්යය වනාහි අපරාධ වළක්වා ගැනීම සඳහා වන රාජ්‍ය ප්‍රතිපත්තියක ඉතා වැදගත් කොටසකි. බරපතළ අපරාධ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාවලියත්, පොලිස් ක්‍රියාවලියත්, ප්‍රොසිකියුටර් කාර්යය කෙරෙන රාජ්‍ය අංශය (ලංකාවේ නීතිපති දෙපාර්තුමේන්තුව) හා වෙන් කළ නොහැකි සේ බද්ධ වී ඇත. විශාල අපරාධ ඉදිරියේ ආණ්ඩුව බෙලහීන තත්ත්වයක පසුවේ නම් ඊට වගකිව යුත්තන් අතර නීතිපතිවරයා ද ඇතුළත් වේ.

3.1.2. ප්‍රොසිකියුටර් කාර්යය ලොව පුරා විවිධ දේශවල වර්ධනය වූයේ අපරාධ මර්ධනය සමාජයක පැවැත්මට අත්‍යවශ්‍ය ම කොන්දේසියක් වන නිසා ය. ප්‍රොසිකියුටර් කාර්යය තුළින් සමාජයේ සැම අයෙකුට ම දෙන පණිවුඩය නම්, "අපරාධ පිළිබඳ ව නීතිය බිඳින්නට එපා, එසේ බින්දහොත් මම ඔබ පසුපස අනිවාර්යයෙන් ම එනවා" යන්න ය. මෙයින් කියවෙන ක්‍රියාවලිය ඇත්තෙන් ම ප්‍රායෝගික ව කරගත නොහැකි තත්වයක ප්‍රොසිකියුටර්වරයා සිටින්නේ නම් අපරාධකාරයා ප්‍රොසිකියුටර්වරයාට කියන්නේ, "ඔබට කළ හැකි කෙහෙල්මලක්

නැහැ” යනුවෙනි. මේ ආකාරයෙන් ප්‍රකාශයට පත් වන්නේ අපරාධකාරයා තුළ තමන්ගේ බලය ගැන දැඩි විශ්වාසයකුත්, රාජ්‍ය තන්ත්‍රයේ බෙලහීනභාවය පිළිබඳ ව පළල් අවබෝධයකුත් සමාජය තුළ පැතිර ගිය අවස්ථාවේ දී ය. මෙවැනි තත්ත්වයක් ඇති වූ පසු සමාජය තුළ ප්‍රොසිකියුටර් කාර්යය පිළිබඳ ව ඇති විශ්වාසය නැති වී යයි, මෙසේ සිදු වූ පසු එයින් ද වාසි ලබන්නේ අපරාධ කරුවන් ම ය.

3.1.3. ප්‍රොසිකියුටර්වරයාගේ කාර්යය ගැන සමාජයේ ඇති විශ්වාසය බිඳෙන තාක් දුරට, බියෙන් තොර ව අපරාධ කිරීමේ මානසික තත්ත්වය බොහෝ දෙනා අතර පැතිරෙයි. විශේෂයෙන් ම දූෂණ මගින් මූල්‍ය සම්පත් වැඩිදියුණු කර ගැනීම, කප්පම් ගැනීම මහා පරිමාණයෙන් සිදුවීම, රාජකාරිය පගාව ලබාගැනීමේ මූලාශ්‍රයක් බවට පත් වීම, ආණ්ඩු අංශයේ මෙන් ම පුද්ගලික අංශයේ ද පළල් ව පැතිරී යයි.

3.1.4. ප්‍රොසිකියුටර් කාර්යය කාර්යක්ෂම ව හා ප්‍රඥා ගෝචර ව සිදු කළ හැක්කේ එසේ කිරීමට වාතාවරණයක් තිබෙන තාක් දුරට පමණි. නඩුපමාව ප්‍රොසිකියුටර් කාර්යය කිරීමට ඇති විශාලතම බාධාවකි. මහාධිකරණයක නඩුවක් පටන්ගෙන එය අවසානයකට එන දීර්ඝ කාලය තුළ දී, ප්‍රොසිකියුටර්වරු ගණනාවක් ම මාරුවීම් ලබා ඒ නඩුව ගැන ඇති වගකීම් වලින් මුදාහැරෙති. සමරහ නඩු හත් අට දෙනෙකුගේ අතින් අතට යයි. මුල සිට ම නඩුව විකාශනය වී ඇති ආකාරය හුදෙක් ලේඛන හා සටහන් බලා පමණක් දැනගත නොහැකි ය. එසේ වීමට හේතුව ප්‍රොසිකියුටර් කාර්යය හුදෙක් ම යාන්ත්‍රික කටයුත්තක් නොවන නිසා ය. ආණ්ඩුවේ පාලකයන් විසින් හෝ වෙනත් දේශපාලනඥයන් හා ප්‍රභූවරුන් විසින් ප්‍රොසිකියුටර් කාර්යයට විවිධ පලපෑම් දැමීම කෙළින් ම හෝ වක්‍ර ව කෙරෙන වාතාවරණයක් පවතින විට එය ප්‍රොසිකියුටර් කාර්යය කිරීමට බලවත් බාධකයක් වෙයි. ප්‍රොසිකියුටර් කාර්යය නිසි ලෙස කළ හැක්කේ එය ස්වාධීන ව කළ හැකි වාතාවරණයක ය.

3.1.5. ප්‍රොසිකියුටර් කාර්යය නිසිලෙස කිරීමට නම් ඒ සඳහා අවශ්‍ය මිනිස් හා මූල්‍යමය සම්පත් ව්‍යවස්ථාදායකය හා විධායකය මගින් දිය යුතු ය. මේ පිළිබඳ ව සමහර යෝජනා පාර්ලිමේන්තුවේ නෛතික කරුණු හා මාධ්‍ය පිළිබඳ කොමිටිය

2017 සැප්තැම්බර් 20වන දිය නිකුත් කළ වාර්තාවේ සඳහන් කොට ඇත.

**4. බුද්ධි අංශයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.**

4.1.1. මහා අපරාධ වළක්වා ගත හැකි වන්නේ බාධාවකින් තොරව තොරතුරු ගලා එන පසුබිමක් පවතින තාක් දුරට පමණි. එසේ ස්වාභාවික ව තොරතුරු ගලා ඒමක් සිදු විය හැක්කේ සමාජය හා නීතිය ක්‍රියා කරන අංශ අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් හා බැඳීමක් පවතින තාක් දුරට පමණ ය. තොරතුරු සැපයීමට ගොස් ඒ මගින් තමන්ට ම හානියක් වේ යයි සමාජය තුළ මතයක් පවතී නම් එය ඉහත සඳහන් සහයෝගිතාවට බාධාවක් වේ. එවැනි මතයක් දුරු කළ හැක්කේ තොරතුරු සපයන්නාගේ ආරක්ෂාව තහවුරු කිරීමට රාජ්‍ය තන්ත්‍රයට හැකියාවක් ඇති තාක් දුරට පමණ ය.

4.1.2. අපරාධ පිළිබඳ ව ලැබෙන තොරතුරු ලිඛිත ව පවත්වාගෙන යැමටත්, ඒ තොරතුරු හා තොරතුරු සපයන්නන් ආරක්ෂා කිරීමටත් නීතිමය රාමුවක් පැවැතිය යුතු අතර මේ පිළිබඳ ව අදාළ නිලධාරීන් පමණක් නොව සමාජය ද දැනුවත් කළ යුතු ය. මේ නීති අකුරට ම ක්‍රියාත්මක කළ යුතු අතර, එසේ නොකිරීම රාජකාරි අතපසු කිරීමක් ලෙස සලකා ඊට විරුද්ධ ව පියවර ගැනීමට ඉඩකඩ සලසා ගත යුතු ය.

4.1.3 නිලධාරි තන්ත්‍රය අතරත් එහි නායකත්වය දරන්නන් අතරත් ඉතා ඉක්මනින් අපරාධ පිළිබඳ තොරතුරු හා ඊට අදාළ අණ දීම් කෙරෙන ආකාරයට කාර්යක්ෂම විධික්‍රමයක් ඇති කළ යුතු වේ. "මට තොරතුරක් ලැබුණා, එහෙත් එය නිසි ලෙස දන්වා ඒ ගැන සාකච්ඡාවක් කිරීමට අවස්ථාව ලැබුණේ නෑ" යනුවෙන් පැවසීමට අවසරයක් නොතිබිය යුතු ය. ඉහළට තොරතුරු දීම මෙන් ම ඒ පිළිබඳ ව අදාළ නියෝග ලබාගැනීම සඳහා සාධාරණ විධි ක්‍රම ගොඩනගා ගත යුතු ය. උදාහරණයක් වශයෙන් ඉහළ ම නිලධාරීන්ට හෝ අදාළ ඇමති වරුන්ට තොරතුරු ලිඛිත ව දීමෙන් හා ඒ තොරතුරු පිළිබඳ ව ගත යුතු ක්‍රියාමාර්ග ඉල්ලා සිටිය යුතු අතර, ඒවා ලබා ගැනීමේ පමාවක් ඇත්නම් නැවත නැවත ඒ පිළිබඳ ව සිහි කැඳවීමට අවශ්‍ය විධිවිධාන පැවැතිය යුතු ය.

4.1.4. ආරක්ෂක අංශවල නිලධාරීන් විසින් ස්වාධීන ව ගතයුතු පියවර පැහැර ගැනීමට දේශපාලන නායකයින්ට ඉඩ නොතැබිය යුතු ය. දේශපාලන නායකත්වයකින් කළ යුතු වන්නේ, අපරාධ වැළැක්වීම සඳහා අදාළ අංශ විසින් කරන යෝජනා නීතිමය බලතල අදාළ සීමා තුළ කෙරෙන තාක් දුරට එසේ කිරීමට අවශ්‍ය සම්පත් ළඟා කර දීම පමණ ය.

4.1.5. අපරාධ පිළිබඳ ව කෙරන සියලු කටයුතු ලිඛිත ව පවත්වා ගත යුතු අතර යම් දේශපාලන ඇඟිලිගැසීම් සිදු වුව හොත් ඒවා පිළිබඳ ව ද ලිඛිත සටහන් පවත්වා ගත යුතු වේ.

4.1.6. රජකාරි වලට ඇඟිලිගැසීමේ හෝ බාධා කිරීම් පිළිබඳ ව ඇති නීති තත්කාලීන ප්‍රශ්න වලට අදාළ වන සේ සංශෝධනය කළ යුතු වේ. එවැනි ඇඟිලිගැසීම් වලට විරුද්ධ ව නීතිමය පියවර ගත යුතු අතර, ඒ සම්බන්ධයෙන් කිසිවෙකුවත් නීතියෙන් ඉහළ සිටින්නෙකු සේ නොතැකිය යුතු ය.

**5. හදිසි නීතිය මගින් නොව රටේ සාමාන්‍ය නීතිය මගින් ජන ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.**

5.1.1. හදිසි නීතිය පැනවීමට සිදුවීමට හේතුව නම් රටේ සාමාන්‍ය නීතිය තුළින් සාමයත් ජන ආරක්ෂාවත් රැකීමට අපොහොසත් වී තිබීම ය. මෙය කෘත්‍රිම යන්ත්‍රයකින් හදවත හෝ වෙනත් අවයවයක් ක්‍රියාකරවීම මගින් ජීවිතය ආරක්ෂා කර ගැනීම වැනි දෙයකි. එසේ වන්නේ ස්වාභාවික ව මේ අවයව ආරක්ෂාකර ගැනීමට නොහැකි තරමට ම ඒවා දුර්වල වූ විටය. මේ නිසා හදිසි නීතියව වෙත යොමු වීම රටේ නීතිය, සාමය හා ජන ආරක්ෂාව තහවුරුකිරීමට බැරි තරමට, රටේ සාමාන්‍ය නීතිය හා එය ක්‍රියාත්මක වන ආකරය අපොහොසත් ය යන්න පිළිගැනීමකි. ගලන ගඟකට වැටෙන කවුරුන් හෝ බේරා ගැනීමට ඉදිරිපත් වන්නා වීරයකු සේ සැලකෙයි. එහෙත් වඩාත් සුදුසු තත්ත්වය නම් ගඟ අසල පරිසරය නිසි ලෙස සකස් කර ගැනීම තුළින් ගඟට වැටීමට ඇති ඉඩකඩ තුරන් කර දැමීම ය. නීතිය හා ජනාරක්ෂාව පිළිබඳ ව ද සිදුවිය යුත්තේ එවැන්නකි.

5.1.2. සාමාන්‍ය නීතියේ හා එය සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කරන විධික්‍රමය පිරිහී යෑම එක තැනක නොනවතී. කාලයාගේ ඇවෑමත් සමග පිරිහීම වඩවඩාත් වැඩි වෙයි. එය නතර කිරීමට පියවර නොගත හොත් ඒ පිරිහීම වඩවඩාත් පළල් වෙමින් සමාජයත් ජන ජීවිතයත් තම ගොදුර කරගනී. අප්‍රේල් 21 වෙනි පාස්කු ඉරිදා සිදුවීම් ඉහත සඳහන් පිරිහීම් නිසා ඇතිවූ බව මේ

පිළිබඳ ව කතිකාවේ දී නැවත නැවත ප්‍රකාශයට පත් වෙයි. රටත් ජනතාවත් මුහුණ දෙන ප්‍රධාන තර්ජනය මේ පිරිහීමයි.

**6. ජනමතය**

6.1.1. ලංකාවේ දේශපාලනයේ විශාල ව්‍යසනයක් පවතින බව අද පොදුවේ සාකච්ඡා වෙයි. එහෙත් ඒ දේශපාලන ව්‍යසනයත් නීතිය ක්‍රියාත්මක කරගැනීම පිළිබඳ ව ඇතිවී ඇති ව්‍යසනයත් වෙන් කළ නොහැකි ලෙස බැඳී පවතින බව පිළිගන්නා තරමට මහජන මතයත්, දේශපාලන විඥානයත් තව ම වර්ධනය වී නැත. මේ ප්‍රපංච දෙක අතර ඇති වෙන් කළ නොහැකි බැඳීම තේරුම් ගෙන ඒ මත රටේ හා ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ ව මූලෝපාය ගොඩනගාගත හොත්, ලංකාවට දැන් පවතින ව්‍යසනයෙන් කෙටිකාලයක් තුළ ගොඩ ආ හැකි ය.

6.1.2. අද පවතින ජනමතය නම් සමස්ත රාජ්‍ය තන්ත්‍රය ම පිළිබඳ ව ඇති කලකිරීම හා අවිශ්වාසයයි. ආණ්ඩුවේ බලධාරිත්වය නොතකන ප්‍රමාණයට ම ඒ මතය වර්ධනය වී ඇත. ආණ්ඩුවේ බලධාරිත්වය නැවත ගොඩනැගෙනු ඇත්තේ, ඒ රාජ්‍ය තන්ත්‍රය තුළ ම ඇති කරගත යුතු බලවත් ප්‍රතිසංස්කරණ මගිනි. ඒ ප්‍රතිසංස්කරණ පදනම් විය යුත්තේ රාජ්‍ය තන්ත්‍රය නීතිය මත පාලනය තුළ කොටුකර තැබීම මගනි. මෙය නොසිදුවන තාක් මහජන විශ්වාසය නැවත දිනාගැනීමට බැරි ය.

6.1.3. ඇමරිකානු ව්‍යවස්ථාවත් පාලනයත් ඇති කිරීමේලා ප්‍රධාන වුණු නායකයන් අතර කෙනෙක් වූ ජෝන් ඇඩම්ස් (John Adams) කීවේ ජන ආණ්ඩුවක් යනු "Republic" නීතියේ අධිරාජ්‍යයක් බව ය. රජෙකුගේ පාලනය හා ජන ආණ්ඩුව අතර ඇති මූලික වෙනස නම්, රජෙකුගේ පාලනය යටතේ ඔහුගේ අභිමතය නීතිය බවට පත්වන අතර, ජන ආණ්ඩුවක් යටතේ සැම කෙනෙකුට ම පොදු වූ නීතියක් මගින් රට පාලනය වෙයි. නීතිය බොහෝ දුරට අස්ථාන වී ඇති ලංකාව ජන ආණ්ඩුවක් යයි කියා ගැනීමට බැරි තරමට පිරිහී ඇත. විධායකයේ ප්‍රධානියා වන ජනාධිපතිවරයා නීතියට යටත් නැති අයෙකි. මේ තත්ත්වය පවතින්නේ ව්‍යවස්ථාවේ 35 (1) වගන්තිය යටතේ ය. නීතිය මත පාලනයක් ඇති වීමට නම් මේ වගන්තිය ජන ආණ්ඩුවකට ගැලපෙන සේ සංශෝධනය කළ යුතු ය.

**7. බුධිමතුන්ගේ හා සිවිල් සමාජයේ යුතුකම**

7.1.1. බුධිමතුන් හා සිවිල් සමාජය නීතිය හා එය ක්‍රියාත්මක කිරීමෙහි ඇති කඩා වැටීම රට මුහුණ දෙන ප්‍රධාන ම ගැටලුවක්


බවට මතවාදයක් ගොඩනැගීමට සැලකිය යුතු උත්සාහයක් ගෙන නැත. නීතිය ක්‍රියාත්මක විය යුතු බව සටන් පාඨයක් ලෙස නිතර නිතර පාවිච්චි වන නමුත් මේ ප්‍රශ්නය පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් සමාජ ගත කිරීම සඳහා ප්‍රයත්නයක් පවතින්නේ නැත.


7.1.2. ජනමතය ගොඩ නැගීමට ප්‍රබල සාධකයක් වන ආගමික නායකයන් හා, මත ගොඩනගන්නන් අතරින් පවා මේ පිළිබඳ ව දැඩි අවධානයක් යොමුකරවා ගැනීමේ උත්සාහයක් පෙනෙන්නට නැත. සමහරවිට මේ ප්‍රශ්නය පිළිබද ගැඹුරු අවබෝධයක් ඔවුන් තුළ වුව ද නැතුවා විය හැකි ය. කෙසේ වුවත්, විවිධ ආගම් විසින් පැතිරවීමට උත්සාහ කරන සදාචාර ධර්ම ප්‍රායෝගික ව රට තුළ ක්‍රියාත්මක වීමට නම් නීතිය හා එය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින ව්‍යසනය තුරන් කර දැමිය යුතු ය. එසේ කර ගැනීමේ මුල් පියවර ගැන ප්‍රබල ජන අවබෝධයක් හා මතවාදයක් ගොඩනැගිය යුතු ය. එවැනි අවබෝධයක් තුළින් පැනනැගෙන ජන ආන්දෝලනය තුළින් පවතින ව්‍යසනය පරාජය කිරීමට අවශ්‍ය ජන ශක්තිය ගොඩ නැගෙනු නොඅනුමානය. දැනට මුල්තැන ලැබිය යුත්තේ ඒ අවබෝධය අත්පත් කර ගැනීමටත්, එය ජනගත කිරීමටත් ය.


ඉහත සඳහන් කොට ඇත්තේ ජනාරක්ෂාව ගොඩ නැගීමටත් රටේ ස්ථාවරභාවයක් ඇති කිරීමටත් ක්ෂණික ව ගත යුතු පියවර ය. එහෙත් සැබෑ ජන ආණ්ඩුවක් ලංකාවේ ඇති වීමට නම් 1978 දී එක පුද්ගලයෙකුගේ බලය තහවුරු කරගැනීමට සදාගත් ව්‍යවස්ථාව මුළුමනින් අහෝසිකොට ජනතාවගේ සුභසිද්ධිය සඳහා වන රාජ්‍ය තන්ත්‍රයක් ගොඩනගා ගත යුතු ව ඇත.


නීතියේ හා නිතිය ක්‍රියාත්මක කිරීමේ ඇති ව්‍යසනය තුළින් විශාල පරිමාණ ව ජන ජීවිතත් දේපළත් විනාශ වී ඇත. පාස්කු ඉරිදා මරණයට පත් සියලු දෙනා, අඛණ්ඩ ව පවතින මේ ව්‍යසනයේ ප්‍රබල සංකේතයකි. ඔවුන් සියලු දෙනාට ම ගරු කළ හැක්කේ රටේ නීතිය පිළිබඳ ව පවතින ව්‍යසන නැති කරගැනීම සඳහා ප්‍රායෝගික කතිකාවක් හා ආන්දෝලනයක් ඇති කිරීම මගිනි.


# අදාළ තවත් පොත්



ශ්‍රී ලංකාවට අවශ්‍ය
අධිකරණමය
සංශෝධන
බැසිල් ප්‍රනාන්දු



කාර්යක්ෂමභාවය
ප්‍රඥාගෝචරභාවය හා
ශ්‍රී ලංකාවේ නීතික්‍රමය
නීතිඥ බැසිල් ප්‍රනාන්දු



නීතිඥයෙකුගේ
පාපොච්චාරණයක්
හෙවත් මගේ කතාව
බැසිල් ප්‍රනාන්දු



අලුත්
ව්‍යවස්ථාවක්
කුමටද?
නීතිඥ බැසිල් ප්‍රනාන්දු



කුලය
මුලිනුපුටා දැමීම
ආචාර්ය බී. ආර්. අම්බෙඩ්කාර්
පරිවර්තනය
ඕෂදී නයනථාරා ගුණසේකර



Gyges' Ring
The 1978 Constitution of Sri Lanka
Basil Fernando



TRAGICOMEDY OF
CONSTITUTIONAL
AUTOCHTHONY
BASIL FERNANDO



TORTURE:
AN ENTRENCHED
PART OF
CRUEL, INHUMAN
&
DEGRADING
LEGAL
SYSTEMS
BASIL FERNANDO



Undermining of the Legal and Political Systems
Basil Fernando


Basil Fernando
Deterioration Of The Legal Intellect in Sri Lanka
A brand new narrative to be told to the whole world - K. G. Sankarapillai
A Miraculous Cure Is Possible


A SOCIOLOGICAL EXPLORATION OF
DISAPPEARANCES
IN SRI LANKA
Jane Thomson-Senanayake


The Rule of Law
Tom Bingham
නීතිය මත පාලනය
පරිවර්තනය
රදීකා ගුණරත්න


සංස්කෘතික
අපරාධ විද්‍යාව
හෙරංජි විජේවර්ධන ~ බැසිල් ප්‍රනාන්දු


මානව හිමිකම්
පහන
නීතිඥ බැසිල් ප්‍රනාන්දු
ශ්‍රී ලංකාවේ වධහිංසාව තුරන්කිරීමේ ජන සන්ධානය
ආසියානු මානව හිමිකම් කොමිසම

# නීතිය සහ විනය

බැසිල් ප්‍රනාන්දු
(ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක)

එක් එක් පුද්ගලයාගේ ස්වෛරීභාවය කියා දෙයක් ඇත්තේ නැත. ස්වෛරීභාවය එක් රාජ්‍යයක් තුළ ජීවත් වන සියලු ම ජනතාව සතු වේ.

ස්වෛරීභාවයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොවේ. සමස්ත ජනතාවක් සංවිධානාත්මක ව ජීවත් වීම මගින් තමන්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට ඇති වන එකඟතාව ජනතා ස්වෛරීභාවයේ පදනම වේ.

විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

ISBN 978-955-691-321-7
9 789556 913217
280/=